

සොබා

Soba / சொபா

පරිසර ප්‍රකාශනය

පරිසර අමාත්‍යාංශය

පරිසර අධ්‍යාපන ප්‍රහුණු ප්‍රවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

2025

දෙවන කළාපය

XXXV වෙළුම



ඉසාබා

පරිසර ප්‍රකාශනය
2025

පරිසර අමාත්‍යාංශය

පරිසර අධ්‍යාපන පුහුණු ප්‍රවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

සොබා

පරිසර ප්‍රකාශය

පරිසර අමාත්‍යාංශය
පරිසර අධ්‍යාපන පුහුණු ප්‍රවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය
''සොබාදම්පියස'' 416/C/1 , රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල

වෙළුම XXXV - 2025 දෙවන කළාපය
ISSN -1800-4253
මෙම සඟරාවේ අඩංගු සියළු විෂය කරුණු පිළිබඳ වගකීම අදාළ ලේඛකයන් සතු ය.

උපදේශක මණ්ඩලය
කේ.ආර්.උඩුවාවල මහතා
ලේකම්, පරිසර අමාත්‍යාංශය

ඩබ්.ජී. කුමාරගම මහත්මිය
අතිරේක ලේකම්, පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන පුහුණු

ප්‍රධාන සංස්කාරක
රිද්මා බුලත්සිංහල මහත්මිය
අධ්‍යක්ෂ, පරිසර අධ්‍යාපන පුහුණු ප්‍රවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

සංස්කාරක මණ්ඩලය
කුලානි එච්.ඩබ්. කරුණාරත්න මහත්මිය
අධ්‍යක්ෂ, අන්තර් ජාතික සබඳතා අංශය

ආචාර්ය සී.කේ. මුතුමාල මහතා
අතිරේක සාමාන්‍යාධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව

එම්.එම්.ඒ.එන්. ශානිකා මහත්මිය
සහකාර අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සැලසුම්

දිනේශිකා සී. ජයරත්න මෙනවිය
නීති නිලධාරී, නීති අංශය

ජේ.ඒ.හසිනි ප්‍රබෝධා මහත්මිය
සංවර්ධන නිලධාරී, පරිසර සැලසුම් හා ආර්ථික

සංස්කරණ සහාය
පියුමි උත්පලා බෙන්තරගේ මෙය
සහකාර අධ්‍යක්ෂ, අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ

රංජිත් රාජපක්ෂ මහතා
සහකාර අධ්‍යක්ෂ, සන්නිවේදන හා මහජන සම්බන්ධතා

ඉනෝකා විජේවර්ධන මහත්මිය
සංවර්ධන නිලධාරී, පරිසර අධ්‍යාපන පුහුණු ප්‍රවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

පටුන

පිටු අංකය

1. පරිසර පනත් රෙගුලාසි හා ප්‍රතිපත්ති 7

2. වනජීවී නීතිය හඳුනාගෙන ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත සුරකිමු. 11

3. **Contribution of Botanic Gardens to Country's Environmental** 19

4. තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (SCP) 24

5. **Guardians of the Coast** 29

6. ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික හා උණුදිය උල්පත් වල වටිනාකම 33

7. **Sri Lanka's Coastal Zone: Balancing Access, Development and Protection** 38

8. **Project on Development of Coastal Leisure Parks within the Coastline under "Clean Sri Lanka" Programme** 42

9. ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වය සංරක්ෂණය සඳහා පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් සම්පාදනය කළ ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා මාර්ගෝපදේශ 46

10. **Environmental Law and Legislation in Sri Lanka: Challenges and Future Directions** 53

11. ප්ලාස්ටික් නිෂ්පාදනය හා පරිභෝජනයට අදාළ රෙගුලාසි, පනත් සහ ප්‍රතිපත්ති 60

12. **MICROPLASTIC AND THEIR CHARACTERIZATION IN THREE SPECIES OF MOLLUSKS IN SELECTED COASTAL SITES IN THE WESTERN PROVINCE, SRI LANKA** 68

13. වන සංරක්ෂණ ආඥා පනතින් රැකවරණය සැලසෙන 73

14. அபிவிருத்தி அடைந்து வரும் நாடுகளில் மறைந்து வரும் உயிர்ப்பல்வகைமையும் சட்டங்களின் பங்களிப்பும் 83

15. ශ්‍රී ලංකාවේ ආනයනික දැව නියාමනය කිරීමේ අවශ්‍යතාවය. 91

16. **Environmental Related Act, Regulations Policies** 99

සංජීව පුළුක්කුට්ටි ආරච්චි
සහකාර අධ්‍යක්ෂ (පරිසර ප්‍රවර්ධන ඒකකය)
මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර පනත් රෙගුලාසි හා ප්‍රතිපත්ති

ඕනෑම රටක පරිපාලනය සඳහා නිලධාරීන්ට අමතරව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත වන මණ්ඩලයක් නොහොත් පාර්ලිමේන්තුවක් පවතින්නේ එම රටෙහි පරිපාලන කටයුතුවලට අවශ්‍ය වන නීති රීති සැකසීම, පවත්නා නීති මහජන සුබ සිද්ධිය වෙනුවෙන් සංශෝධනය කිරීම, එම මූලික නීතීන් මත පිහිටුවා ඇති අනු නීති හෙවත් රෙගුලාසි පැනවීම, එම රෙගුලාසි පදනම් කර ගනිමින් ප්‍රතිපත්ති සැකසීම යන අවශ්‍යතාව වෙනුවෙන්ය. මෙවැනි නීති රීතීන් හි අවශ්‍යතාවය පාලනයේ කුඩාම ඒකකය වන පළාත් පාලන ආයතනයේ සිට ජාත්‍යන්තර නීතීන් දක්වා පුළුල් පරාසයක පැතිර පවතින අතර එසේ නොවූවානම් අප ජීවත්වන ලෝකය කෙලෙසක පවතීදැයි අපට සිතා ගැනීමටවත් අපහසු වේ.

ඉහතින් සඳහන් කරන්නට යෙදුණු නීති රීතීන් හි අවශ්‍යතාවය පොදුවේ සියලු කටයුතු වලදී මෙන්ම අප අවට පරිසරය කළමනාකරණය සම්බන්ධයෙන් ද වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි . ඈත අතීතයේ සිටම මෙරට පාලනය කිරීම සඳහා පැවැති රාජාණ්ඩු කාලයේ සිටම පරිසරය රැක ගැනීම වෙනුවෙන් නොයෙකුත් නීති රීතීන් මෙන්ම සම්ප්‍රදායන් පැවැති බවට ඉතිහාසය සාක්ෂි දරන අතර රටේ පවත්නා පොදු නීතීන්හි ද මහජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් පාරිසරික පීඩාවන් මැඩ පැවැත්වීම ආදී කටයුතු වෙනුවෙන් අනෙකුත් පරිපාලන නීති රීති හරහාද පරිසර සංරක්ෂණයට විෂය වෙනුවෙන් අනු නීති පැවති බවට ඉතිහාසය පිරික්සීමේදී කරුණු සොයා ගත හැකිය. එනම් පළාත් පාලන නීති රීති අතර තම පළාත් පාලන බල ප්‍රදේශය තුළ කැලි කසළ ක්‍රමවත්ව ඉවත් කිරීම, මංමාවත් පිරිසුදු හා අවහිර වීමකින් තොරව පවත්වා ගැනීම සම්බන්ධයෙන් අනු නීති පවතින බව අදටත් සොයාගත හැකිය.

නමුත් මානව ශිෂ්ටාචාරය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමගම ජනතා අවශ්‍යතා වෙනුවෙන් මහා පරිමාණයෙන් පාරිසරික සම්පත් යොදා ගැනීමට සිදුවීමත් සමඟ පෙරට වඩා ශක්තිමත්ව මෙම කටයුතු පරිපාලනය මෙන්ම කළමනාකරණය වෙනුවෙන් ඉතා විධිමත් නීති රීතීන් හා ප්‍රතිපත්තීන්හි අවශ්‍යතාව ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද හඬ නැගෙන්නට පටන් ගැනුනි. විශේෂයෙන්ම පාරිසරික සම්පත් වශයෙන් ගැනෙන මහා සාගර, ගංගා, ඇළ දොළ ඇතුළු ජලගෝලය අන්වීක්ෂීය හා මහේක්ෂීය ශාක හා සතුන් විශාල ප්‍රමාණයක් රඳා සිටිනා පස හා සියලුම ජීවීන්ගේ පැවැත්ම වෙනුවෙන් ඔක්සිජන් නමැති වායුව 20% පමණ අඩංගුව පවතින වායුගෝලය යන මෙම තුන් සාධකය විශාල ලෙස මානව ක්‍රියාකාරකම් නිසා ක්‍රමයෙන් වෙනස්කම්වලට භාජනය වන බව හා එම වෙනස්කම් මිහිමත වසන සියලු ජීවී ප්‍රජාවට අහිතකර අන්දමින් බලපෑම් එල්ල කරන බව හඳුනාගත් ලෝක ප්‍රජාව එක්රැස් වී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ගිවිසුම් හා සම්මුතිවලට එළැඹීමට පවා කටයුතු කළහ.

විශේෂයෙන්ම 1970 දශකයේ මුල් භාගයේ බ්‍රසීලයේ රියෝ ද ජනයිරෝ නගරයට රැස්වූ ලෝක ප්‍රජාව විසින් පරිසරික සම්පත්වල සිදුවන වෙනස්කම් නිසා මිනිසා ඇතුළු මිහිමත හා සාගර තුළ මෙන්ම පොළොව අභ්‍යන්තරයේ ඇතුළු සෑම තැනකටම සිදුවන අහිතකර බලපෑම්

සමනය කිරීම වෙනුවෙන් ඒකාබද්ධව කටයුතු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. මෙවැනි බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස අප රටට ද පරිසර සංරක්ෂණය හා කළමනාකරණය වෙනුවෙන්ම වූ නීතියක් 1980 දී බලාත්මක කිරීමට සිදුවිය. එය 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත නම් වේ.

එම පනත බලාත්මක කිරීමේ ආරම්භක අවධියේදී එහි මූලික අරමුණ වූයේ මෙම පරිසරික සම්පත්හි සිදුවන වෙනස්කම් අධ්‍යයනය කරමින් ඊට බලපෑම් ඇති කරන්නා වූ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශව වෙත උපදේශන සේවා කටයුතු සැපයීම වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය නම් ආයතනයක් පිහිටුවීම හා ඊට සමාන්තරව ප්‍රජා සහභාගිත්වයෙන් යුත් පරිසර සභාව යනුවෙන් හඳුන්වනු ලබන පරිසර අධිකාරියේ කාර්යයන් නියාමනය කරමින් ප්‍රජා දායකත්වය ඊට ලබා දීමේ යාන්ත්‍රණයක් ඇති කිරීමයි. එලෙස ආරම්භයේදී උපදේශන ආයතනයක් ලෙසින් ගමන් ඇරඹූ මධ්‍යම පරිසර අධිකාරිය පරිසර සම්පත් වලට බලපෑම් ඇති කරන පාර්ශව වෙත උපදේශන සේවා ලබාදීමෙන් පමණක් පරිසරය රැකගැනීම පහසු නොවන බව අවබෝධ කර ගැනීමෙන් පසුව සෘජුවම අදාළ පාර්ශව නීතිමය බැඳීමකට යටත්ව නියාමනය කිරීමට හැකිවන පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර පරිසර අනුමැතීන් ආදී නීතිමය ලේඛන ලබා දෙන බලාත්මක ආයතනයක් ලෙස තම පනත අවස්ථා දෙකකදී සංශෝධනය කරමින් පිවිසුණේය.

විශේෂයෙන් පරිසර පනත මගින් පරිසර සම්පත් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික සැකැස්මක් ඇති කලද වරින් වර වෙනස් වන හා අලුතින් හඳුනා ගන්නා පරිසරික තර්ජනවලට පහසුවෙන් මුහුණ දෙනු පිණිස එම පනතෙහි ප්‍රතිපාදන යටතේ අනු නීති හෙවත් රෙගුලාසි ගණනාවක් ද බලාත්මක කර ඇත. ඊට උදාහරණයක් ලෙස කාර්මික කටයුතු හේතුවෙන් පාරිසරික සම්පත්වන පස, ජලය සහ වායුගෝලීය සංයුතීන් කෙරෙහි සිදුවන වෙනස්කම් කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය මේ වන විට හසුරවනු ලබන්නේ අංක 2264/18 දරන වර්ෂ 2022/01/27 දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද රෙගුලාසිය නොහොත් රජයේ අනු නීතීන්හි සඳහන් ප්‍රතිපාදන යටතේය.

තවද ජන ජීවිතයට බලපෑම් සිදුකරනු ලබන මහාමාර්ග, ගුවන්තොටුපළවල්, ජලාශ ඉදිකිරීම් වැනි මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර එම ඉදිකිරීම් මගින් සිදුවිය හැකි පරිසරික බලපෑම් විධිමත් ඇගයීමකට ලක් කොට එම ඉදිකිරීම සඳහා පරිසරික අනුමැතිය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් පිළිබඳව උපදේශන ලබා දීමට අංක 772/22 නමැති පරිසර රෙගුලාසිය භාවිතා කරනු ලබයි.

මෙලෙස ඉතා වැදගත් පරිසරික සංවේදීතාවයන් ඇති ප්‍රදේශ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස නම් කරමින් එම කලාප තුළින් මහජන ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසීන් ප්‍රකාශයට පත් කිරීමේ බලය ද ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ දක්වා ඇත.

එලෙසම පරිසරයේ සංරචක ලෙස සලකනු ලබන අවට වාතය හා ජලය ජීවී ප්‍රජාවන්ට බලපෑම් ඇති කරනු ලබන වැදගත් සාධකයක් වන බැවින් එකී පාරිසරික සම්පත් රැක ගැනීම හා කළමනාකරණය සඳහාද සංසරණ වායු තත්ත්ව හා සංසරණ ජල තත්ත්ව සඳහා ප්‍රමිතීන්

ප්‍රකාශයට පත් කිරීම හා කාර්මික කටයුතුවලින් ජලයට මුදාහරිනු ලබන අප ද්‍රව්‍ය සඳහා මෙන්ම වායුගෝලයට විමෝචනය කරනු ලබන වායුමය දූෂකාරක සඳහා ද උපරිම සීමාවන් පනවනු ලැබීමට ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ බලාත්මක කර ඇත.

තවද පරිසරය යන්නට දේශ සීමා පවත්වා ගැනීම ඉතා අපහසු බව දශක ගණනාවක සිටම ජාත්‍යන්තර ප්‍රජාව විසින් අවබෝධ කරගෙන ඇති නිසා විශාල ජාත්‍යන්තර ගිවිසුම් ගණනාවක් පරිසර සංරක්ෂණය හා කළමනාකරණය වෙනුවෙන් ලෝක ප්‍රජාව විසින් එක් එක් පාර්ශව කරුවන්ට තම අභිමතය පරිදි අත්සන් තබා තම රටවල ක්‍රියාත්මක කිරීමටද අවකාශ ලබා දී ඇති අතර බාසල් සම්මුතිය, ස්ටොක්හෝල්ම් සම්මුතිය හා මොන්ට්‍රියල් සන්ධානය හා සයිටීස් ගිවිසුම මේ වන විට පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය වෙනුවෙන් අප රට අත්සන් තබා ඇති ගිවිසුම් අතර ප්‍රධාන තැනක් ගන්නා අතර එම ගිවිසුම් වල ඇති කොන්දේසි පාරිසරික පනතේ ඇති ප්‍රතිපාදන යටතේ අනුනීති හා ප්‍රතිපත්ති ලෙස සකස්කර ජන ජීවිතයට බලපාන පරිදි නීතිගත කර ඇත.

මෙම ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව තම රට තුළ එකී ගිවිසුම්ගත කරුණු වලින් බැඳී සිටින කටයුතු අධ්‍යයනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය මූලික කරගෙන මධ්‍යම පරිසර අධිකාරිය හා අදාල ආයතන කටයුතු කරන අතර පාරිසරික බලපෑම් ඇති කරනු ලබන රසායනික ද්‍රව්‍ය රටවල් අතර ප්‍රවාහනය කිරීම වැනි කරුණු මෙම සමහර ගිවිසුම් මගින් පාලනය වන බැවින් ආනයන අපනයන කළමනාකරණය කරනු ලබන ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා රේගුව ද මෙම කර්තව්‍යන්හි ප්‍රධාන පාර්ශවකරුවකු ලෙස සම්බන්ධ කරගෙන ඇත.

ජාතික පාරිසරික පනත යටතේ පරිසර කළමනාකරණය වෙනුවෙන් වූ බලතල ඉහතින් සඳහන් කරන්නට යෙදුණු ආයතනයන් හා සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට අමතරව තම බලතල විමධ්‍යගත කිරීමට මධ්‍යම පරිසර අධිකාරියට ජාතික පාරිසරික පනත යටතේ ඇති බලතල උපයෝගී කරගෙන පළාත් පාලන ආයතනයන් වෙත සුළු පරිමාණ දූෂකාරක කර්මාන්තවලට (එනම් තම කර්මාන්තය ක්‍රියාත්මක වීම නිසා පරිසරික සම්පත්වලට සිදුවන බලපෑම ඉතාමත්ම අඩු යැයි පූර්ව නිගමනයක් සහිත කර්මාන්ත) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ බලය පළාත් පාලන ආයතන වෙත විමධ්‍යගත කර ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතට පසුව සිදු කරන ලද සංශෝධනයක් යටතේ එකී ආයතනය ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් ඉටු කරනු ලබන මහඟු කාර්යභාරයක් වන විදේශ ආයෝජන රට තුළට ලබා ගැනීම සලකා බලා මෙම අධිකාරියේ එකඟතාවය ලබා ගැනීමෙන් පසුව පමණක් සියලු ආකාර පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලය එකී පනතෙහි ඇති ප්‍රතිපාදනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතට ලබා ගෙන ඇත.

තවද අවිධිමත් නාගරීකරණය හා කාර්මිකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වනවිට අප දිවයින මුහුණපාන ප්‍රධාන ගැටළුවක් වන නාගරික කැළිකසල අපහරණයේදී ප්‍රතිපත්ති සැකසීම වැනි කටයුතුවලදී ජාතික පාරිසරික පනතේ ඇති ප්‍රතිපාදන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය එකී කාර්ය ක්‍රියාත්මක කිරීමේ බලය ඇති ආයතන වන පළාත් පාලන ආයතන වෙත තාක්ෂණ සහයෝගය ලබාදෙන අතර, පොලිතින් ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය අපහරණයට ඇති අපහසුතාවයන් ගැන සළකා එකී ද්‍රව්‍ය භාවිතයන් පාලනය වැනි ක්‍රියාකාරකම් වෙනුවෙන්ද රෙගුලාසි පැනවීම හා ක්‍රමවත් අපහරණ කටයුතුවල නිරත නොවන පළාත් පාලන ආයතන වලට එරෙහිව අධිකරණය

මගින් අධිකරණ තීන්දු ලබාගැනීමට නීතිමය කාර්යයන්හි නියැළීමද මේ වනවිට ජාතික පාරිසරික පනතෙහි ප්‍රතිපාදන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය නියැලී සිටින කාර්යයන් අතරින් එකකි.

මෙම දිවයින තුළ වෙසෙන සුවහසක් වූ සත්ව හා ශාක ප්‍රජාවන්ගෙන් සමන්විත වන සමස්ත ජීව ගෝලය වෙත මහඟු කාර්යභාරයක් සිදු කරමින් කටයුතු කිරීම සඳහා ඉවහල් වන ජාතික පාරිසරික පනත සඳහා අවශ්‍ය වන සංශෝධනයන් සපයමින් එම පනත යාවත්කාලීන කිරීමේ කටයුත්ත මේ අවස්ථාවේදී සිදුවෙමින් පවතින අතර අඛන්ඩව ඉදිරියට ගමන් කරනු ඇත.

විශාන්ත මෙන්ඩිස්
සහකාර අධ්‍යක්ෂ (පුහුණු)
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී නීතිය හඳුනාගෙන ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත සුරකිමු.

ඈත අතීතයේ ශ්‍රී ලාංකික ජනසමාජයේ පැවති සරල ජීවන රටාව එකල පරිසරයට හානිකර නොවූ අතර මිනිසුන්ගේ සෞඛ්‍යයටද හිතකර විය. අතීතයේ පැවති ජීවන රටාවේ අවශ්‍යතා අවම වීම නිසා පරිසර සම්පත් පරිභෝජනය අවම මට්ටම පැවතිණ. බුදු දහමින් පෝෂණය වූ අතීත ජන ජීවිතය සරල සැනසිලිදායක සහ පරිසර හිතකාමී විය. වනසතුන් ඇතුලූ පරිසර සංරක්ෂණය එකල ජනතාවගේ දිවිපැවැත්මේ විශේෂ ලක්ෂණයක් විය. වගා බිමකදී කරුපාලුව ඇත් පාලව ලෙස වනසතුන්ටද වගා බිමෙන් කොටසක් වෙන්කර තිබිණ. බලුකපුටු දානය, මසුන්ට ආහාර ලබාදීම ආදි සිරිත් ද අතීත ජනයා පරිසරයට දක්වන ලැදියාවට හොඳ උදාහරණවේ.

16 වන ශත වර්ෂයේ යුරෝපීය ආක්‍රමණිකයන්ගේ පැමිණීමත් සමග පරිසර සම්පත් ඉතා දැඩි ලෙස සුරාකෑමට ලක්වීම හේතුවෙන් ඒවායේ විනාශයේ ආරම්භය සිදුවිය. දැව ලබාගැනීම සඳහා සහ කුරුඳු කෝපි සහ තේ වගාව සඳහා මධ්‍ය කඳුකරයේ වන වැස්ම දැඩි ලෙස විනාශ විය. මේ කාලය තුල විදේශකයින් විනෝදය සඳහා මෙන්ම මස් පිණිසද දල, සම් සහ අග ආදිය ලබා ගැනීම සඳහා ද ගෝනුන්, මුවන්, අලින්, කිඹුලන් ආදි වනසතුන් සහ විශාල පක්ෂින් දඩයම් කරන ලදි. එසේම වැවිලි කර්මාන්තයට තර්ජනයක් වූ වන අලින් මරා දැමීමට එකල රජය අනුග්‍රහයද ලැබිණි. එක් අලියකු මරා දැමීම වෙනුවෙන් සිලිං 3ක් ගෙවා ඇති බවට වාර්තා වල සඳහන් වේ. ඒ අනුව 1845-1848 කාලය තුල ඉංග්‍රිසි ජාතික මේජර් තෝමස් ස්කිනර් අලින් 600 පමණ ද මේජර් විලියම් රොජර්ස් අලින් 1300 පමණද ඝාතනය කර ඇති බව සඳහන් වේ. සැමුවෙල් බේකර් ද වන අලින් විශාල සංඛ්‍යාවක් මරා ඇති බවට වාර්තා වල සඳහන් වේ. අලින් මේ අයුරින් විශාල ලෙස මරා දැමීම නිසා 19 වන ශත වර්ෂයේ දෙවන භාගය වන විට මධ්‍ය කඳුකරයේ අලි ගහනය මුලුමනින්ම වඳවී යන්නට විය.

පසු කාලයේ දී සිමාවකින් තොරව සිදුවන වනාන්තර විනාශය ඇතුලූ ස්වභාවික සම්පත් විනාශය පාලනය කිරීම සඳහා විදේශීය පාලකයින්ම විවිධ අණපනත් පණවා ස්වභාවික සම්පත් සංරක්ෂණයට කටයුතු කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ කටයුතු විධිමත් කිරීම සඳහා 1885 දි කැලෑ ආඥා පනත පනවන ලදි. එසේම විනාශකාරී ලෙස සිදුවන වනසතුන් දඩයම පාලනය කිරීම සඳහා ද විවිධ අණපනත් රාශියක් ඉංග්‍රිසි පාලකයින් පනවන ලදි

1909 දී ඒ දක්වා පැවති සියලූම ආඥා පනත් එකතුකර ලංකාවේ වනසතුන් ආරක්ෂා කිරීම සඳහා 1937 දී වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ලෙස ඒකාබද්ධ ආඥා පනතක් ස්ථාපිත කරන ලදි මෙම ආඥා පනත කාලීනව අවස්ථා කිපයක දි සංශෝධනය වි වර්තමානයේ ශ්‍රී ලංකාවේ වනජීවීන්ට උපරිම ආරක්ෂාවක් සලසන ඉතා ශක්තිමත් නීතියක් බවට පත් වි ඇත. වර්තමානයේ මෙම වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ රැකවරණය ලබන ශ්‍රී ලංකාවේ මුලු භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයක පැතිරි ඇති රක්ෂිත කලාප ජාලයක් ක්‍රියාත්මක වේ. මෙම පනත ක්‍රියාත්මක කිරීමේ බලය පැවරි ඇති වනජීවී

සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංරක්ෂණය කරන ප්‍රධානතම රජයේ ආයතනයකි.

ලංකාවේ නීති සංග්‍රහයේ 469 වන අධිකාරිය (පරිච්ඡේදය) හි වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ දීර්ඝ නාමයේ සඳහන් පරිදි එහි මූලික අරමුණු පහත පරිදි වේ.

1) ශ්‍රී ලංකාවේ වනසතුන් සහ වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි සංරක්ෂණය කිරීම
2) එම වනසතුන් සහ වෘක්ෂලතා වාණිජ ලෙස සහ වෙනත් ආකාරයට අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම වැලැක්වීම
3) ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම

මෙම පනත මගින් ශ්‍රී ලංකාවේ වනසතුන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම, වනජීවී රක්ෂිත කලාප පිහිටුවීමට, ඒවා සංරක්ෂණය කිරීම හා රක්ෂිත වලින් පිටත වෙසෙන වනජීවීන් ආරක්ෂා කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බලතල පැවරී ඇත. එසේම මෙම පනත යටතේ වනසතුන් සහ ශාක සම්බන්ධයෙන් සිදුකරන වැරදි විමර්ෂනය කිරීමට හා වැරදිකරුවන්ට නඩු පැවරීමටද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට බලය පැවරී ඇත.

වනජීවී සංරක්ෂණයේ විවිධ අංශ ආවරණය කිරීමේ අරමුණින් මෙම පනත පහත සඳහන් පරිදි කොටස් 6 කින් සමන්විත අතර වගන්ති 75 ක් ඇතුලත් වේ.

කොටස	වගන්ති	අන්තර්ගතය
I	1-11	ජාතික රක්ෂිත භූමි සහ අභය භූමි
II	12-29	ඇත්තු
III	30-41	කොදු ඇට පෙළ සහිත සතුන් සහ රහිත සතුන්
IV	42-48	වෘක්ෂලතා
V	49-55	විවිධ විධි විධාන
VI	56-75	සාමාන්‍ය විධි විධාන

එසේම පහත සඳහන් පරිදි ආරක්ෂිත, දැඩිලෙස ආරක්ෂිත හා ආරක්ෂිත නොවන සතුන් සහ ආරක්ෂිත ශාක කාණ්ඩ ඇතුලත් උපලේඛන 8 ක් ද මෙහි ඇතුලත් වේ.

අංකය	**උපලේඛනය**	**සංක්ෂිප්ත අන්තර්ගතය**
i.	ආරක්ෂිත නොවන ක්ෂීරපායි සතුන් හා උරගයින්ගේ නාම ලේඛනය	වල් ඌරා, හාවා, ඉත්තෑවා, රිලවා අළු වඳුරා, නයා, මූදු කරවලා, තෙල් කරවලා, තිත් පොළඟා, වැලි පොළඟා
ii.	දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායි සතුන් සහ උරගයින් ගේ නාම ලේඛණය	උන හපුලුවා, කොළ දිවියා, දිවියා, වල් බළලා, හඳුන් දිවියා, දිය බල්ලා,

		වලහා, හම්බාවන්, කැබැල්ලෑවා, ගෝනා, ඕලූ මුවා, තල්මසුන්, ඩොල්පින්, මුහුදු ඌරා, කිඹුලන්, ඉබ්බන්, කැස්බෑවන්, අං කටුස්සා, කඳුකර කුරු කටුස්සා
iii.	ආරක්ෂිත නොවන පක්ෂීන්	කාක්කා (විශේෂ 2), ලය කායුරු වී කුරුල්ලා, නිතඹ සුදු වි කුරුල්ලා, රෑන ගිරවා, මාල ගිරවා
iv.	දැඩි ලෙස ආරක්ෂිත පක්ෂීන්	පක්ෂි විශේෂ 61ක් අඩංගුවේ
v.	ආරක්ෂිත නොවන උභය ජීවීන්ගේ නාම ලේඛනය	ගෙම්බන් හා මැඩියන් විශේෂ 10ක් ඇතුළත්ය
vi.	අරක්ෂිත මත්ස්‍යයින්ගේ නාම ලේඛනය	අසෝක පෙතියා, මර්ටන්ස්ටයින් පෙතියා, කොළ කනයා, ජෝන් ක්ලාස් අභිරාවා, දන්කුඩ පෙතියා, පතිරණ සාලයා, බන්දුල පෙතියා, ඇතුළු මත්ස්‍ය විශේෂ 23 ක් ඇතුලත්වේ
vii.	කොඳු ඇටපෙළ නොමැති ලේඛනය	සමනළයින්, සලබයින්, කෘමීන්, කුනිස්සන්, කකුළුවන්, ආරක්ෂිත සතුන්ගේ නාම බෙල්ලන්, වට පණුවන්, කොරල්, මුහුදු කැකිරි, ඉකිරියන් හා ඇන්මෝනියාවන් ඇතුලූ තවත් විශේෂ රාශියක් අඩංගුවේ
viii.	ආරක්ෂිත ශාක	විශේෂ ඕකිඩ් වර්ග, අක්මා ශාක, පැතලි ශාක ඇතුළු ශාක විශේෂ රාශියක් අඩංගුවේ

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට අනුව ගෘහාශ්‍රිත සතෙකු නොවන යම් සතෙකු වන සතුන් ලෙස අර්ථ දක්වා ඇත. යම් ගවයෙක්, බැටලූවෙක්, එළුවෙක්, අශ්වයෙක්, බූරුවෙක්, කොටළුවෙක්, බල්ලෙක් හෝ බළලෙක් සහ මිනිසා විසින් ගෘහාශ්‍රිතව ඇති කරනු ලබන කුකුලෙක් සහ ඌරෙක් ගෘහාශ්‍රිත සතුන් ලෙස අදහස් වේ. ඒ අනුව වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතෙන් ගෘහාශ්‍රිත සතුන් ආවරණය නොවේ.

වනජීවී රක්ෂිත

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනතට අනුව වනජීවී රක්ෂිතයක් යනු මහජන යහපත උදෙසා හේතුවන යම් ස්වාභාවික පරිසර පද්ධතියක් දිගුකාලීනව ආරක්ෂා කරගනු පිණිස, විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයක් මගින් නිශ්චිතව මායිම් දක්වා ප්‍රකාශයට පත්කරන ලද භූමියකි.

වනජීවී රක්ෂිත ප්‍රධාන වර්ග දෙකකි. එනම්

i. රජයට අයත් නිශ්චිත භූමි ප්‍රමාණයක් ඇතුලත්වන පරිදි ප්‍රකාශයට පත්කරන ලද ජාතික රක්ෂිත
ii. සම්පූර්ණ වශයෙන්ම හෝ කොටසක් රජයට හෝ පුද්ගලික අයිතිය ඇති යම් නිශ්චිත භූමියක් අභය භූමියක් හෝ අලි කළමණාකරණ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කල හැක.

ජාතික රක්ෂිත

රජයට අයත් නිශ්චිත භූමි ප්‍රමාණයක් ඇතුලත්වන පරිදි ප්‍රකාශයට පත්කරන ලද ජාතික රක්ෂිත, පහත සඳහන් වර්ග අතරින් එක් වර්ගයකට අයත්විය හැක.

1 තහනම් අඩවියක් (දැඩි ස්වභාව රක්ෂිතයක්)
2 ජාතික උද්‍යානයක්
3 ස්වභාව රක්ෂිතයක්
4 වන පිවිසුමක්
5 සමුද්‍රිය රක්ෂිතයක්
6 සමුද්‍රිය ජාතික උද්‍යානයක්
7 සීමාන්තරික කලාපයක්

දැනට දැඩි ස්වභාව රක්ෂිත 3 ක්ද ,ස්වභාව රක්ෂිත 09 ක්ද ,ජාතික උද්‍යාන 26 ක්ද, අභය භූමි 62 ක් සහ වනපිවිසුම් 02 ක් මේ පිහිටුවා ඇත.

දැඩි ස්වභාව රක්ෂිත (තහනම් අඩවියක්)

ජාතික රක්ෂිත යටතට ගැනෙන දැඩි ස්වභාව රක්ෂිත වලට ඇතුලුවීම සඳහා අවසර ලබාදෙනු ලබන්නේ රාජකාරී කටයුතු සඳහා හෝ අනුමැතිය ලත් පර්යේෂණ කාර්යයන් සඳහා පමණි. යාල රිටිගල සහ හග්ගල ලෙස දැඩි ස්වභාව රක්ෂිත 3 ක් දැනට පිහිටුවා ඇත.

ජාතික උද්‍යාන

වනසතුන් නැරඹීම සහ අධ්‍යයන කටයුතු සඳහා ජාතික රක්ෂිතයක් වන ජාතික උද්‍යානයක් තුල බලපත්‍රයක බලය මත නිශ්චිත කාලයක් සඳහා සංචාරය කිරීමට හා එහි රැඳී සිටීමට අවසර දෙනු ලැබේ. උද්‍යානය තුල අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි කඩ කිරීම වරදකි.

ජාතික රක්ෂිතයක් තුල පහත සඳහන් ක්‍රියාවන් තහනම් වේ.

- බලපත්‍රයක් නොමැතිව ඇතුල්වීම හෝ රැඳී සිටීම
- බලපත්‍රයක් යටතේ ඇතුල්වන අවස්ථාවල සතුනට හා ශාකවලට හානිකරන ආකාරයෙන් හැසිරීම හෝ බලපත්‍රයේ ඇති කරුණු උල්ලංඝණය කිරීම
- වන සතුන් දඩයම් කිරීම, මරණයට පත් කිරීම, හානි කිරීම, අල්ලා ගැනීම
- සතෙකු හෝ කොටසක් සන්තකයෙහි හෝ පාලනයෙහි තබා ගැනීම
- පක්ෂීන් ගේ හා උරගයින් ගේ බිත්තර හා කැදලි ගැනීම හෝ විනාශ කිරීම
- ශාක කැපීම, විනාශ කිරීම, එකතු කිරීම, ඉවත් කිරීම
- වගා කිරීම, පතල් හැරීම, ඉඩමක් ශුද්ධ කිරීම, හැරීම
- ගින්නක් දැල්වීම හෝ ගෙන යාම
- උගුල්, පුපුරන ද්‍රව්‍ය, තුවක්කු, වස සන්තකයෙහි තබා ගැනීම, පාවිච්චි කිරීම
- කැලෑ එලි කිරීම, පාරවල් තැනීම සහ ගොඩනැගිලි ඉදි කිරීම සහ ඒවායේ පදිංචි වීම
- හෝටලයක් ඉදි කිරීම, පාලනය කිරීම, එවැනි සේවා සැපයීම
- ගෘහාශ්‍රිත හෝ කිසිදු සතෙකු ඇතුලු කිරීම, දඩාවතේ යාමට ඉඩ දීම
- අවසර පත්‍රයක් නොමැතිව ඇළක් ඉදි කිරීම හෝ භාවිතා කිරීම
- දිය පාරක ජලයට විෂද්‍රව්‍ය, අපද්‍රව්‍ය, කැලි කසල හෝ ජලය දූෂණය විය හැකි වෙනත් ද්‍රව්‍යයක් එක් කිරීම
- අවසර පත්‍රයක් නොමැතිව කිමිදීම හෝ බෝට්ටු පැදීම,
- යම් සතෙකු හෝ ශාකයක් රක්ෂිතයට හඳුන්වා දීම, මුදා හැරීම
- බලපත්‍රයක් නොමැතිව මසුන් ඇල්ලීම.
- කිසියම් පුරා විද්‍යාත්මක පෞරාණික භූ විද්‍යාත්මක හෝ වෙනත් විද්‍යාත්මක වටිනාකමකින් යුත් දෙයක්, බණිජ සම්පතක් හෝ වෙනත් ද්‍රව්‍යයක් ඉවත් කිරීම.

එසේම ජාතික රක්ෂිතයකින් පිටත මාර්ගයක හෝ ඉඩමක සිට ජාතික රක්ෂිතයක් තුල සිටින සතෙකුට වෙඩි තැබීම හානි කිරීම හෝ මැරීම තහනම් වේ.

ජාතික රක්ෂිතයක මායිමේ සිට සැතපුම් එකක සීමාව තුල විධිමත් අනුමැතියකින් තොරව කිසිදු සංවර්ධන ක්‍රියාකාරකම්ක් සිදුනොකල යුතුය. එවැනි කාර්යයන් සඳහා අනුමැතිය ලබාදිය යුතු වන්නේ පාරිසරික බලපෑම් තක්සේරුවක් හෝ මූලික පාරිසරික සමීක්ෂණයකින් පසු කමිටුවක නිර්දේශ අනුවය

අභය භූමි

මෙම පනත යටතේ රජයේ මෙන්ම පෞද්ගලික ඉඩම්ද ඇතුලත්වන පරිදි යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් අභය භූමි හෝ වන අලි කළමනාකරණ රක්ෂිත භූමි ලෙස ප්‍රකාශයට පත්කල හැක. අභය භූමි තුල සීමිත මිනිස් ක්‍රියාකාරකම්වලට ඉඩ සැලසේ. අභය භූමියක් තුලට ඇතුලු විමට බලපත්‍ර අවශ්‍ය නොවේ.

අභය භූමි තුල වනසතුන් දඩයම් කිරීම, අල්ලා ගැනිම හෝ සතුන් ඇල්ලීමට හෝ මරණයට පත් කිරීමට උගුල් ඇටවීම හෝ කුමන ආකාරයෙන් හෝ වන සතුන්ට හානි කිරීම හෝ

බිය ගැන්වීම තහනම් වේ.

යම් සතෙකුගේ කොටසක් තම සන්තකයේ හෝ භාරයේ තබා ගැනීම සහ පක්ෂියකුගේ හෝ උරගයකුගේ කැදලි කුඩු හෝ බිත්තර ගැනීම විනාශ කිරීම තහනම් වේ. යම් වන සතෙකු බෝවීමේ ක්‍රියාවලියට හෝ එවැනි ස්ථානයකට බාධා වන ක්‍රියා.

අභය භූමියක් තුල පිහිටි රජයේ ඉඩමකට කැලි කසළ හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හා ඉඩම් ගොඩකිරීමද කැළෑ එළි කිරීම, ගොඩනැගිලි ඉදිරිකරීම සහ පාරවල් තැනීමද තහනම් වේ. එසේම අභය භූමියක් තුල පිහිටි රජයේ ඉඩමක ගසක් කැපීම ඉදිරීම විනාශ කිරීම හෝ ඉවත්කර ගැනීමද තහනම් වේ.

II කොටස - ඇත්තු

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතෙහි II වන කොටසට අනුව වනජීවී රක්ෂිතයක් තුල හෝ ඉන් පිටත ඕනෑම ස්ථානයක අලි ඇතුන් දඩයම් කිරීම වෙඩි තැබීම මැරීම තුවාල කිරීම හිංසා කිරීම හෝ අල්ලා ගැනීම තහනම් වේ.

මෙම පනතට අනුව මරනු ලැබූ හෝ මියගිය අලියකු හෝ ඇතකු රජයේ දේපලක් වන අතර මැරුණු එවැනි සතකුගේ කොටසක් ඉවත් කිරීම විකිණීම හෝ මිලට ගැනීම තහනම් වේ.

සියලුම හීලෑ අලි ඇතුන් මෙන්ම ඇත් දළද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලයුතු වන අතර ලඟ තබා ගැනීම සඳහා වාර්ෂික බලපත්‍රයක් ලබාගත යුතුය.

එසේම ලියාපදිංචි ඇතින්නක් ගැබ් ගැනීමකදී අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව දැන්විය යුතු අතර උපතක් ගබ්සාවක් හෝ මල උපතක්ද දින හතක් ඇතුලත දැන්විය යුතුය. ලියාපදිංචි අලියකු හෝ ඇතකුගේ මරණය පිළිබවද අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය. හීලෑ අලියකු ඇතකු හෝ ඇත් දළයක අයිතිය වෙනස් විමකදී ද දෙපාර්තමේන්තුව දැනුවත් කල යුතුය. එසේම ලියාපදිංචි නොකල ඇත් දළයක් හෝ දතක් නීති විරෝධිව කැළයෙන් ලබාගත් ලෙස අනුමාන කර දෙපාර්තමේන්තු භාරයට ගතහැකිය

III කොටස - කොදුඇට පෙළ සහිත සහ රහිත සතුන්

රක්ෂිත ප්‍රදේශවලින් පිටත ප්‍රදේශ තුළ, ඉහත ii,iv,vi සහ vii යන උපලේඛනවල සඳහන් ආරක්ෂිත සහ දැඩිලෙස ආරක්ෂිත සතුන් සහ i, iii සහ v යන උපලේඛනවල සඳහන් නොවන ආරක්ෂිත සතුන්,

- මැරීම, තුවාල කිරීම, අල්ලා ගැනීම
- මැරීමට හෝ අල්ලා ගැනීමට උගුලක්, තුවක්කුවක් හෝ වෙනත් ද්‍රව්‍යයක් යොදා ගැනීම
- එම සතුන්ගේ බිත්තර හෝ කුඩුවක් ගැනීම හෝ විනාශ කිරීම.
- එම සතුන්ගේ යම් කොටසක්, මස් හෝ බිත්තර සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශණය කිරීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම පදම් කළ හෝ නොකල සමක්, අං තට්ටුවක් සන්තකයේ තබා ගැනීම, මිලදී ගැනීම තහනම් වේ.

උසාවියකදී, ඉහත උපලේඛනවල සඳහන් ආරක්ෂිත සතුන් සම්බන්ධ වැරදි වලට නියම කෙරෙන දඩ සහ සිරදඬුවම් වලට සාපේක්ෂව වැඩි දඩ සහ සිර දුඩුවම් ප්‍රමාණයක් දැඩිලෙස ආරක්ෂිත සතුන් සම්බන්ධ වැරදි වලට නියම කෙරේ.

එසේම බලපත්‍රයක් නොමැතිව මියගිය හෝ ජීවත්ව සිටින කොදුඇට පෙළ සහිත හෝ රහිත සතෙකු හෝ යම් කොටසක් හෝ එම සතුන්ගේ බිත්තර ආනයනය හෝ අපනයනය කිරීම තහනම් වේ.

IV කොටස-වෘක්ෂලතා

එසේම යම් තැනැත්තෙකුට අයත් භූමියක හෝ පොදු ස්ථානයක වැඩෙන viii උපලේඛනයේ සඳහන් ආරක්ෂිත ශාක ඉදිරිම, විනාශ කිරීම, විකිණීම සහ ඒ සඳහා ප්‍රදර්ශණය කිරීම උඩවැඩියා වැනි අපිශාක වැඩෙන විශාල ගස් විනාශ කිරීම තහනම් වේ.

V කොටස-විවිධ විධිවිධාන

ජාතික රක්ෂිතයක හෝ අභය භූමියක කපා දමා ඇති දැව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින්ට තහනමට ලක්කර රාජසන්තක කල හැක. එසේම ජාතික රක්ෂිතයක හෝ අභය භූමියකින් කපා ගන්නා ලද දැව ගබඩා කර ඇති ස්ථානයකට ඇතුලුවී පරීක්ෂා කිරීමේ බලය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින්ට බලය ඇත.

VI කොටස-සාමාන්‍ය විධි විධාන

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ දක්වා ඇති නීතිමය ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලතල වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින්ට මෙම කොටස යටතේ බලය පැවරේ.

මේ යටතේ යම් වනජීවී අපරාධයක් සම්බන්ධව වාහනයක්, නිවසක් පරිශ්‍රයක් වරෙන්තුවක් නොමැතිව සෝදිසි කිරීමට හා වරෙන්තුවක් නොමැතිව තැනැත්තෙකු හෝ භාණ්ඩ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමටත් වනජීවී සංරක්ෂණ නිලධාරින්ට බලය පැවරේ.

තුවක්කු බලපත්‍ර පරීක්ෂා කිරීමට සහ බලපත්‍ර නොමැති තුවක්කු අත්අඩංගුවට ගැනීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින්ට බලතල හිමිවේ.

මෙම ආඥා පනතේ කාර්යයන් සඳහා වනජීවී නිලධාරින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සාම නිලධාරින් වෙති. සිය රාජකාරී විෂය පථය තුල සිදුකෙරෙන වැරදි සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ XI පරිච්ඡේදයට අනුව පරීක්ෂණ පැවැත්වීමේ බලතල පැවරී ඇත. වැරදි සම්බන්ධව පුද්ගලයන් සෝදිසි කිරීම සෝදිසි වරෙන්තු ක්‍රියාත්මක කිරීම සිරබාරයට ගැනීම, ඇප පිට නිදහස් කිරීම, සිරබාරයට ගනු ලැබූ තැනැත්තන් උසාවියට ඉදිරිපත් කිරීම වැඩිදුර පරීක්ෂණ පැවැත්වීම ආදී කාර්යයන් සඳහා වනජීවී නිලධාරීන්ට බලතල ඇත.

මේ අයුරින් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත පිළිබඳව හොඳින් දැනුවත් වීම තුලින් ඔවුන් සංරක්ෂණය සඳහා ක්‍රියාකාරිව සහභාගි වීමට හැකියාවක් ලැබේ. ඒ අනුව වන සතුන්ගේ දත් අග වැනි ද්‍රව්‍ය වලින් සෑදූ ආභරණ පැළඳීමෙන් වැලකී සිටිය හැක. වන සතුන්ගේ සම් වලින් සෑදූ සපත්තු සහ බෑග් ආදි භාණ්ඩ භාවිතයේ වැලකී සිටීම් සහ වන සතුන්ගේ පිහාටු, අස්ථි සැකිලි කොටස්, සම් ආදි කොටස් වලින් සෑදූ විසිතුරු භාණ්ඩ භාවිතා කිරීම වැලිකි සිටීම වනජීවී නීතිය රැකීමට මහගු පිටුවහල් වේ .

වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමට සහාය වෙමින් ලංකාවේ වනජීවී සම්පත ආරක්ෂා කිරීමට ඔබට හැකියාවන් ඇත. නීති ගරුක පුරවැසියකු ලෙස ඒ සඳහා ඔබට අයිතියක් මෙන්ම යුතුකමක් ද ඇත. ඒ අනුව වනජීවී අපරාධයක් දුටු විගස හෝ ආරංචි වූ විගස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 1992 අංකයට දන්වන්න එසේ නොමැති නම් ළඟම පිහිටි වනජීවී කාර්යලයට හෝ පොලීසියට දන්වන්න.

Dr.-Ing NMP Milinda Piyasena
Senior Lecture (G1)
Faculty of Geomatics, Sabaragamuwa University of Sri Lanka

Contribution of Botanic Gardens to Country's Environmental Policies and Laws

1. Introduction

Botanical gardens of Sri Lanka are linear to tourist attractions or as leisure spaces. They are vital institutions as scientific establishments where ex-situ conservation of plants is performed; plant related studies; research on plants & related issues, bio diversity and its sustainable use; research on floriculture; plant connected education; floriculture promotion in the island and policy support.
In Sri Lanka, a country with remarkable biodiversity and many endemic species, botanic gardens have played and continue to play important roles in shaping environmental policies, providing expert evidence for legislation, and supporting sustainable development.

2. Legal & Policy Framework

2.1. Botanic Gardens Ordinance (1928)

Botanic Gardens Ordinance (Ordinance No. 31 of 1928) is the principal legal instrument governing the establishment, management, administration, and control of botanic gardens in Sri Lanka. Through this ordinance, certain gardens are declared as "botanic gardens," for example the Royal Botanic Gardens, Peradeniya; Hakgala Botanic Gardens; and Henarathgoda Botanic Gardens, Gampaha. The Ordinance provides for appointment of curators; empowers the Minister to establish regulations for public access, maintenance, restrictions; and punishing provisions for damage to flora, trees, fences etc.

2.2. Botanic Gardens (Amendment) Law (1973)

Amended Section 8 of the Ordinance is to allow the levying of fees or charges for admission to botanic gardens, subject to limitations and exemptions.

2.3. Boundary Redefinition and Extension of Legal Protection

Botanic Gardens (Amendment) Law (1973) is being amended to redefine and gazette the boundaries of all botanic gardens under revised legislation so as to prevent illegal settlements, encroachments, and inappropriate construction. Also, inclusion of newer gardens of Mirijjawila Dry Zone Botanic Gardens, Seethawaka Wet Zone Botanic Gardens under statutory coverage so that legal protections are extended.

In addition, the new amendment will include administration, objectives, functions and powers of the Department, Development Plans, restrictions within any National Botanic Gardens, accounts and auditing, offences, regulations.

2.4. Integration with Environmental Laws & Biodiversity Policy

Botanic gardens interface with broader environmental laws and policies including biodiversity conservation, endangered species protection, sustainable use of plants, habitat restoration and environmental impact assessment.

Also, as part of Sri Lanka's commitments under international treaties there is legislative and policy motivation for conserving plant genetic resources, ex-situ conservation, and public awareness. While not always clearly via botanic gardens specific law, but botanic gardens provide the scientific basis and implementation for many such commitments.

3. Roles of Botanic Gardens in Policy and Law Implementation

Beyond the legal framework, botanic gardens in Sri Lanka contribute in several key ways to environmental governance:

3.1. Providing scientific data for policy and laws

Botanic gardens act as expert bodies or contribute data/information that inform environmental legislation, biodiversity action plans and policies, and environmental assessments. Their herbaria, living collections, taxonomic databases are used in policymaking, legal decisions.

- Information on Biodiversity: The National Herbarium under the Department of National Botanic Gardens collect, authenticate, and preserve specimens of native Sri Lankan plants via National botanical survey conducted continuously. This data is used to produce vital publications, such as the National Red lists, which categorizes threatened and endangered plant species. The findings help inform and justify national conservation policies.

- Red List Assessment: The National Herbarium is the national authority for assessing plants for the National Red List. This species assessment process, conducted in collaboration with the Ministry of Environment and other relevant authorities, is fundamental for identifying plants needing legal protection. Research at gardens helps data fed into the Red List (plants) as well, helping to identify species at risk, their habitats, and conservation strategies and measures.

- Plant authentication: The National Herbarium carries out plant identification and authentication for legal, commercial, and scientific purposes. This provides verifiable data that can be used in cases related to bio-piracy, intellectual property, and adherence to environmental regulations. Currently about 160,000 dried specimens are conserved at the National Herbarium at Peradeniya.

3.2. Ex-situ conservation of Plant Genetic Resources

Botanic gardens maintain collections of endemic, threatened, and endangered plant species, serving as living repositories. The botanic gardens' primary role is the ex-situ conservation of Sri Lankan plant diversity, which directly protects against species loss and supports the country's conservation policies.

- Conservation network: Sri Lanka's botanic gardens, including the Royal Botanic Gardens, Peradeniya, Hakgala Botanic Gardens, Henarathgoda Botanic Gardens, and the newer Mirijjawila Dry Zone Botanic Gardens and Seethawaka Wet Zone Botanic Gardens as well as Ganewatta Medicinal Plant Gardens, conserve about 4500 plant species including rare, endangered, and endemic species in their collections.

- Species reintroduction: The botanic gardens' conservation programs act as gene banks, allowing for the potential reintroduction of species into their native habitats where they become extinct in the wild. Eg. Re introductory programme of *Doona ovalifolia* species which is recorded as Critically Endangered (CR) in the National Red List of year 2020 is carried out by the Royal Botanic Gardens, Peradeniya

- Regional representation: Newer gardens in Mirijjawila for Dry Zone and Seethawaka for Lowland Wet Zone species were strategically established to provide ex-situ conservation of flora from different climatic zones, strengthening national conservation efforts. In the near future a Mangrove Botanic Gardens in Akmeemana will be established for conserving Mangrove species ex-situ.

- In-situ conservation: Gardens work with partners and governments beyond their own grounds to implement conservation strategies to strengthen the natural habitats. This collaboration is vital for successful conservation planning, implementation and monitoring.

3.3 Public education and environmental awareness

By functioning as educational centers and public spaces, the gardens stand-in a culture of environmental awareness and respect the nature, which is a key component of

effective environmental policies.

- Educational programs: The gardens offer educational and training programs for students and the general public on biodiversity, conservation, and sustainable plant use. They also train personnel (technicians, horticulturists, botanists) in plant propagation, conservation, and sustainable floriculture.

- Promoting eco-tourism: Botanic gardens promote eco-tourism by educating visitors on the importance of conservation and sustainable practices, which can reduce the environmental impact of tourism.

- Knowledge dissemination: Botanic gardens uses communication strategies to provide accurate information and technical expertise on plants and plant-related industries, helping build public support for environmental protection.

- Cross-sector collaboration: By collaborating with agricultural, forestry, wildlife, plantation and other sectors, botanic gardens ensure that conservation goals are integrated into a broader range of national policies and development plans.

3.4. Policy influence through research and development

Research and development activities in the botanic gardens contribute to national policies on sustainable resource management. Botanic gardens influence a country's environmental policies and laws through scientific research in taxonomy, floriculture, propagation methods (including micropropagation), genetic conservation, and sometimes bio-prospecting which provide essential data on biodiversity, conservation and restoration, and shape public opinion, which in turn influences policy decisions.

- Sustainable use of plants: The Medicinal Plant Garden in Ganewatta focuses on the conservation and sustainable management of medicinal plants, directly supporting policies related to traditional medicine and bioprospecting.

- Floriculture development: By researching and promoting the floriculture industry, the gardens support economic policies that provide livelihoods without damaging the environment.

- Gardens also help to boost floriculture, horticulture, which ties into policies for rural development, income generation and exports.

- Sustainable Development : Botanic gardens influence policy by providing scientific data through floristic research, contributing to plant conservation policies and

biodiversity strategies. It also supports regional industries like floriculture, inform sustainable land use through botanical knowledge, and advocate for environmental protection by offering expertise on local flora to governments and the public. Botanic gardens serve as green lungs in proximity to urban areas, helping with microclimate regulation, carbon sequestration, biodiversity corridors and research from gardens also provide information for urban planning policies.

4. Way Forward

Botanic gardens in Sri Lanka represent a key intersection between nature, law, research, education, and policy. Reinforced by formal legislation like the Botanic Gardens Ordinance (1928) and its amendments, they have been central to ex-situ conservation, biodiversity documentation, public awareness, and supporting sustainable uses of plant resources. However, to keep pace with emerging environmental threats and policy needs such as climate change, habitat loss, urbanization, stronger legal protection, better funding, improved infrastructure, clear boundary definitions, matching the current need of human resources and closer integration with other environmental laws are required.

If Sri Lanka can modernize its legal framework for botanic gardens, strengthen enforcement, and expand the roles of these institutions, they can make even greater contributions to preserving the island's rich biological heritage, supporting sustainable development, and fulfilling international environmental obligations.





දිනුෂා සංජීවනී බඹරැන්දගේ
සංවර්ධන නිලධාරී
පරිසර සැලසුම් හා ආර්ථික අංශය

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (SCP)

ගෝලීය ප්‍රවණතාවක් වන ජනගහන වර්ධනය සහ සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් මිහිපිට ඇති සම්පත් සඳහා වූ අධික ඉල්ලුම නිසා සම්පත් සීමිත වීමක් සිදුවෙමින් පවතී. මානව අවශ්‍යතාවන් වන වාතය, ජලය, ආහාර, බලශක්තිය, ඛනිජ ආදී ස්වාභාවික සම්පත් බිලියන 8.1 වූ ලෝක ජනගහනයේ අවශ්‍යතාවන් සපුරාලීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තිරසරව සම්පත් පරිභෝජනය කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත.

පොසිල ඉන්ධන දහනය, වන විනාශය, භූමි හායනය වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා හරිතාගාර වායූන් පරිසරයට නිකුත්වේ. මේ හේතුවෙන් ගෝලීය උණුසුම ඉහළ යාම නිසා ලෝක වාසීන්ට දේශගුණ විපර්යාසවලට මුහුණ පෑමට සිදුවෙමින් පවතී. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (Intergovernmental Panel on Climate Change-IPCC) ආයතනය පවසන පරිදි ලෝක ප්‍රජාව හරිත / තිරසර සංවර්ධනයන් වෙත යොමු නොවුන හොත් 2040 වසර වන විට උෂ්ණත්වය සෙල්සියස් අංශක 1.6 අතර අගයකින් ඉහළ යාමේ නැඹුරුතාවක් පවතී. දිනෙන් දිනම දේශගුණ විපර්යාස නිසා ග්ලැසියර දියවීම නිසා මුහුදු මට්ටම් ඉහළ යාම නිසා වෙරළ ආශ්‍රිත පහත් බිම් යට වීම, අධික වැසි, දැඩි නියං තත්ත්ව, ගංවතුර, නාය යෑම් සුලභ වීම දක්නට ලැබේ. මිනිසාට පරිභෝජනය කිරීමට ඇති සම්පත් හිඟ වීමට ද භූ දේශපාලනික ප්‍රශ්න උද්ගත වීමට ද දේශගුණ විපර්යාස හේතුවේ.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක ආර්ථිකය ප්‍රසාරණය වීමේදී අදායම් විෂමතා, අධ්‍යාපනික, යටිතල පහසුකම්, රැකියා, සමාජීය ප්‍රශ්න හා ස්වාභාවික සම්පත් පරිභෝජනයේ සීඝ්‍ර වැඩි වීමක් දක්නට ලැබේ. ජනගහන වර්ධනය සහ සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් පාරිසරික ගැටළු ගණනාවක් පැණ නැගී ඇති අතර අනාගත අර්බුද රැසකට මඟ පාදමින් සිටියි. වේගවත් නාගරීකරණය නිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (කසළ බැහැර කිරීම) ඉතා බරපතල පාරිසරික ගැටළුවක් බවට පත්ව ඇත. එමෙන්ම නාගරීකරණය සහ කාර්මීකරණයෙන් සිදුවන වායු දූෂණය ද ඉහළ යමින් පවතී. සමහර ප්‍රධාන නගරවල ඕසෝන්, සල්පර්ඩයොක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ් හා ක්ෂුද්‍ර දූවිලි අංශු ප්‍රමාණය හුස්ම ගැනීමට සුදුසු ප්‍රමිතීන් පවා ඉක්මවා ගොස් ඇති අතර ජල දූෂණය පානීය සුරක්ෂිත ජල සැපයුමට දැඩි බලපෑමක් සිදු කරමින් සිටියි.

මෙම තත්වයන් සැලකිල්ලට ගෙන එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක වල 12 වන ඉලක්ක වන තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ ''දස අවුරුදු වැඩසටහන් රාමුව'' ට අනුගත වෙමින් 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එළි දක්වා තිබේ. මූලික ලෙස මානව අවශ්‍යතා වන ආහාර, නිවාස, සෞඛ්‍ය, ගමනාගමනය සහ අධ්‍යාපනය ආදී සේවා ප්‍රශස්ත සැපයීම තුළින් ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය නංවාලීම සඳහා ද පරිසර හිතකාමී ලෙස ආර්ථික සංවර්ධනය වෙත පිය මැනීමට තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය මහෝපකාරී වේ.

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය යනු ''අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතා අවදානමකට ලක් නොවන ලෙසට සේවාවේ හෝ නිෂ්පාදනයේ ජීවන චක්‍රය පුරා ස්වභාවික සම්පත් සහ මූලික ද්‍රව්‍ය භාවිතය මෙන්ම අපද්‍රව්‍ය සහ දූෂක විමෝචනය අවම කරමින් මූලික අවශ්‍යතාවන් සඳහා ප්‍රතිචාර දක්වන්නා වූ සහ වඩා යහපත් ගුණාත්මක බවක් ඇති කරන්නාවූ සේවා සහ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය''. ලෙස ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දැක්වෙයි.

මෙම ප්‍රතිපත්තිය ප්‍රධාන තේමාවන් 3 ක් මත පදනම්ව ක්‍රියාවට නැංවීමට යෝජනා කර ඇත. එනම්;

පාරිසරික තේමා - වාතය, ජලය හා සනීපාරක්ෂව, බලශක්තිය, අපද්‍රව්‍ය
ආර්ථික අංශය - කර්මාන්ත, ආහාර, ප්‍රවාහනය, ගොඩනැගිලි හා ඉදිකිරීම්, සංචාරක,
ආධාරක ප්‍රතිපත්ති සහ උපාය මාර්ග - අධ්‍යාපනික හා සන්නිවේදනය, විද්‍යාව හා තාක්ෂණය, රාජ්‍ය ප්‍රසම්පාදනය

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අභිමතාර්ථ සරලව පහත දක්වා ඇත.

1. වායු දූෂණය කරන විමෝචනයන් අඩු කිරීම තුළින් සියලුම ජීවීන්ගේ ජීවනාලිය වන වාතයෙහි ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම.
2. මිනිසාගේ ප්‍රධාන අවශ්‍යතාවයක් වන ජලය උපරිම සම්පත් කාර්යක්ෂමතාවකින් භාවිතයට ගැනීම.
3. තිරසර සංවර්ධන ඉලක්ක 06 (SDG - 06) අරමුණ අනුව සැමට පිරිසිදු පානීය ජලය සහතික කිරීම සඳහා තිරසර ලෙස ජල සම්පත කළමනාකරණය කිරීම.
4. බල ශක්තිය කාර්යක්ෂමව පරිහරණය කිරීම, පුනර්ජනනීය බල ශක්ති ප්‍රභවයන් කෙරෙහි යොමු වීම තුළින් පොසිල ඉන්ධන දහනය මඟින් වන වායු විමෝචනයන් අවම කිරීම.
5. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඇති ප්‍රාදේශීය යාන්ත්‍රණය ශක්තිමත් කිරීම හා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය තුළින් නව නිෂ්පාදන උත්පාදනය ප්‍රවර්ධනය කිරීම හා 3R සංකල්පය ක්‍රියාවට නැංවීම.
6. සියලූ අපද්‍රව්‍ය ධාරා සඳහා දූෂකයා ගෙවීමේ මූලධර්මය ආදේශ කිරීම.
7. පවත්නා කර්මාන්ත වඩා සම්පත් කාර්යක්ෂම සහ පරිසර හිතකාමී කර්මාන්ත බවට පරිවර්තනය කිරීම සඳහා තාක්ෂණවේදය හඳුන්වා දීම මඟින් හරිත නිෂ්පාදන ප්‍රවර්ධනය.
8. කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන භෝග ප්‍රචලිත කිරීම හා පෙර හා පසු අස්වනු හානි අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම.
9. ආහාර පරිභෝජනය අපතේ යාමකින් තොරව සිදු කිරීම හා බෙදා ගැනීමේ "sharing" සංකල්පය ප්‍රවර්ධනය කිරීම.
10. පාරිසරිකව තිරසර වූ, සම්පත් කාර්යක්ෂමතාව ඉහළ, නීරෝගිමත් ජීවන රටාවක් ගෙන යාහැකි නගර, ගම් හා හරිත ගොඩනැගිලි (Green Building Concept) නිර්මාණය කිරීම.
11. සමාජයට අවම සෞඛ්‍ය බලපෑමක් සහිතව සැවොම සඳහා කාලය ඉතිරි කරන, බලශක්ති කාර්යක්ෂම, ආරක්ෂිත, සුවපහසු පොදු ප්‍රවාහන පද්ධති නිර්මාණය කිරීම.
12. සංචාරක ව්‍යාපාර ආශ්‍රිත සියලූ නිෂ්පාදන හා සේවාවන්හි තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන යහපත් පරිචයන් ක්‍රියාවට නැංවීම හා ස්වාභාවික සම්පත් හා වනජීවී සංරක්ෂණය, ජෛව

සහ සංස්කෘතික විවිධත්වය ඉහළ ස්ථානවල පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

13. හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
14. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ හර පද්ධති තුළට SCP ආකල්ප ඇතුළත් කිරීම මඟින් චර්යාත්මක වෙනසක් ඇති කිරීම.
15. තිරසර පරිභෝජනය භාවිතයන් සහිත හරිත පරිසරයක ජීවත් වන නීරෝගී ජාතියක් ගොඩ නැඟීම.

ඉහත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා තනි පුද්ගලයන්, පවුල් ඒකක, සමාජීය හා ආයතනික වශයෙන් තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ හැකි සරල ක්‍රියාමාර්ග හා පාරිසරික ප්‍රතිලාභ කීපයක් පහත දැක්වේ.

ක්‍රියාමාර්ග	ප්‍රතිලාභ
පුනර්ජනනීය බලශක්ති භාවිතය මඟින් පොසිල ඉන්ධන දහනය අවම කිරීම.	කාබන් විමෝචනය අවම කිරීම.
ගෘහස්ථ ශාක වැවීම සහ හරිත අවකාශ පවත්වා ගැනීම.	ගෘහස්ථ වායු දූෂණය අඩු කරයි, සෞන්දර්යය වැඩි දියුණු වී මානසික ආතතිය අඩු වේ.
ජල කාන්දුවන ස්ථාන හැකි ඉක්මනින් පිළිසකර කිරීම, අරපිරිමැස්මෙන් ජලය භාවිතය හා නැවත භාවිතය	ජලය සංරක්ෂණය , ජල බිල අඩු වීම.
වැසි ජලය රැස්කිරීම හා වගාවන් සඳහා බිංදු ජල වහන ක්‍රම වැනි නව තාක්ෂණය උපයෝගී කර ගැනීම.	ජලය නැවත භාවිතය හා ජල සංරක්ෂණය.
සූර්යා ආලෝකය භාවිතය දිරිමත් කිරීම, භාවිතයට නොගන්නා විදුලි උපකරණ විසන්ධි කිරීම,අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම හා LED බල්බ් භාවිතය	විදුලි බිල අඩුවීම. කාබන් පිය සටහන අඩු වීම.
කඩදාසි, ප්ලාස්ටික්, විද්‍යුත් අපද්‍රව්‍ය , කාබනික අපද්‍රව්‍ය දැමීම සඳහා නම්කළ බඳුන් තැබීම.	ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය පහසු වේ.
පානීය අරමුණු සඳහා ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය අවම කිරීම.	ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය අඩු කිරීම මඟින් පරිසරය සුරැකීමට දායක වීම.
ප්ලාස්ටික් ඇසුරුම් සහ බහාලූම් හැකිතාක් අඩු කර රෙදි බෑග්, ලෝහ සහ වීදුරු බහාලූම් වැනි පරිසර හිතකාමී ද්‍රව්‍ය වලින් සාදන ලද බහු භාවිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම. (උදා ඃ- දිවා ආහාර ගෙන ඒම සඳහා මළ නොබැඳෙන තහඩු/වීදුරු භාජන භාවිතය)	දූෂණය අවමකර 3R භාවිතයන් වැඩි දියුණු කරයි. පාරිසරික පියසටහන අඩු කරයි.

විද්‍යුත් අපද්‍රව්‍ය ජනනය අඩු කිරීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා විද්‍යුත් අපද්‍රව්‍ය ලබාදීම.(විද්‍යුත් ආරෝපණ බැටරි)	රසායනික ද්‍රව්‍ය පසට හා ජලය එකතු වීම නිසා සිදුවන රසායනික දූෂණය වැලැක්වීම, සෞඛ්‍යට හිතකර වීම.
ප්‍රතිචක්‍රීකරණය සඳහා භාවිතා කරන ලද කඩදාසි එකතු කිරීම	කඩදාසි සඳහා ගස් කැපීම අඩු කිරීම, ජලය හා බලශක්ති ඉතිරි කිරීම, කසළ ජනනය අඩු කිරීම හා ආර්ථික වාසි.
ප්‍රතිචක්‍රීකරණය/නැවත භාවිතය සඳහා යැවීම සඳහා භාවිතා කළ පැන් එකතු කිරීම	3R සංකල්පය ක්‍රියාවට නැංවීම මඟින් ආර්ථික වාසි, පරිසර සංරක්ෂණය.
තිරසර ප්‍රවාහන ක්‍රම භාවිතය (පා ගමනින්, බයිසිකල් භාවිතය, විද්‍යුත් වාහන e-vehical පොදු ප්‍රවාහනය)	කාබන් පියසටහන අඩු කරයි, සෞඛ්‍යට හිතකරයි.
ආහාර නාස්තිය අවම කිරීම, ඉවත ලන ආහාර සත්ව ආහාර ලෙස භාවිතා කිරීම, කාබනික පොහොර සහ ජීව වායු නිෂ්පාදනය සඳහා උපාය මාර්ග අනුගමනය කිරීම.	සම්පත් නාස්තිය අඩු වීම හා ආහාර සුරක්ෂිතාව
ගෙවතු අපද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම	ජෛවවිවිධත්වය පොහොසත් කිරීම සහ රසායනික පොහොර භාවිතය අඩු කිරීම සඳහා සහාය වීම.
ඩිජිටල් ලේඛන (e-documents) භාවිතය දිරිමත් කිරීම හා මුද්‍රිත පිටපත් වලින් තොර රැස්වීම් පැවැත්වීම	කඩදාසි භාවිතය අඩු කරයි, ක්‍රියාවලීන් සරල කරයි.
ආහාර, ඇඳුම්, පොත් පත් හුවමාරු කර ගැනීම.	සම්පත් බෙදා ගැනීම තුළින් නාස්තිය අවම වීම හා හුවමාරු සංස්කෘතිය මඟින් මානව සම්බන්ධතාවයන් වැඩි දියුණු වේ.
පරිසර හිතකාමී කාර්යාල සැපයුම් මිලදී ගැනීම. (හැකි නම් ප්‍රතිචක්‍රීකරණය කළ කඩදාසි, නැවත පිරවිය හැකි පෑන්, බලශක්ති කාර්යක්ෂම උපකරණ, පරිසර ලේබල් කළ නිෂ්පාදන, නැවත පිරවිය හැකි සනීපාරක්ෂක ද්‍රව භාවිතය, පරිසර හිතකාමී සේවා ආදිය)	හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තියට අනුගත වීම හා තිරසාර වෙළඳපොළවල් සඳහා සහාය වන අතර පාරිසරික බලපෑම අඩු කරයි.

සමාජ ආර්ථික සංවර්ධනය වැදගත් වන්නාසේම ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම, පරිසරය සුරැකීම සහ අප රටට ස්වභාධර්මය දායාද කොට ඇති සම්පත් ඥණාන්විතව භාවිතා කිරීම පමණක් නොව අනාගතය පරපුර සඳහා ඒවා වැඩි දියුණු කිරීමටත් තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති මඟ පෙන්වයි.

තොරතුරු මූලාශ්‍ර ඃ

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
- පරිසර අමාත්‍යාංශය අභ්‍යන්තර සංකල්ප පත්‍රිකාව(01/2025)









Nadeeka Chathurangani Liyanage
Intern
National Aquatic Resources Research and Development Agency

Guardians of the Coast

Sri Lanka's coastal zones are more than just scenic beaches. They are living ecosystems that play a vital role in supporting biodiversity, protecting communities from natural disasters and sustaining the livelihoods of millions of people. These areas provide breeding grounds for fish, shelter for wildlife and natural defenses against storms and erosion.



Figure 1-Beach with mangroves

However, Sri Lanka's coasts face increasing pressures from rapid urban development, pollution and the impacts of climate change. Beaches and mangrove forests are threatened by unplanned construction, waste disposal and rising sea levels. Recognizing the urgent need to protect these valuable ecosystems, the Sri Lankan government has introduced significant reforms in coastal conservation. These reforms aim to balance development with environmental protection, ensuring that coastal resources remain resilient, productive and sustainable for future generations. By strengthening legal frameworks, implementing restoration programs and supporting community engagement, Sri Lanka is taking important steps to safeguard sea shores.

The Legal Backbone of Coastal Conservation

The cornerstone of Sri Lanka's coastal protection is the Coast Conservation and Coastal Resource Management Act, first enacted in 1981 and most recently amended in 2024. This law provides a clear legal framework for surveying coastal zones, preparing detailed management plans and regulating development activities within these areas. It identifies ecologically sensitive regions and establishes a permit system to ensure that all development projects comply with environmental guidelines.

The 2024 amendments strengthened the Act by clarifying the responsibilities of the Coast Conservation Department and improving procedures for monitoring and managing coastal resources. The amendments also reinforce the sustainable use of coastal

ecosystem, ensuring that conservation and development are balanced effectively. The Act provides structured guidance for planning and managing coastal zones to preserve their ecological integrity over the long term.

Complementing this law is the National Environmental Act No. 47 of 1980, which was amended in 2023. This Act requires Environmental Impact Assessments (EIAs) for certain development projects. The 2023 amendments introduced provisions for climate-sensitive EIAs, ensuring that development considers potential impacts on coastal ecosystems and environmental resilience. Together, these laws form a robust legal foundation for coastal conservation, offering clear procedures and standards that help maintain the sustainability and integrity of Sri Lanka's coastal zones.

Community-Led Conservation Initiatives

Beyond legislation, grassroots efforts also play a vital role in coastal protection. University clubs regularly organize beach clean-up campaigns and mangrove restoration projects. These activities help to reduce coastal pollution, restore natural habitats and increase public awareness about the importance of environmental conservation. The continued involvement of young people through these initiatives supports the long-term sustainability of Sri Lanka's coastal ecosystems. Government agencies such as the National Aquatic Resources Research and Development Agency (NARA) have been actively involved in conducting field awareness sessions for school students and local communities. These sessions focus on the significance of mangroves and other coastal ecosystems, fostering a sense of responsibility and stewardship among the younger generation.



Figure 2: Mangrove Restoration Project by UOR

Restoring Mangrove Ecosystems

Mangrove forests play an essential role in Sri Lanka's economy, environment and climate resilience. They protect the coastline from cyclones, floods, sea-level rise and erosion. Their complex root systems hold the soil together and reduce the force of waves, preventing damage to coastal lands and communities.

These ecosystems also provide breeding grounds and shelter for fish, crabs, mollusks and many other aquatic species that are vital to local livelihoods. In addition, mangroves store significant amounts of carbon, helping to reduce the effects of climate

change while maintaining biodiversity and water quality in coastal regions.

Recognizing their importance Sri Lanka launched a large-scale initiative aimed at increasing the country's mangrove cover by more than fifty per cent. In 2024, this national effort was recognized by the United Nations as one of the seven World Restoration Flagships acknowledging Sri Lanka's dedication to protecting and restoring these vital ecosystems.

As a World Restoration Flagship Sri Lanka's mangrove restoration program is now eligible for technical and financial assistance from the United Nations. This support will help the country move closer to achieving its 2030 goal of restoring 10,000 hectares of mangroves. The initiative is expected to benefit around 5,000 households and create over 4,000 new employment opportunities, strengthening the connection between environmental conservation and community development.

As an island nation, Sri Lanka depends on mangroves as its first line of defence against natural disasters. Protecting and restoring these forests is not only an environmental priority but also an investment in the nation's long-term well-being. As stated by Mr.B.K. Prabath Chandrakeerthi, Secretary of the Ministry of Environment of Sri Lanka, *"Investing in restoration is investing in the well-being, societal health, and economic prosperity of Sri Lanka. It is also our contribution to global priorities and our deep understanding of nurtured by living with nature that all living beings not just humans share this wonderful ecosystem."*



Figure 3: Mangroves are special trees that grow in muddy coastal areas and have breathing roots that stick out of the ground to help them survive in salty, waterlogged soil.

From Law to Impact

The 2024 amendments to the Coast Conservation Act reinforce regulations on recreational activities and private encroachments ensuring that development in coastal zones supports both public access and environmental conservation. They also improve how coastal areas are monitored and managed, giving clear guidance for planning development responsibly. By balancing conservation with sustainable development, the amendments help safeguard Sri Lanka's coastal areas for current and future generations.


Beaches belong to all: Coast Conservation Act to be amended to curb private encroachments

Figure 4: The Sunday Times – News

A Call to Action

Protecting Sri Lanka's coasts is not the job of a few but the responsibility of all Small actions like joining beach clean-ups choosing eco-friendly tourism or speaking up for better environmental rules can make a big difference. Together, we can keep our coasts clean, safe and beautiful for future generations.


References:

- Mangrove Regeneration in Sri Lanka recognized as one of seven UN World Restoration Flagships (United Nations in Sri Lanka, February 2024)
- Coast Conservation (Amendment) Act, No. 49 of 2011, Sri Lanka.
- Department of Coast Conservation and Coastal Resource Management (Sri Lanka), Revised Coastal Zone and Coastal Resource Management Plan 2024–2029 [PDF], Sri Lanka, 2024.
- Wijesinghe, D., 2025. 'Beaches belong to all: Coast Conservation Act to be amended to curb private encroachments', Sunday Times (Sri Lanka), 17 August.

ඒ.එම්.එන්.එස්.බී. සමරකෝන්
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ජල සම්පත් මණ්ඩලය
ජේ.ඒ.පී.එන්.ජේ. බණ්ඩාර
පරිසර නිලධාරී - ජල සම්පත් මණ්ඩලය

ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික හා උණුදිය උල්පත් වල වටිනාකම

නිල් ග්‍රහයා ලෙස සැලකෙන අප පෘථිවියේ 70% පමණ ජලයෙන් ආවරණය වී පවතී. එසේ ජලය පැවතියද අපහට පරිභරණය කිරීමට ඇති ජල ප්‍රමාණය 1% කටත් වඩා අඩු ප්‍රමාණයකි. ජලය නොමැතිව ජීවය නොපවතින බව පසක් කරමින් මහා ශිෂ්ඨාචාර බිහිවූයේද ජලය මත පදනම් කර ගෙනය. අප සැම හඳුනන ජලාශ, වැව්, ගංගා, ඇල දොළ හා දිය ඇලි පොලව මතුපිට පවතින මිරිදිය ජල ප්‍රභව වන අතර මුහුදු ආශ්‍රිත කලපු හා විල්ලු කරදිය මතුපිට ජල ප්‍රභව වේ.



රූපය 1 ඃ පෘතුවි පෘෂ්ඨය තුල ජලය පැතිරීම


එලෙස පවතින මතුපිට ජල ප්‍රභවයන්ට අමතරව අප ප්‍රධාන වශයෙන් පොළව අභ්‍යන්තරිකව ගබඩා වී ඇති ජලයද ප්‍රයෝජනයට ගනු ලබන අතර එම ජලය ''භූගත ජල ප්‍රභව''ලෙස හඳුන්වයි. මේ වන විටත් අප විසින් වල ළිං හා නල ළිං භාවිතා කරමින් එම ජලය ඉතා සීග්‍ර ලෙස පරිභෝජනය කරමින් පවතී. මෙලෙස අප පරිහරණය කරනු ලබන භූගත ජලය ජීවයේ යහපැවැත්ම සඳහා නිරතුරුව පුර්ණ දායකත්වයක් සපයයි.

එම භූගත ජලය විටෙක මතුපිටට පැමිණීම සඳහා සොබාදහමේ තවත් එක් අපුරු නිර්මාණයක් වන ''උල්පත'' යොදා ගනී. ජලය පිළිබඳ හඬ නැගීමේදී අවම අවධානයක් යොමුවන මෙම උල්පත්, පරිසර පද්ධතියට නිහඬ සේවයක් සපයා ගලායන ජල ධාරාවන්ගේ පැවැත්ම තහවුරු කරයි.


උල්පත, උල්පොත, දිය උල, බුබුල ලෙසින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල විවිධ නම් වලින් ව්‍යවහාර වන මෙම ස්වභාවික ජල මූලාශ්‍රය පොලව මතු පිටට ගෙන එන්නේ පොළව අභ්‍යන්තරයේ පවතින පැලුම් හා කුහර තුල දීර්ඝ කාලීනව ගබඩා වී ඇති ජලයයි. එනම් උල්පතක් යනු අභ්‍යන්තරික ජලධරයක් පිරියාමක ප්‍රතිඵලයක් ලෙස ගොඩබිම මතුපිටට එම භූගත ජලය ගලා එන ස්ථානයක් වන අතර මෙම උල්පත් වර්ෂා කාලයකදී පමණක් මතුවන දිය උල් වල සිට දිනපතා ගැලූම් මිලියන ගණනක් ගලා යන විශාල තටාක හෙවත් දිය බුබුළු දක්වා වන පරාසයක් තුල විසිර පවතී. එබැවින් ඇළ දොළ ගංගා හා ජලාශ්‍රිත පරිසර පද්ධතීන්ගේ පැවැත්ම රදා පවතින්නේද ඒවා පෝෂණය කරන්නේද මෙම භූගත ජල උල්පත් මගිනි. තවද මෙය පොළව මතුපිටට පිරිසිදු ජලය සපයමින් පවතින ජලධර මත වැඩෙන පීඩනය අවම

කිරීමටද උල්පත් දායකත්වය සපයයි. ජලයේ පිරිසිදු බව උල්පතක වැඩි වන්නේ මෙම භූගත ජලය ස්වභාවිකව ගබඩා වෙමින් මානව අත පෙවීම් වලට තවමත් සැලකිය යුතු ආකාරයෙන් හසු නොවීමක් සිදු නොවන නිසාවෙනි. එනම් ජලධර වල පවතින ජලයට ආගන්තුක ද්‍රව්‍ය එක් රැස් වන්නේ ඉතා අවම මට්ටමකින් බැවිනි.

ජල උල්පත් ඇතිවන ආකාරය පහත පරිදි වේ.



රූපය 2 ඃ උල්පත් ඇතිවන ආකාරයන්



රූපය 3 ඃ ශ්‍රී ලංකාවේ හඳුනාගෙන ඇති උල්පත්

අප රට තුල මේ වන විට 16,000 ක් පමණ උල්පත් ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර විශේෂයෙන් මධ්‍යම කඳුකරය තුල පවතින උල්පත් මගින් වසර පුරාම එහි සිට ගලා බසිනා සියලුම ගංගා පෝෂණය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ උල්පත් සිතියම රූපය 3 මගින් දැක්වේ. එහි තෙත් කලාපය පුරා විසිරි පවතින උල්පත් සමුහයක් හා දිවයිනේ නැගෙනහිර ප්‍රදේශයේ සිට උතුර දක්වා වැඩි වශයෙන් උල්පත් විසිරි ඇති බව දැකගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ උල්පත් පිළිබඳ ඉතිහාසය රාවණා රජ සමය දක්වා දිව යයි. එහිදී රාවණා රජු විසින් ත්‍රිකුණාමලය කින්නියා උල්පත් විවිධ කටයුතු සඳහා

භාවිතා කල බවට ජනප්‍රවාදහි පැවසේ. අනුරාධපුර යුගයේ කුට්ටම් පොකුණ එලෙස පවතින ස්වභාවික උල්පත් භාවිතා කර සිදුකල නිර්මාණ බවට සාධක සොයාගනිමින් පවතී.

විශේෂයෙන් අනුරාධපුර හා පොළොන්නරු යුග වල උල්පත් බහුලව නියං කාල වලදී භාවිතයට ගෙන ඇති බවට පුරාණ ලේඛන තහවුරු කරනු ලබයි. බොහෝ භික්ෂූන් වහන්සේලා වැඩ සිටි ආරාම උල්පත් ආශ්‍රිතව පවතින බවට පුරාවිද්‍යා ඉතිහාසය සනාථ කර ඇත. වළගම්බා රජ සමයේ මාතලේ අළු විහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඩ සිදුකරන ලද අතර එහිදී ඒ අසල පිහිටි ''මඩවල උල්පත'' වියලි කාල වලදී පවා ජලය ලබා දී ඇති බවට විශ්වාස කල හැක. යාපනය අර්ධද්වීපයේ පිහිටි කීරමලේ උල්පත සුවිශේෂී වන්නේ එය මුහුදු ආශ්‍රිතව හුණුගල් කුහරයක් තුල නිර්මාණය වී ඇති උල්පතකි. එම උල්පත පෝෂණය කරනු ලබන්නේ මයෝසින හුණුගල් කුහර තුල ඇති සංතෘප්ත ජලය එම ස්ථාන මගින් මතුපිටට පැමිණීමෙනි. අප රට තුල දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ගනු ලබන ප්‍රධාන උල්පත් වනුයේ උණුදිය උල්පත්ය. ඒවායේ පිහිටීම පහත පරිදි සිතියමේ දක්වා ඇත. එම උල්පත් ජලයේ විශේෂ ලක්ෂණය වන්නේ එහි ද්‍රාව්‍ය ඉහළ සල්ෆර්, කැල්සියම්, සෝඩියම් හා මැග්නීසියම් රසායනයන් නිසා ඇති වන භාෂ්මික බව මෙන්ම තරමක් ඉහල තාප ශක්තියක් පැවතීමයි. මෙලෙස අප රට තුල දැනට හඳුනාගෙන ඇති ප්‍රසිද්ධ උණුදිය උල්පත් ගණන 10 කි. අම්පාර දිස්ත්‍රික්කයේ කපුරැල්ල උණු දිය උල්පත ශ්‍රී ලංකාවේ දැනට සොයාගෙන ඇති ජලයේ උෂ්ණත්වය වැඩිම වූ (65˚C) නොඉදුල් උණුදිය උල්පත වන අතර එය වගුරු බිමක පිහිටා ඇත. වැවක් මධ්‍යයේ වූ දුපතක පිහිටි 63˚C ක උෂ්ණත්වයක් සහිත ජලය ගලා එන්නේ වැලිකන්ද නෙලූම් වැව උණු දිය උල්පත් සමූහයෙනි. මෙය ශ්‍රී ලංකාවේ දෙවනුවට වැඩිම උණුසුම සහිත උණු දිය උල්පත වේ. තවද සුප්‍රසිද්ධ ත්‍රිකුණාමලයේ කින්නියා උණු දිය උල්පත් හා ගෝමරන්කඩවල උණු දිය උල්පත, මුතුගල්වෙල, මහඔය හා පදියතලාවේ මරන්ගල උණු දිය උල්පත,අම්පාර දිස්ත්‍රික්කයේ වහව, කිවුලෙගම උණුදිය උල්පත්, මදුනාගල සහ හම්බන්තොට මහපැලැස්ස උණුදිය උල්පත ශ්‍රී ලංකාවේ උණු දිය උල්පත් ජාලයක් නිර්මාණය කරයි.



රූපය 5 ඃ ශ්‍රී ලංකාවේ උණුදිය උල්පත් වල පිහිටීම



රූපය 6 ඃ අම්පාර දිස්ත්‍රික්කයේ කපුරැල්ල උණුදිය උල්පත

වර්තමානය වන විටද අප රටෙහි වියලි කලාපයේ උල්පත් විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර එම උල්පත් ප්‍රධාන ලෙස පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය සඳහා භාවිතා කරනු ලබයි. මීට අමතරව වන රක්ෂිත තුල පවතින ස්වභාවික උල්පත් සියලූ වන සතුන්ගේ පිපාසය සන්සිඳවීම

හා ජෛව විවිධත්වය පවත්වා ගැනීමට දායකත්වයක් ලබා දෙනු ලබයි. මධ්‍යම කඳු පන්තිය ආශ්‍රිතව මාතලේ, මහනුවර, නුවරඑලිය, රත්නපුර, කෑගල්ල, බදුල්ල, මොනරාගල හා මාතර යන දිස්ත්‍රික්කයන්හි විශාල ලෙස උල්පත් පැතිර පවතින අතර එම උල්පත් සියලු ගංගා වල ජල පෝෂක ප්‍රදේශයන් වේ.



රූපය 7 ඃ සිංහයා උල්පත ,
හොරෝවුපොතානඋණුදිය උල්පත

මෙම උල්පත් පිළිබඳ අපගේ විශේෂ අවධානය යොමු විය යුත්තේ ඒවා මගින් වසර පුරාම ගංගා වලට අඛණ්ඩව ජලය සැපයුම නිසාවෙනි. මේ වන විට බොහොමයක් උල්පත් ප්‍රදේශ වාසීන්ගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා ප්‍රධාන ලෙසම යොදා ගනු ලබන අතර බොහෝ උල්පත් වර්ෂය පුරාම ඒ සඳහා ජලය සපයනු ලබයි. මීට අමතරව එම උල්පත් ආශ්‍රිතව පිහිටා ඇති පොකුණු ඉහල සංචාරක ආකර්ෂණයක් දිනාගෙන ඇති අතර ඇල්ල ප්‍රදේශය ආශ්‍රිතව ගැඹුරු පාෂාණ කුහරයක පිහිටි ''නිල් දිය පොකුණ'' එයට එක් උදාහරණයක් පමණි.

මීට අමතරව ප්‍රධාන ලෙස මෙම උල්පත් නැමට හා අනෙකුත් අවශ්‍යතා සඳහා බහුලව





රූපය 7 ඃ නිල් දිය පොකුණ - අඹදණ්ඩෙගම

භාවිතා කරනු ලබයි. එවැනි එක් උදාහරණයක් වන්නේ දුටුගැමුණු රජතුමා විසින් භාවිතා කරන ලද උල්පත කොත්මලේ ප්‍රදේශයේ අදටත් දක්නට ලැබීමයි (රණමුනේ පීල්ල).

අප රටෙහි පානීය ජල බෝතල් කර්මාන්තය ආරම්භ වනුයේ කදුකර ජල උල්පත් ප්‍රධාන ජල ප්‍රභවය ලෙස භාවිතා කරමිනි. ඒ අනුව විවිධ නාමයන්ගේ උල්පත් (springs) අද වන විටද භාවිතා කරනු ලබයි. ශ්‍රී ලංකාවේ බීර නිෂ්පාදන කර්මාන්ත ශාලාව නුවරඑලිය ප්‍රදේශයේ පිහිටා තිබු අතර ඒ සඳහා භාවිතා කරන ලද්දේද උල්පත් ජලයයි. එබැවින් උල්පත් ජීව විවිධත්වය පවත්වා ගැනීමට මෙන්ම අද වන විට වාණිජ වටිනාකමින්ද යුක්ත වේ. අනාගතයේදී ස්වභාවික පිරිසිදු ජලය අපනයනය කිරීමේදී මෙම උල්පත් ජලය ප්‍රධාන ලෙස භාවිතයට ගත හැක.

එවැනි අපට නොපෙනෙන විශාල වටිනාකමක් සහිත උල්පත් මේ වන විට විවිධ හේතූන් මත ක්‍රමයෙන් ක්ෂය වෙමින් පවතී. එයට ප්‍රධානතම හේතුව වන්නේ එම උල්පත් වලට පෝෂණය ලබා දෙන ජල පෝෂක ප්‍රදේශ වල සිදුවන බලපෑමයි. එබැවින් වර්තමානය වන විට අප සතු

විශාලතම අභියෝගය වන්නේ ඒවා තව දුරටත් මතු පරපුර උදෙසා ආරක්ෂා කර ගනිමින් භාවිතා කිරීමයි. ඒ සඳහා සියලූම දෙනා එකතුව කටයුතු කිරීම ඉතා දැඩි අවශ්‍යතාවයක්ව පවතී.

ඒ සඳහා වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා වර්තමානයේ පරිසර අමාත්‍යාංශය යටතේ පවතින ජල සම්පත් මණ්ඩලය අනෙකුත් ආයතන හා එක්ව පුළුල් වැඩපිළිවෙලක් සකස් කර ඇත. එහිදී පළමුව අප මෙරට පවතින සියලූම උල්පත් හඳුනාගැනීම හා සිතියම්ගත කිරීම කරන අතර එමගින් සියලූ දෙනාටම පරිහරණය කල හැකි දත්ත පද්ධතියක් සැකසීමට හැකිවන අතර ඒ සඳහා සියලූ දෙනාට දායක වීමටද අවස්තාව උදා වේ.

මෙහිදී සියලූ ගංගා පෝෂණය වන මධ්‍යම කඳුකරය කෙරෙහි මේ වන විට විශේෂ අවධානයක් යොමුකර ඇති අතර මෙම වර්ෂයේදී නව රජයේ ප්‍රතිපාදන අනුව ප්‍රධාන ගංගා ද්‍රෝණි හතක් පෝෂණය වනු ලබන බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති උල්පත් හා එහි ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමේ වැඩසටහන දැනටමත් ක්‍රියාත්මකවේ.

එහිදී , දිස්ත්‍රික්කය පුරා විසිර පවතින ජල උල්පත් හා ඒවායේ ජල පෝෂක ප්‍රදේශයන් හඳුනා ගැනීම, ඒවායේ භූජල විද්‍යාත්මක හා පාරිසරික දත්ත එක්රැස් කිරීම, ජල සාම්පල ලබා ගැනීම මගින් ඒවා ජීව රසායනික විශ්ලේෂණ සිදු කිරීම හා ඒ ඒ උල්පත් ජල මූලාශ්‍ර ලෙස සංරක්ෂණය කිරීම මගින් ඒවායේ තිරසාර භාවිතය සඳහා කළමනාකරණ සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙලෙස ආරම්භ කර ඇති වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම මගින් අපගේ ජල සම්පත මතු පරපුර සඳහා සුරක්ෂිත කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

K.M.S.Perera
Development Officer
Coast Conservation & Coastal Resource Management Department

Sri Lanka's Coastal Zone: Balancing Access, Development and Protection



Sri Lanka, a tropical island nation situated in the Indian Ocean lies between 5° 55' and 9° 51' North latitude and 79° 42' and 81° 53' East longitude. Covering an area of approximately 67,240 square kilometers, it boasts a diverse geography that includes coastal plains, mountains, forests, and river systems. The island's coastline stretches over 1,700 kilometers, encompassing a variety of coastal features such as sandy beaches, rocky shores. estuaries, and cliffs, In addition to the coastline, Sri Lanka is home to around 1,338 kilometers of lagoon peripheries, which are shallow, brackish water bodies separated from the open sea by barrier islands or reefs.

Defining the Coastal Zone

"Coastal Zone" means that area lying within a limit of three hundred meters landwards of the Mean High Water line and a limit of two kilometers seawards of the Mean Low Water line and in the case of rivers , streams, lagoons or any other body of water connected to the sea either permanently or periodically , the landward boundary shall extend to a limit of two kilometers measured perpendicular to the straight base line drawn between the natural entrance points thereof and shall include the waters of such rivers, streams, and lagoons or any other body of water so connected to the sea , and shall also include the area lying within a further extended limit of one hundred meters inland from the zero Mean Sea Level (MSL) along the periphery (CC&CZMP,2024).



Figure 1- Coastal Zone Map of Sri Lanka

Why It Matters

The coastal zone plays a vital role in Sri Lanka's social, economic, and urban development. Approximately one-third of the country's population lives in this area, which includes key landmarks such as Colombo and other coastal cities, major ports, fishery harbors, and popular tourist destinations. The coastal zone supports a wide range of commercial activities and livelihoods. However, this region is also vulnerable to natural processes like erosion and accretion caused by the southwest and northwest monsoons, making its sustainable management critical.



Figure 2. Beach Access (Source: CC&CRMD)

Pressures on Public Coastal Access

In the past, public access to beaches was unrestricted. However, over the last three decades, development has led to restricted access due to:

- Expansion of fishing and harbor facilities
- Growth in tourism infrastructure and aquaculture
- Construction of coastal protection structures
- Private residential developments

These developments often include fences, gates, walls, and other barriers, leading to:

- User conflicts and disputes
- Complaints made to the Coast Conservation and Coastal Resource Management Department (CC&CRMD)



Figure 3. Beach Access (Source: CC&CRMD))

Most of these activities created some form of access restriction **"to"** and **"along"** the beach by way of fences, gates, parapet walls and boulder walls. This has generated numerous complaints made of the CC&CRMD on user conflicts and disputes over public access or over user rights in the coastal zones. Since the ownership of the foreshore, beach and the coastal waters is vested with the state, it is the responsibility of the government

to ensure public access to and along the beach. Such ownership places the burden of an economic responsibility on the state. In view of the above, conducting a survey on public access to coastal areas in order to formulate a coastal access program is both, important and timely where coastal zone management is concerned.

Legal Mandates for Access

According to the the Coast Conservation and Coastal Resource Management Act No 57 of 1981 beach of Sri Lanka is a public property and anyone has right to access it freely. In order to ensure this right the Coast Conservation (Amendment) Act no 49 of 2011 has assigned the responsibility to the Coast Conservation and Coastal Resource Management Department.



Figure 4. Report on Beach Access Inventory and Mapping in Jaffna District (Source: CC&CRMD)

The act says ***"A survey which would identify all the routes, paths and corridors which provide access to the public to the beach and the routes, paths and corridors which provide access to the Coastal Zone. Based on the findings of the survey shall prepare a comprehensive report which should be submitted to the Coast Conservation Advisory Council".***

CC&CRMD was tasked with:

- Conducting nationwide surveys to identify beach access routes, paths, and corridors
- Recording physical conditions and user categories
- Mapping access points with coordinates
- Submitting findings to the Coast Conservation Advisory Council

This inventory now forms the foundation for future coastal planning.



Figure 5. Beach Access Atlas. (Source: CC&CRMD)

Towards a Beach Access Master Plan

The inventory includes the names and locations of beach access with an

existing user category. These accesses are listed with present physical conditions and prepared maps with their coordinates for future decision-making purposes. In addition it outlines the general coastal beach access issues and recommendations to address them with demands for access. The beach access inventory provides important background information for future actions to manage beach access.

The current information indicated the necessity of preparing a "Beach Access Master Plan". This plan should serve as a guideline to promote, develop, and expand the beach access based on potential demand and future expansion of existing activities in the region. This Master Plan, which will serve as the Beach Access Guideline, provides the framework for guiding future actions to manage beach access.

Key Recommendations

- Manage user conflicts depending on the characteristics of a site and the density of users. Future management of specific sites becomes more important as use and types of activities increase.

- Managing parking area for visitors should be considered to accommodate the future demands generated by both tourists, recreational and residents



Figure 6: Reports on Beach Access Inventory and Mapping in different districts (Source CC&CRMD)

S.A.Mahaarachchi
Deputy Director (Planning & Monitoring)
Coast Conservation &Coastal Resource Management Department

Project on Development of Coastal Leisure Parks within the Coastline under "Clean Sri Lanka" Programme

Sri Lanka has a coastline of 1620 km length along the 14 coastal districts with abundant natural resources such as lagoons, rivers, estuaries, bays, sand dunes, mangroves, sea grace meadows, sandy beaches and rocky shores, coral reefs, saltmarshes, tidal flats which are important habitats which increases the value of biodiversity and ecosystem services. Coastal areas are essential to Sri Lanka's economic development, accounting for the highest concentration of population more than 15% of total population. and economic activities such as fisheries and tourism have concentrated to the coastal zone With the above values of coastal resources they are threatened by the human activities which shall be controlled for the future generations by implementing development of potential coastal areas as the Coastal Leisure Parks in sustainable manner.

With that concept in mind Department of Coast Conservation (CC) and Coastal Resources Management (CRMD) has commenced a project on Development of Coastal Leisure Parks within the coastline. The project will be implemented by CC and CRMD and funded under the **Clean Sri Lanka Programme** conducted by Presidential Secretariat.

Improving the status of the coastal environment developing and managing the narrow coastal belt without illegal structures, creating the beautiful and clean coastal belt improving the living standards of coastal communities and coastal resource users and promoting and facilitating the economic development based upon coastal resources are the main objectives of the project.

Under the provisions of the Coast Conservation and Coastal Resource Management Act No 57 of 1981 CC and CRMD plans to take initiatives for developing potential tourist attracting locations around the Island as the coastal picnic areas by enhancing the cleanliness of the coastal areas and improving the basic recreational facilities. They include mini parks, viewpoints, walkways, resting areas, woody loans, bathing points, surfing points, etc. or a combination of any number of them. These developed sites will be maintained in a responsible and sustainable manner by the land owners themselves or the selected willful organizations under the supervision and monitoring of CC and CRMD. A proper maintenance agreement will be signed between the selected maintenance agency and CC and CRMD for at least two years.

There are 87 number of coastal sites in the 13 by all 14 coastal districts around

the Island are selected to be improved as the Coastal Leisure Parks merging with the concept of the Clean Sri Lanka Program (See Table 1). Lands within the Coastal Zone are either belongs to the private owners or the government agencies. Only the government owned lands were selected for developing as the coastal parks under "Clean Sri Lanka" Program in year 2025. Therefore, the land ownership of each site must be confirmed and the written consent of the respective government agencies will be obtained ensuring the public access and the public use of the proposed sites.

Table 01. Identified coastal sites selected to be improved as the Coastal Leisure Parks around the Island

Province/s	District/s	DS Division/s	No. of sites
Northern	Mullaitivu, Jaffna, Kilinochchi	Maritimepattu, Valikamam North, Point Pedro, Vali South West Sandilipay, Maruthankerny, Poonkary	15
Eastern	Trincomalee, Batticaloa, Ampara	Muttur, Kuchchaveli, Kinniya, Trincomalee, Kattankudy, Eravurpattu-Chenkalady, Manmunai North, Koraleipattu North, Koraleipattu-Valachchenai, Sainthamarudu, Alayadivembu, Lahugala, Pottuvil, Kalmunai-North, Kalmunai, Nindavur	32
Southern	Hambantota, Matara, Galle	Ambalantota, Hambantota, Tangalle, Dickwella, Devinuwara, Matara, Weligama, Habaraduwa, Galle Four Gravets,Rathgama, Hikkaduwa, Madampagama,Ambalangoda, Balapitiya,Bentota	30
Western	Kalutara, Colombo, Gampaha	Panadura, Kaluthara, Beruwala, Dehiwala, Thimbirigasyaya, Moratuwa, Negombo	08
North Western	Puttalam	Kalpitiya	02
Total no. of sites			**87**

Total cost estimate of the project is LKR 95.5 (In here present Million-rupee value is better) for the year 2025 and the project will be extended up to next year considering the bulkiness of it. Public Private Partnership (PPP) model is proposed for development of the sites when possible with the high demand of the investors.



Figure 1: Map of the Locations of the proposed Coastal Leisure Parks, Source: CC&CRMD

To date, 45 sites have been initiated. Initial site clearing has been completed at 15 sites. Phase 1 (cleaning work) has been completed and Phase 2 (beautification work) is currently in progress at the Mahamodara and Koggala sites. Two sites, Wellamadama and Kudawella, commenced work in the first week of August and are now ongoing. Designs and estimates have been completed for another 34 sites, which are now in the procurement stage. Seven sites are currently in the design stage. A total expenditure of Rs. 0.15 million has been incurred.



Figure 2: Wellamadama, Matara Site, Source: CC&CRMD



Figure 3: Mahamodara Galle, Source: CC&CRMD



Figure 4: Koggala Galle, Source: CC&CRMD

නීතීඥ හිමාලි ගමගේ
සංවර්ධන නිළධාරී-ජෛවවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වය සංරක්ෂණය සඳහා පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් සම්පාදනය කළ ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා මාර්ගෝපදේශ

ශ්‍රී ලංකාවේ දැකිය හැකි ජෛව සම්පත් මිනිසුන්ගේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා ඉතා වැදගත් නමුත්, අවාසනාවකට මෙන් මෙම සම්පත් වලට ඇති තර්ජන ද ක්‍රමයෙන් ඉහළ යමින් බොහෝ ආවේණික ශාක හා සත්ත්ව විශේෂ තර්ජනයට ලක්ව ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහාත්, ජෛව හායනය වළක්වා ගැනීම සඳහාත්, එක්සත් ජාතීන්ගේ ජෛවවිවිධත්වය පිළිබඳ සම්මුතිය වර්ෂ 1994 අපරානුමත කරමින් ජාත්‍යන්තර ප්‍රජාව හා සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට එක්ව ඇත.

වර්ෂ 1994 සිට පරිසර අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ ජෛවවිවිධත්වය පිළිබඳ සම්මුතියේ (Convention on Biological Diversity) ජාතික කේන්ද්‍රස්ථානය ලෙසත්, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය එහි මෙහෙයුම් කේන්ද්‍රස්ථානය ලෙසත් ක්‍රියා කරනු ලැබේ. ජෛවවිවිධත්වය පිළිබඳව වඩාත් පුළුල්ව අවධානය යොමු වූ ප්‍රධාන අන්තර්ජාතික සම්මුතිය ලෙසද මෙම සම්මුතිය හැඳින්විය හැක. එහි ප්‍රධාන අරමුණු වන්නේ ජෛවවිවිධත්ව සංරක්ෂණය, එහි සංරචක තිරසර ලෙස භාවිතයට යොදා ගැනීම සහ ජානමය සම්පත් භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ සහ යුක්ති සහගත ලෙස බෙදා හැරීම වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වයට සම්බන්ධ වන විෂය පථයන්ට අදාළව පහත සඳහන් පාරිසරික ප්‍රතිපත්ති සඳහා පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන ඇත. තවද, එම ප්‍රතිපත්තීන්හි තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම් ද සකස් කර ඇත.

1. ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2005
2. ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම - 2016 ජුනි
3. ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය - 2020 ජනවාරි
4. ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග - 2020 ඔක්තෝබර්
5. ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2020 දෙසැම්බර්

ජෛව සුරක්ෂිතතාවය

ජෛව තාක්ෂණයේ දියුණුව තුළින් බිහි කරන ලද ජාන විකරණය කරන ලද ජීවීන් අනාරක්ෂිත ලෙස පරිසරයට මුදාහැරීම ජෛවවිවිධත්වයට තර්ජනයක් ලෙස හඳුනා ගෙන ඇත.

ඒ අනුව, ජාන විකරණය කරන ලද ජීවීන් මඟින් මානව සෞඛ්‍යයට, ජෛවවිවිධත්ව සංරක්ෂණයට හා තිරසර භාවිතයට ඇති විය හැකි අයහපත් බලපෑම අවම කර ගැනීම හා එකී අවදානමට සාර්ථකව මුහුණ දීමට ප්‍රමාණවත් ආරක්ෂාවක් සහතික කර ගැනීම අරමුණු කරගනිමින් ජෛවවිවිධත්ව සම්මුතියෙහි පාර්ශ්ව රාජ්‍යයන් එක්වී 2000 ජනවාරි 29 දින ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ ''කාර්ටිජිනා සන්ධානය'' පිහිටුවා ගන්නා ලදී. ශ්‍රී ලංකාව ජෛව සුරක්ෂිතතාව පිළිබඳ කාර්ටිජිනා සන්ධානයට 2000 මැයි මස 24 දින අත්සන් තබන ලද අතර 2004 අප්‍රේල් මස 28 දින එය අපරානුමැතිය කරනු ලැබීය. මෙම සන්ධානයේ ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ද පරිසර අමාත්‍යාංශය ක්‍රියා කරයි.

ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2005



වර්තමාන හා අනාගත පරම්පරාවේ අභිවෘද්ධිය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් තුළ නවීන ජෛව තාක්ෂණය සුරක්ෂිත ලෙස උපයෝගී කරගැනීම සඳහා ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂාවක් සහතික කිරීමේ අරමුණින් ජෛව සුරක්ෂිතතාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය සඳහා 2005 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඇත.

මෙම ප්‍රතිපත්තියේ අරමුණු වන්නේ ප්‍රජා සෞඛ්‍යයට, පරිසරයට හා ජෛවවිවිධත්වයට සිදුවන අයහපත් බලපෑම් වළක්වා ගැනීම, දේශීයව නිපදවන යම් ජාන විකරණය කල ජීවීන්/එම ආහාර පෝෂක හා සකස් කල නිපැයුම් නියාමනය හා කළමනාකරණය, නවීන ජෛව තාක්ෂණ ක්‍රමෝපායන් ආරක්ෂාකාරී ලෙස යොදා ගැනීම හා අදාළ අනතුරු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, ජෛව සුරක්ෂිතතාවය හා ආචාර ධර්ම සුරක්ෂා කරමින් ජෛව තාක්ෂණය සංවර්ධනය සඳහා යොදා ගැනීම වේ.

මේ වනවිට ජෛව සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් පවත්නා නීති විශ්ලේෂණය කරමින් එහි අඩුපාඩු මගහරවා ගැනීම සඳහා ජෛව සුරක්ෂිතතා පනතක් කෙටුම්පත් කර ඇත. තවද, මෙම විෂය සම්බන්ධයෙන් තාක්ෂණික මට්ටමේ තීරණ ගැනීමට ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික කමිටුවක් ද පරිසර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත.

ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species)

ජෛවවිවිධත්වයට ප්‍රබල තර්ජනයක් ලෙස ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ ව්‍යාප්ත වීම හේතු වන බව මේ වන විට හඳුනා ගෙන ඇත. මෙම ජීවී විශේෂ කෘෂිකාර්මික අංශය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන අතර, රටේ ආර්ථික දියුණුව සහ මානව සංවර්ධනය කෙරෙහි ද ඍණාත්මක බලපෑම් ඇති කරයි. විධිමත් අධ්‍යයනයකින් තොරව කෘෂිකාර්මික බෝග, විසිතුරු පැළෑටි හා විසිතුරු මත්ස්‍යයින් රට තුළට ආනයනය කිරීම, අන්තර්ජාතික වෙළඳාම, සංචාරක හා ගමනාගමන සේවා ආදී සාධක පසුගිය දශක ගණනාවක් පුරාවට ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ විශාල ලෙස මෙරට ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇත. මෙම ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ ව්‍යාප්ත වීම හේතුවෙන් දේශීය ශාක හා සත්ව විශේෂ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති අතර, එබැවින් විශාල පාරිසරික අර්බුදයකට මුහුණපෑමට ශ්‍රී ලංකාවට සිදුවී ඇත.

ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම - 2016 ජුනි



ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂයන්ගෙන් තොර ශ්‍රී ලංකාවක් යන දැක්ම සහිතව ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ (Invasive Alien Species) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර, ඒ සඳහා 2016 වසරේ ජුනි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඇත.

මෙම විශේෂ වලින් ජෛවවිවිධත්වයට, පරිසර පද්ධති වලට, ආර්ථිකයට හා සමාජයට ඇති කරන අවදානම අවම කිරීම තුළින් තිරසර ආර්ථික සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම, මේ සම්බන්ධ ගැටළු වලදී ජාතික ස්ථාවරය හා ප්‍රමුඛතා සම්බන්ධව සියළුම පාර්ශව යාවත්කාලීන කිරීම හා දැනුම්වත් කිරීම සහ දීප ව්‍යාප්ත මෙහෙයුම් හරහා මෙම ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ පාලනය කිරීමේ ගෝලීය ප්‍රයත්නයන්ට දායක වීම මෙම ප්‍රතිපත්තියේ පරමාර්ථයන් වේ.

කඩොලාන පරිසර පද්ධති

කඩොලාන ප්‍රධාන ලෙස සත්‍ය කඩොලාන හා කඩොලාන ආශ්‍රිත ශාක ලෙස වර්ග දෙකකින් හා ඒ ආශ්‍රිත සත්ව ප්‍රජාවකින්ද යුක්ත වන අතර, පාරිසරික සේවාවන් රාශියක් ඉටුකරන, සමාජ*ආර්ථික සංවර්ධනයට අතිශය වැදගත් වෙරළබඩ පරිසර පද්ධතියකි. සාගර සහ ගොඩබිම් පරිසර පද්ධති අතර සම්බන්ධය ඇති කරමින් කඩොලාන පරිසර පද්ධතිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම සබැඳිය මගින් කඩොලාන වාසස්ථානවලට පමණක් නොව, මුහුදු තෘණ බිම්, ලවණ වගුරු සහ කොරල්පර වැනි අනෙකුත් නීල කාබන් සහ වෙරළාසන්න පරිසර පද්ධතිවලටද ස්ථාවරත්වය ලබා දෙයි.

එයට අමතරව, කඩොලාන පරිසර පද්ධතිය දේශගුණ විපර්යාසවල හානිය අවම කරන කාබන් අවශෝෂකයක් වශයෙන්ද වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. තවද, කඩොලාන පරිසර පද්ධතිය ධීවර කර්මාන්තයට හා පාරිසරික සංචරණයට කදිම තෝතැන්නකි. මෙලෙස කඩොලාන වලින් ලැබෙන ප්‍රතිලාභ බොහොමයක් තිබියදීත්, දේශගුණික විපර්යාස සහ මානව ක්‍රියාකාරකම් ඇතුළු විවිධ සාධක නිසා මෙම අද්විතීය පරිසර පද්ධතියට දැඩි තර්ජනයක් වර්තමානයේ සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය - 2020



සෘජු හා වක්‍ර සේවාවන් අඛණ්ඩව සපයන ජෛවවිවිධත්වයෙන් අනූන සුවදායක කඩොලාන පරිසර පද්ධතියක් යන දැක්ම සහිතව ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2020 වසරේ ජනවාරි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

මෙහි ප්‍රධාන අභිමතාර්ථ ලෙස කඩොලාන පරිසර පද්ධති සුරක්ෂිත කිරීම මගින් මානව හා පාරිසරික යහපැවැත්ම තහවුරු කිරීම, ප්‍රතිපත්ති, නීති, සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීමේදී කඩොලාන සම්බන්ධයෙන් ද සැලකිලිමත් වී ඒවාට වන බලපෑම් අවම කර ගනිමින් කාර්යක්ෂම සම්පත් භාවිතය ඇතුළත්වේ. තවද, රාජ්‍ය ආයතන, විද්වතුන්, ප්‍රදේශවාසීන්, ආයෝජකයින් සහ සංවර්ධන හවුල්කරුවන් එක්ව බහුපාර්ශවීය සහයෝගයෙන් අනාගත පරපුරට ද කඩොලාන පරිසර පද්ධති වෙත ප්‍රවේශ වීමට හා ඒ පිළිබඳව දැනුවත් වීමට අවස්ථාව සැලසීම ද බලාපොරොත්තු වේ. ප්‍රතිපත්ති ප්‍රකාශ 19 කින් සමන්විත මෙහි කඩොලාන පරිසර පද්ධති ''අසම'' වටිනාකම් සහිත සම්පතක් ලෙස පිළිගැනීම තහවුරු කර තිබීම මෙහි ඉතාම වැදගත් පියවරක් ලෙස දැක්විය හැකිය.



ශ්‍රී ලංකාවේ කඩොලාන සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා වූ ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (2022-2026)

කඩොලාන ප්‍රතිපත්තියේ තිරසර බව පවත්වා ගැනීම සඳහා, මෙම ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශ්වකාර ආයතන සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වෙත හඳුන්වා දී ඇත. මෙමඟින් කඩොලාන පරිසර පද්ධති සම්බන්ධයෙන් අදාළ වන්නාවූ ගැටළු අවධාරණය කර ඇති අතර, ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දක්වා ඇත. මෙමඟින් සෑම ආයතනයක්ම මෙම ක්‍රියාකාරකම් ඔවුන්ගේ වාර්ෂික සැලසුම් වලට ඇතුළත් කර, ඒ අනුව ආයෝජනය කිරීමට සියලුම ආයතන වලින් ඉල්ලීම් කර ඇත. තවද, මෙම ක්‍රියාකාරී සැලැස්ම මගින් ආයෝජකයන්ට හා අනෙකුත් පරිත්‍යාගශීලීන්ට අදාළ ආයතනයන් සමඟ සම්බන්ධ වෙමින් කඩොලාන ප්‍රතිපත්ති අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා එක්වන ලෙස ආරාධනා කර ඇත.

දැනට පවතින කඩොලාන භූමි සංරක්ෂණය කිරීම හා ඉස්සන් වගාව සහ ලූණු ලේවායන් වැනි කටයුතු සඳහා භාවිතා කර අත්හැර ඇති රජයට අයත් කඩොලාන ඉඩම් පුනරුත්ථාපනය කිරීම මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය

මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2019 අගෝස්තු මස 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එමඟින්, ජලජීවී වගාවන් හා ලූණු ලේවායන් වැනි කාර්යයන් සඳහා රජය මගින් බදු ගිවිසුම් යටතේ ලබාදී ඇති ඉඩම් වලින් අවම වශයෙන් වසරක කාලයක් අදාළ කාර්යය සඳහා යොදා නොගෙන අත්හැර දමා ඇති ඉඩම් සඳහා ලබාදී තිබූ බදු ගිවිසුම් තවදුරටත් දීර්ඝ නොකර, එම ඉඩම් කඩොලාන වනාන්තර ප්‍රතිෂ්ඨාපනය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදීමට පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා ඉඩම් කොමසාරිස් ජනරාල්ට නියෝග කිරීමටත් කටයුතු කිරීම කඩොලාන සංරක්ෂණය සම්බන්ධයෙන් ගෙන ඇති ඉතාම වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණයකි.



ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය සඳහා වූ ජාතික මාර්ගෝපදේශයන්

කඩොලාන පරිසර පද්ධති සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශයන් සැපයීම සඳහා ස්ථාපිත කරන ලද කඩොලාන පරිසර

පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ විද්වත් කමිටුවේ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය සඳහා වූ ජාතික මාර්ගෝපදේශයන් ද, 2022 වසර වන විට සකස් කර අවසන් කර ඇත. මෙය කඩොලාන භූමි විද්‍යාත්මක ප්‍රතිෂ්ඨාපනය මඟින් කඩොලාන වනාන්තර ආවරණය වැඩි කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ප්‍රධාන ප්‍රකාශනයකි.

2018 වසරේ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතරද කඩොලාන ප්‍රතිෂ්ඨාපනයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකාවට වටිනා අවස්ථාවක් උදා විය . එලෙස ශ්‍රී ලංකාව කඩොලාන ප්‍රතිෂ්ඨාපනයේ ප්‍රමුඛයා ලෙස ක්‍රියා කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති කඩොලාන පුනරුත්ථාපනය සම්බන්ධ කාර්ය බලකාය 2019 වසරේ පිහිටුවන ලද අතර, 2022 වසර වන විට එහි වපසරිය නීල කාබන් පරිසර පද්ධති සංරක්ෂණය දක්වා ව්‍යාප්තව ඇත.

ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග - 2020 ඔක්තෝබර්



ශ්‍රී ලංකාව පාර්ශ්වකාර රාජ්‍යයක් වූ ජෛවවිවිධත්ව සම්මුතියේ 8 (ජේ) වගන්තියෙන් පාරම්පරික ජනතාවගේ ජීවන රටාව පෝෂණය කිරීම සඳහා හා පාරම්පරික දැනුම සංරක්ෂණය කර භාවිත කිරීම සඳහා පාර්ශවකාර රාජ්‍යයන් බැඳී සිටිය යුතු බව සඳහන් වේ. මෙම ප්‍රතිපත්තිය සැකසීමේදී මේ පිළිබඳව අවධානය යොමු කර ඇත. එසේම, පාරම්පරික දැනුමට අදාළ වෙනත් අන්තර්ජාතික සම්මුතීන් හා සන්ධාන සඳහා ද, ඉදිරියේ දී අදාළ විෂය හා සම්බන්ධව ඇති වන සන්ධාන සඳහා ද මෙය ප්‍රතිපාදන සපයයි.

ඒ අනුව, පරිසර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති පාරම්පරික දැනුම පිළිබඳ ජාතික විද්වත් කමිටුවේ මූලිකත්වයෙන්, අදාළ පාර්ශ්වකාර ආයතන හා මෙම විෂයය පිළිබඳ විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද සාකච්ඡා සහ වැඩමුළු ගණනාවකින් පසුව ජෛවවිවිධත්වය හා බැඳුනු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කල අතර, ඒ සඳහා 2020 වසරේ ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ප්‍රධාන අරමුණු 7ක් මූලික කරගනිමින් සම්පාදනය කර ඇති මෙම ප්‍රතිපත්තිය, මූලධර්ම 8කින් සහ ප්‍රතිපත්ති ප්‍රකාශ 7 කින් සමන්විත වේ. මෙහිදී පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් සංරක්ෂණය, භාවිතය, හුවමාරුව සහ අනෙක් ක්‍රියාකාරකම් සඳහා හඳුනාගත් උපායමාර්ග 8ක් යටතේ මූලික ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත.

මෙම ප්‍රතිපත්තිය මඟින්, පාරම්පරික දැනුම සංචිතව පවතින ස්ථාන හා ප්‍රදේශ හඳුනාගැනීම, රැස්කිරීම, සංරක්ෂණය හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතය මඟින් ගොඩනැගෙන ප්‍රතිලාභ සමාන හා සාධාරණ ආකාරයට බෙදීයාමට සැලැස්වීම, පාරම්පරික දැනුමෙහි උපයෝගීතාව පිළිබඳ සමාජ ආර්ථික හා පාරිසරික වටිනාකම හඳුනාගැනීම ඇතුළු තවත් විශේෂිත අරමුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර ඇත.

ඒ අනුව, වර්තමාන හා අනාගත පරම්පරාවල ප්‍රයෝජනය සඳහා පුළුල් ජනතා

සහභාගීත්වයක් ඇතිව පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් සංරක්ෂණය කිරීම හා දේශීය ජනතාවගේ ජීවන තත්ත්වය එමගින් නගා සිටුවීම උදෙසා හා ශ්‍රී ලංකාව දැනුම් කේන්ද්‍රයක් බවට පත්කිරීමේ අරමුණ කෙරෙහි රජයෙහි කැපවීම, පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය මඟින් තහවුරු කෙරේ.

ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2020 දෙසැම්බර්

ශ්‍රී ලංකාව සිය ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමට සහ ජෛව සොරකම හා ජෛව මංකොල්ලය වැළැක්වීමට ක්‍රියාමාර්ග යොදා ඇති නමුදු එබඳු අපහරණයන් තවමත් අඛණ්ඩව සිදු වේ. මෙම තත්ත්වයන් වැළැක්වීම සඳහා මෙම ජාතික ප්‍රතිපත්තිය සකස් කර ඇති අතර, 2020 වසරේ දෙසැම්බර් මස මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

මෙම ප්‍රතිපත්තිය මඟින් ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය සහ ඒවාට අදාළ ජාන, රසායනික ලක්ෂණ සහ පාරම්පරික දැනුම භාවිතය නියාමනය කරයි. ඒ අතර වාණිජ කටයුතු, පර්යේෂණ, රට තුළ සහ රටින් පිට භාවිතය, ඒවාගෙන් නිපදවන නිෂ්පාදන සහ ඉදිරියට සිදුකරන පර්යේෂණද මෙම නීති යටතේ පාලනය කරනු ලබයි.

ශ්‍රී ලංකාවට තම රටේ ජෛව සම්පත් මත සම්පූර්ණ අයිතිය නැතහොත් පරමාධිපත්‍ය තිබේ. ඒවා භාවිතා කිරීම, සංරක්ෂණය සහ තිරසර ලෙස යොදාගැනීම ජාතික නීති පද්ධතියට යටත්ව පාලනය කෙරේ. එම නිසා විදේශීය පර්යේෂකයන් හෝ ආයතන කිසිවකට අවසර සහ නියමිත නීති පිළිනොපැද මෙම සම්පත් භාවිතා කළ නොහැක. මේ මඟින් බුද්ධිමය දේපල අයිතිය තහවුරු කිරීම, ජෛව සම්පත් අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්විය හැකි අතර, ඒවා අනාගත පරපුර සඳහා සුරක්ෂිතව තබා ගැනීමට ද හැකියාව ඇත.



මීට අමතරව, ජෛවීය ද්‍රව්‍යයන්හි ජානමය හෝ ජෛව-රසායනික ලක්ෂණ හෝ තොරතුරුමය අගය සඳහා ඒවා වෙත ප්‍රවේශය පතන කවර තැනැත්තෙක් වුවද, ශ්‍රී ලංකා රජය විසින් ඇතිකර තිබෙන හා මෙම ප්‍රතිපත්තිය යටතේ ආවරණය කරනු ලබන ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳ ක්‍රමවේදය පිළිපැදිය යුතුය. ජෛව ද්‍රව්‍ය භාවිතා කරමින් උත්පාදන හෝ වාණිජ වටිනාකම් ඇති කළහොත්, ඒවායෙන් ලැබෙන ආර්ථික හා විද්‍යාත්මක ප්‍රතිලාභ සාධාරණව ශ්‍රී ලංකාවට හා දේශීය ජනතාවට බෙදාගත හැකිය. මෙයින් ජාන මංකොල්ලය වැළැක්විය හැක.

තවද, ජාන සම්පත් භාවිතයද ඇතුළුව ශ්‍රී ලංකාවේ ජෛවීය ද්‍රව්‍ය සංරක්ෂණය හා තිරසර භාවිතය ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුමේ හා පිළිවෙත්වල වටිනාකම හා වැදගත්කම හඳුනාගෙන, ඒවා සුරක්ෂිත කිරීමට කටයුතු කෙරෙනු ඇත. මෙමඟින් ග්‍රාමීය හෝ ආදිවාසී සමාජවල තිබෙන පැරණි දැනුම (උදාඃ- ඖෂධීය වටිනාකමක් ඇති පැළෑටි භාවිතය) විදේශීය ආයතන විසින් අවභාවිතා කිරීම වැළැක්වීමට නීතිමය ආරක්ෂාවක් සලසා ගැනේ.

මේ අනුව, ශ්‍රී ලංකාව සිය ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය ලබාදීමෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදාහදා ගැනීම කෙරෙහි ඇපකැපව සිටින අතර, ජෛවීය ද්‍රව්‍යවල ප්‍රයෝජන අයුතු ලෙස ලබාගැනීම් වලදී ජාතික හා ජාත්‍යන්තර නීති හා ගිවිසුම් හරහා කටයුතු කිරීමේ අයිතිය ශ්‍රී ලංකාව සතුය. ජෛව සම්පත් හෝ සාම්ප්‍රදායික දැනුම අයුතු ලෙස භාවිතා කිරීම හඳුනාගත් විට, ශ්‍රී ලංකාවට ජාතික නීති සහ ජාත්‍යන්තර ගිවිසුම් යටතේ නීතිමය මාර්ගගතව එයට එරෙහිව කටයුතු කිරීමට හැක.

ඒ අනුව, මෙම ප්‍රතිපත්තිය ජාන මංකොල්ලය වැළැක්වීමට නීතිමය පදනමක්, සම්පත් ආරක්ෂණ ක්‍රමවේදයක්, සහ ප්‍රතිලාභ නියමිත ලෙස බෙදාගැනීමේ යාන්ත්‍රණයක් සලසයි.

ශ්‍රී ලංකාව ජෛවවිවිධත්වයෙන් අනූන රටවල් අතුරින් ප්‍රමුඛස්ථානයෙහිලා පවතින රටක් වන අතර, ඉහත සඳහන් ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම තුළින් අප රටෙහි පවත්නා ස්වභාවික පරිසර පද්ධති සහ මෙරටට ආවේණික ශාක හා සත්ව විශේෂ වර්තමාන හා අනාගත පරම්පරාවන්හි සුභ සිද්ධිය උදෙසා සංරක්ෂණය කිරීම සහ එහි වැදගත්කම සමාජගත කිරීම අප හැමගේ වගකීමක් සහ යුතුකමකි.

MHF. Nuskiya1, Fareena Ruzaik2
Department of Geography, South Eastern University of Sri Lanka
Department of Geography, University of Colombo, Sri Lanka

Environmental Law and Legislation in Sri Lanka: Challenges and Future Directions

1. Introduction

Environmental law has become a cornerstone of modern governance, linking ecological protection with sustainable socio-economic development. In Sri Lanka, its importance is underscored by the island's exceptional biodiversity, fragile ecosystems, and reliance on natural resources such as agriculture, fisheries, tourism, and industry. As Weeramantry (1997) noted, environmental protection cannot be treated as peripheral but must form part of the constitutional and moral obligations of both the State and citizens. The roots of environmental regulation can be traced to colonial statutes such as the Forest Ordinance of 1907 which regulated forest exploitation and the Fauna and Flora Protection Ordinance of 1937 which provided for the protection of wildlife and laid the basis for national parks and sanctuaries. However comprehensive regulation only emerged with the National Environmental Act No. 47 of 1980 later amended by Acts No. 56 of 1988 and No. 53 of 2000 which established the Central Environmental Authority (CEA) as the apex institution. The CEA is tasked with policy formulation pollution control licensing of prescribed industries through Environmental Protection Licenses (EPLs) and overseeing Environmental Impact Assessments (EIAs) for major projects (Central Environmental Authority [CEA], 2019). At the constitutional level Sri Lanka guarantee an explicit right to a healthy environment yet Article 27(14) requires the State to protect and improve the environment, while Article 28(f) obliges citizens to conserve nature (Constitution of Sri Lanka, 1978). Though not directly enforceable these provisions have been judicially expanded, most notably in Bulankulama Secretary Ministry of Industrial Development (2000) where the Supreme Court invoked the public trust doctrine embedding environmental protection as a constitutional concern.

Sri Lanka's judiciary has been pivotal in advancing environmental principles despite the absence of an explicit constitutional right to a healthy environment. In the landmark Bulankulama Secretary Ministry of Industrial Development (2000) or Eppawela case the Supreme Court halted a phosphate mining project invoking the public trust doctrine and sustainable development to affirm the State's duty to safeguard resources for present and future generations. Similarly in Environmental Foundation Ltd. Urban Development Authority (1998) the Court stressed the need for rigorous environmental assessments before development approvals. These cases demonstrate how judicial activism has embedded global principles into domestic jurisprudence. Complementing this Sri Lanka has ratified over 40 multilateral environmental agreements (MEAs) including the

Convention on Biological Diversity (CBD) the UN Framework Convention on Climate Change (UNFCCC) and Paris Agreement and the Basel Convention on Hazardous Wastes all of which shape national policies on biodiversity conservation climate resilience, and pollution control (Gunawardena, 2015; Ministry of Environment 2016) Institutions such as the Biodiversity Secretariat coordinate compliance with these obligations illustrating how international commitments and judicial innovation together strengthen Sri Lanka's environmental governance framework.

International principles such as the precautionary principle the polluter pays principle and intergenerational equity have shaped Sri Lanka's environmental governance through judicial interpretation and administrative practice (Sands & Peel, 2018). The country operates within a dual framework of domestic statutes and international treaty commitments; however, enforcement is hindered by weak institutional capacity overlapping agency mandates political interference and limited public participation (Jayasundara, 2021). Persistent pressures from urbanisation deforestation and climate-related disasters further strain legal mechanisms Although sustainable development is widely endorsed its application is inconsistent often allowing economic growth to override ecological safeguards-a tension particularly evident in large-scale infrastructure projects (Redclift, 2005).

2. International Environmental Legal Framework and Sri Lanka's Obligations

Environmental issues such as climate change biodiversity loss desertification and transboundary pollution transcend national boundaries necessitating collective global action. The international legal framework for environmental protection provides states with principles norms and treaties to address these shared challenges. Sri Lanka as a developing island nation with high ecological vulnerability has played an active role in ratifying and implementing key international environmental agreements. These obligations have shaped both the content and direction of its domestic environmental law and policy.

2.1 Global Milestones in International Environmental Law

A series of pivotal global milestones have marked the development of international environmental law. The 1972 Stockholm Conference on the Human Environment was the first global event to recognise environmental protection as a fundamental component of development. The resulting Stockholm Declaration emphasised that states bear the sovereign right to exploit their natural resources but also the responsibility to ensure that activities within their jurisdiction do not cause environmental damage to other states (Kiss & Shelton, 2007). The 1992 Rio Earth Summit further consolidated the field by producing the Rio Declaration on Environment and Development the Agenda 21 action plan and

legally binding treaties such as the Convention on Biological Diversity (CBD) and the United Nations Framework Convention on Climate Change (UNFCCC). Principle 15 of the Rio Declaration also codified the precautionary principle which has since guided national environmental decisions including in Sri Lanka (Sands & Peel, 2018). The Paris Agreement (2015) under the UNFCCC has been the most recent milestone committing states to limit global warming to below 2°C while pursuing efforts to limit the increase to 1.5°C For island nations such as Sri Lanka which are particularly vulnerable to sea level rise extreme weather and climate-related disasters, the Paris Agreement carries existential significance (Bodansky, Brunnée, & Rajamani, 2017).

2.2 Sri Lanka's Participation in Multilateral Environmental Agreements

Sri Lanka has ratified more than 40 multilateral environmental agreements (MEAs) reflecting a strong commitment to international environmental cooperation and governance (Gunawardena, 2015). Among the most significant is the Convention on Biological Diversity (CBD, 1992), ratified in 1994 which obliges the country to conserve biodiversity promote sustainable use and ensure fair sharing of genetic resources with implementation coordinated by the Biodiversity Secretariat under the Ministry of Environment (Ministry of Environment, 2016). Under the United Nations Framework Convention on Climate Change (UNFCCC, 1992) and the Paris Agreement (2015) Sri Lanka submitted its Nationally Determined Contributions (NDCs) in 2016 committing to emission reductions in energy transport and industry while enhancing adaptation in agriculture water management and coastal sectors (Ministry of Environment, 2021). The country is also party to the Basel Convention (1989) ratified in 1992 which regulates hazardous waste movements notably, in 2019 Sri Lanka invoked its provisions to re-export containers of illegally imported waste back to the United Kingdom (Bandara, 2001). Through the Montreal Protocol (1987), Sri Lanka successfully phased out ozone-depleting substances such as chlorofluorocarbons (CFCs) achieving targets ahead of schedule and earning international recognition (UNEP, 2016). Furthermore, as a signatory to the Ramsar Convention on Wetlands (1971), Sri Lanka has designated six Ramsar sites underscoring its obligation to protect wetlands vital for biodiversity conservation and local livelihoods Collectively these commitments illustrate Sri Lanka's recognition of the critical role international cooperation plays in strengthening domestic environmental governance and achieving sustainability objectives.

2.3 Influence on Domestic Law and Policy

Sri Lanka's participation in MEAs has significantly influenced its domestic legal framework. For example, the Fauna and Flora Protection Ordinance (amended in 2009) incorporated obligations under the CBD by expanding protected areas and strengthening penalties for wildlife offences. Similarly, the National Climate Change Policy (2012) and

the establishment of the Climate Change Secretariat were direct outcomes of UNFCCC obligations Judicial decisions also reflect international norms. In the Eppawela case (2000) the Supreme Court referred to the Stockholm and Rio Declarations in its reasoning embedding global principles such as intergenerational equity into Sri Lankan jurisprudence Likewise courts have relied on the precautionary principle derived from international law in reviewing development projects. The international environmental legal framework has profoundly shaped Sri Lanka's approach to environmental governance. By ratifying and implementing key treaties such as the CBD UNFCCC Basel Convention and Ramsar Convention Sri Lanka has demonstrated a commitment to global norms These obligations have not only influenced legislation and policy but have also empowered courts to interpret constitutional duties more expansively. However, the gap between ratification and implementation remains wide underscoring the need for stronger institutions political will and community engagement. For Sri Lanka, where environmental integrity is inseparable from economic well-being and cultural heritage fulfilling its international environmental obligations is both a legal responsibility and a moral imperative.

3. National Environmental Legislation and Policy in Sri Lanka

Sri Lanka has developed one of South Asia's most comprehensive environmental legal frameworks anchored in constitutional directives the National Environmental Act (NEA) sector-specific statutes and policy initiatives While the 1978 Constitution does not guarantee a right to a healthy environment Articles 27(14) and 28(f) impose duties on the State and citizens which the Supreme Court has reinforced through judicial activism notably in Bulankulama Secretary, Ministry of Industrial Development (2000) where the public trust doctrine was applied (Constitution of Sri Lanka, 1978) The NEA (1980 as amended) remains the central legislation empowering the Central Environmental Authority (CEA) with tools such as Environmental Protection Licensing (EPL) Environmental Impact Assessments (EIA), and pollution control standards though enforcement faces political and institutional challenges (Gunawardena, 2015 Jayasundara 2019) Complementary laws such as the Fauna and Flora Protection Ordinance Forest Ordinance and Coast Conservation Act provide sectoral safeguards while institutions like the CEA DWC Forest Department and MEPA manage ecosystems with limited coordination Policy frameworks including the National Environmental Policy (2003) and Climate Change Policy (2012), aim to align environmental protection with development but implementation gaps persist (Redclift, 2005).

4. Challenges in the Implementation of Environmental Laws in Sri Lanka

While Sri Lanka has a relatively comprehensive set of environmental laws policies and judicial interventions their effective implementation remains a persistent challenge. The country's environmental governance faces structural institutional socio-

economic and political barriers that limit the enforcement of statutory provisions and undermine sustainable development objectives Understanding these challenges is crucial for identifying strategies to strengthen environmental protection in Sri Lanka.

Table 1: Key Challenges in Implementing Environmental Laws in Sri Lanka

Category	Key Issues	Evidence	References
Institutional Challenges	• Fragmented institutional framework with overlapping mandates. • Limited technical/ financial capacity of agencies. • Poor inter-agency coordination.	• Overlaps between CEA, DWC, Forest Dept., CCD, and MEPA. • Delays in coastal project approvals. • Insufficient staff and monitoring for EPLs/EIAs.	Gunawardena (2015); Jayasundara (2020)
Legal & Regulatory Challenges	• Outdated statutes are not aligned with modern issues (climate change, plastic pollution). • Conflicting/overlapping laws (e.g., forestry vs. land use). • Weak enforcement of penalties; low deterrence.	• NEA penalties rarely deter violators. • Ambiguities exploited by private developers.	(Jayawardane, 2019)
Socio-Economic Challenges	• Development vs. conservation dilemma. • Poverty and dependence on natural resources.	• Urbanisation, ports, and tourism projects prioritised. • Small farmers and fishermen engaged in unsustainable practices due to a lack of alternatives.	Redclift (2005); Gunawardena (2015)

Political & Governance Challenges	• Political interference in approvals (EPLs, EIAs). • Corruption and lack of transparency. • Weak public consultation processes.	• Superficial EIAs. • Commercial interests override regulations.	(Jayawardane, 2019)
Judicial & Awareness Challenges	• Heavy reliance on PIL; marginalised groups lack access. • Low public awareness of rights and processes.	• Limited knowledge of EIA/ public complaint mechanisms. • Violations often go unchallenged.	(Dissanayake, 2022)
Emerging Environmental Challenges	• Climate change impacts (floods, droughts, coastal erosion). • Biodiversity loss (habitat fragmentation, invasive species). • Pollution and waste management issues.	• Inadequate adaptation measures. • Deforestation despite the Fauna & Flora Protection Ordinance. • Solid waste and marine pollution.	Ministry of Environment (2021); Gunawardena (2015)

5. Recommendations and Future Directions for Environmental Governance in Sri Lanka

Sri Lanka's environmental governance framework, though comprehensive, requires strengthening to address persistent implementation gaps and emerging ecological challenges Priority areas include enhancing institutional capacity by increasing technical resources training officers on climate change and biodiversity improving inter-agency coordination, and establishing a centralised environmental data system (Gunawardena 2015; Jayasundara, 2019) Legal reforms are also essential with updates to outdated statutes harmonisation of overlapping laws and stricter penalties to reinforce the polluter pays principle while integrating international principles such as precaution and intergenerational equity (Dissanayake, 2022; Sands & Peel, 2018). Expanding public participation through mandatory consultations in Environmental Impact Assessments (EIAs) environmental education and legal aid for public interest litigation (PIL) can empower communities

to act as environmental stewards (Dissanayake, 2022). Judicial mechanisms should be strengthened by establishing specialised environmental courts and encouraging reliance on scientific evidence in rulings (Boyle, 2021). Moreover aligning domestic laws with multilateral environmental agreements like the UNFCCC and CBD and leveraging climate finance such as the Green Climate Fund, will improve international compliance and resource mobilisation (Ministry of Environment, 2021). Finally promoting sustainable development through renewable energy resilient agriculture circular economy practices and the use of technologies such as GIS remote sensing and pollution monitoring can enhance enforcement and long-term resilience (Redclift, 2005). Collectively, these measures can ensure that Sri Lanka not only strengthens its environmental governance but also safeguards biodiversity and ecosystem services for future generations.

References

- Bandara, J. S., Chisholm, A., Ekanayake, A., & Jayasuriya, S. (2001). Environmental cost of soil erosion in Sri Lanka: tax/subsidy policy options. Environmental Modelling & Software, 16(6), 497-508.
- Bodansky, D., Brunnée, J., & Rajamani, L. (2017). International climate change law. Oxford University Press.
- Constitution of Sri Lanka. (1978). Government of Sri Lanka.
- Jayasundara, J. (2019). Environmental governance in Sri Lanka: Legal frameworks and institutional challenges. Sri Lanka Journal of Environmental Law, 6(2), 45–62.
- Jayasundera, W. A. (2021). Effectiveness of administrative reforms on public service delivery in Sri Lanka (Doctoral dissertation, Doctoral dissertation, Faculty of Business & Media, Selinus University).
- Kiss, A., & Shelton, D. (2007). Guide to international environmental law. Brill.
- Redclift, M. (2005). Sustainable development (1987–2005): an oxymoron comes of age. Sustainable development, 13(4), 212-227.
- Sands, P., & Peel, J. (2012). Principles of international environmental law. Cambridge University Press.
- Seethawaka, D. (2023). Restoring the ecosystems affected by climate change: An analysis of the legislative framework on the protection of ecosystems in Sri Lanka. Sri Lanka J. Int'l L., 29, 81.
- Weeramantry, C. G. (1997). Constitutional and institutional developments: the function of the International Court of Justice in the development of international law. LJIL, 10, 308.

ආචාර්ය එන් . එම් . ලක්මිණී රාධිකා
සහකාර අධ්‍යක්ෂ - පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය
මධ්‍යම පරිසර අධිකාරිය

ප්ලාස්ටික් නිෂ්පාදනය හා පරිභෝජනයට අදාළ රෙගුලාසි, පනත් සහ ප්‍රතිපත්ති

ප්ලාස්ටික් යනු පෙට්‍රෝලියම් වලින් ව්‍යුත්පන්න වූ කාබනික බහු අවයවිකයකි. ස්වභාවිකව සොයාගත නොහැකි බැවින් ප්ලාස්ටික් කෘතිම ද්‍රව්‍යයක් ලෙස සැලකේ. බෙල්ජියම් රසායන විද්‍යාඥයෙකු වන Leo Baekeland 1907 දී කෘතිම ප්ලාස්ටික් නිපදවීමට පුරෝගාමී විය. ඉහළ පාරිභෝගික ඉල්ලුම සහ භාවිතය අනුව 1950 දශකයේ සිට මේ දක්වා ප්ලාස්ටික් නිෂ්පාදනය වර්ධනය වෙමින් පවතී. මිනිසුන්ගේ පරිභෝජනවාදී ජීවන රටාවේ ප්‍රතිඵලයක් ලෙස, පරිසරයට අහිතකර ලෙස බැහැර කරන ප්ලාස්ටික් ප්‍රමාණය වැඩි වෙමින් පවතින අතර එය සැලකිය යුතු පාරිසරික,සමාජීය සහ ආර්ථික ගැටළු ඇති කරයි.

අපි භාවිතා කරන ඉලෙක්ට්‍රොනික උපකරණ,ඇඳුම් පැළඳුම්,ගෘහ භාණ්ඩ සහ ආහාර ඇසුරුම් බොහොමයක ප්ලාස්ටික් උපාංග භාවිතා වේ. මෑත දශක කිහිපය තුළ කඩදාසි, වීදුරු සහ කපු ඇතුළු අයිතමවල භාවිතා වන බොහෝ ස්වාභාවික ද්‍රව්‍ය වෙනුවට ප්ලාස්ටික් ආදේශ කර ඇත. ප්ලාස්ටික් සඳහා හඳුනාගෙන ඇති පුළුල් පරාසයක භාවිතයන් සහ යෙදීම් සැලකිල්ලට ගෙන, මහා පරිමාණයෙන් සිදුකරන ලද ප්ලාස්ටික් නිෂ්පාදනයේ ප්‍රතිඵලයක් ලෙස පරිසරයට සැලකිය යුතු ආකාරයේ හානි සිදුවී ඇත. ප්ලාස්ටික් කළමනාකරණය තිරසාර ලෙස සිදු නොකිරීම නිසා පරිසරයට සිදුවන හානියෙහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසුන්ට බොහෝ සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇත.

වර්තමානයේදී ගෝලීය වශයෙන් පොලිතීන් සහ ප්ලාස්ටික් භාවිතයේ විශාල වැඩිවීමක් දක්නට ලැබේ. ලොව පුරා ඇසුරුම් සහ බෑග් නිෂ්පාදනය සඳහා පොලිඑතිලීන් සහ ප්ලාස්ටික් බහුලව භාවිතා වේ. තනි භාවිත ප්ලාස්ටික් සහ ජෛව හායනයට ලක් නොවන බහු අවයවක වැනි සමහර නව නිපැයුම් අතිශයින්ම පරිභෝජනයට පහසුවන නමුත් ඒවායේ වේගවත් භාවිතය හෝ නිෂ්පාදනය හේතුවෙන්, පොලිතීන් සහ ප්ලාස්ටික් තිරසාර නොවන ආකාරයට භාවිතා කිරීම හේතුවෙන් පරිසර පද්ධතියේ ජෛව හා අජීවී සංරචක කෙරෙහි සෘජු හා වක්‍ර ආකාරයේ සෘණාත්මක බලපෑම් උද්ගත වී තිබේ.

ගෝලීය වශයෙන්, තනි භාවිත ප්ලාස්ටික් සහ පොලිතීන් බෑග් ඇතුළු අනෙකුත් ප්ලාස්ටික් ද්‍රව්‍ය ප්‍රධාන පාරිසරික ගැටලුවක් බවට පත්වෙමින් තිබේ. පොලිතීන් බෑග් වැනි තනි භාවිත ප්ලාස්ටික් භාවිතය පරිසරයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. සංඛ්‍යාලේඛන පෙන්වා දෙන ආකාරයට වර්ෂ 2050 වන විට සාගරයට සැලකිය යුතු පොලිතීන් ප්‍රමාණයක් ඇතුළු වන බව පුරෝකථනය කර ඇත. ඒ වන විට ජලයේ මත්ස්‍ය විශේෂවලට වඩා පොලිතීන් වැඩි වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස නූතන ලෝකයේ මිනිසුන් තම දෛනික කාර්යයන් සරල කරන සහ පහසු කරන නවෝත්පාදන සොයා ගැනීමට පෙළඹී සිටිති. තනි භාවිත ප්ලාස්ටික් යනු ඉවත දැමීමට පෙර එක් වරක් පමණක් භාවිතා කරන ප්ලාස්ටික් නවෝත්පාදන

වේ. අනෙකුත් අයිතම හා සසඳන විට එහි පිරිවැය, අනුවර්තනයවීමේ හැකියාව සහ ආරක්ෂාව හේතුවෙන් මෙම වර්ගයේ ප්ලාස්ටික් ඇසුරුම් පහසු භාවිතය සඳහා හොඳම විකල්පය ලෙස තෝරා ගැනීම නිසා ඒවායේ නිෂ්පාදනය හෝ භාවිතය ඉක්මනින් වැඩි වී ඇත.



රූපය 1 ඃ සාගරයේ ඇති ප්ලාස්ටික්
(අන්තර්ජාල මූලාශ්‍රය - https.//www.nextias.com/blog/plastic-pollution/)

ප්ලාස්ටික් සහ පොලිතීන් වෙනුවට විකල්ප රාශියක් හඳුන්වා දී ඇතත්, ජෛව හායනයට ලක් නොවන පොලිතීන් වෙනුවට ජෛව හායනයට ලක්විය හැකි ද්‍රව්‍ය වලින් සාදන ලද නව නිෂ්පාදන සඳහා අවශ්‍ය තරම් ප්‍රජා පිළිගැනීමක් තවමත් නොමැත. එබැවින් අනාගත පරම්පරාවන්ට සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඇතැම් ප්ලාස්ටික් වර්ග භාවිතය තහනම් කිරීමට හෝ සීමා කිරීමට නීතිමය රාමුවක අවශ්‍යතාවය මතු වී ඇත.

ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් තහනම් කිරීමට හෝ සීමා කිරීමට අදාළ නීතිමය රාමුව

ඉහත සඳහන් කරුණු සලකා බැලීමෙන් පසු පහත දක්වා ඇති අති විශේෂ ගැසට් නිවේදන නිකුත් කිරීමෙන් ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් පරිභෝජනය තහනම් කිරීමට හෝ සීමා කිරීමට ශ්‍රී ලංකා රජය පියවර ගෙන ඇත.

(1). අංක1466/5 - 2006 ඔක්තෝම්බර් 10 වැනි අඟහරුවාදා - 2006.10.10 අති විශේෂ ගැසට් පත්‍රය.

1980 අංක 47 ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව 2007 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි,

i. ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිෂ්පාදිතයක් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම.
ii. ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතින් හෝ ඕනෑම පොලිතීන් නිෂ්පාදනයක් විකිණීම හෝ භාවිතා කිරීම, තහනම් කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන ආණ්ඩුකම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, පහත දක්වා ඇති අංක 2034/33, අංක 2034/34 සහ අංක 2034/35 දරන අති විශේෂ ගැසට් නිවේදන නිකුත් කිරීමෙන් ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් පරිභෝජනය තහනම් කිරීමට / සීමා කිරීමට ශ්‍රී ලංකා රජය පියවර ගෙන ඇත.

(2). අංක 2034/33 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය.

i. ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතීන් හෝ යම් පොලිතීන් නිශ්පාදිතයක් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම.
ii. ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතින් හෝ යම් පොලිතීන් නිෂ්පාදන රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය තහනම් කර ඇත.

(උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ලැමිනේට්කිරීම සඳහා ගැසට් පත්‍රයේ දක්වා ඇති අවසරලත් ද්‍රව්‍ය භාවිතයන් සහ වෛද්‍ය විද්‍යාත්මක හෝ ඖෂධමය කාර්ය සඳහා වෙනත් යම් සුදුසු විකල්ප නොමැති අවස්ථාවලදී භාවිතය හැර)

අංක 2034/33 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා නිකුත් කැන ලද මෙම අති විශේෂ ගැසට් පත්‍රයෙන් 2006 ඔක්තෝබර් 10 වැනි දින නිකුත් කරන ලද අංක 1466/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළමු නියමය යටතේ සිදුකරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි පරිච්ඡින්න කර ඇත.

(3). අංක 2034/34 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය.

i. දේශීය භාවිතය සඳහා පොලිතින් අමුද්‍රව්‍යයක් වන ආහාර දවටන නිපදවීම, සහ
ii. පොලිතින් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිශ්පාදිත ආහාර දවටන රට තුළ විකණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබාදීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කරනු ලැබ ඇත.

''ආහාර දවටන'' යන්නෙන් ලන්ච් ෂීට් අදහස් වේ.

''පොලිතින්'' යන්නට වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන්, අඩු ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන් සහ පොලිප්‍රොපිලීන් ද ඇතුළත් වේ.

(4). අංක 2034/35 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය.

i. දේශීය භාවිතය සඳහා වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන් අමද්‍රව්‍යයක් වන යම් මලූ නිෂ්පාදනය,
ii. (දිග මිමි 600, පළල මිමි 260, උස මිමි 900 පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන්

නිෂ්පාදිත කසළ බහාලූම් මලූ හැර) සහ

iii. වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන් අමුද්‍රව්‍යයක් වන යම් මලූ නිෂ්පාදනය රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබාදීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කරනු ලැබ ඇත.
(දිග මිමි 400, උස මිමි 500 පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන් නිෂ්පාදිත රෙදිපිළි බහාලූම් මලූ හැර)

(5). අංක2034/36 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 23 එ සහ 23 ඒ යටතේ

i. මෙම නියෝග 2017 අංක 1 දරන ජාතික පාරිසරික නියෝග ලෙස හඳුන්වනු ලැබේ.
ii. (ප්ලාස්ටික් අඩංගු කසළ සහ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම)
iii. කිසිදු තැනැත්තෙකු ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩදීම හෝ අවසර දීම සිදු නොකළ යුතු ය.
iv. ඉහත නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ වරදකට වරදකරු වන අතර 31 වැනි වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතු ය.

(6). අංක 2034/37 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, මෙම අති විශේෂ ගැසට් පත්‍රය මගින් සියලූම ආකාරයේ පොලිඑතිලීන්, පොලිප්‍රොපිලීන්, පොලිඑතිලීන් නිෂ්පාදන හෝ පොලිප්‍රොපිලීන් නිෂ්පාදන, දේශපාලන, සමාජයීය, ආගමික, ජාතික, සංස්කෘතික හෝ වෙනත් යම් උත්සව හෝ අවස්ථාවලදී සැරසිළි සඳහා භාවිතය තහනම් කර ඇත.

(7). අංක 2034/38 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01 අති විශේෂ ගැසට් පත්‍රය

මෙම අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව,

i. දේශීය භාවිතය සඳහා ප්‍රසාදිත පොලිස්ටයරින්වලින් ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප හා හැඳි නිෂ්පාදනය, සහ
ii. ප්‍රසාදිත පොලිස්ටයරින් වලින් නිෂ්පාදිත ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප සහ

හැදි රට තුළ විකිුණම සඳහා අර්පණය, නොමිලේ ලබාදීම ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කර ඇත.

''ආහාර ඇසුරුම් පෙට්ටි'' යන්නෙන් ආහාර බහාලන පෙට්ටිය (lunch boxes) අදහස් වේ.

(8). අංක 2211/50 - 2021 ජනවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.21 අති විශේෂ ගැසට් පත්‍රය.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 32 වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව නිකුත් කරන ලද මෙම ගැසට් නිවේදනය අනුව නිෂ්පාදිත යම් ප්ලාස්ටික් අයිතමයක් එහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ප්‍රමිතීන්ට අනුකූලව පැහැදිලිව සලකුණු කරනු ලැබිය යුතු වේ.

(PETහෝ PETE, HDPE හෝ PE-HD, PVCහෝ V, LDPE හෝ PE-LD, PP, PS, OTHER හෝ O ලෙස)

(9). අංක 2211/51 - 2021 ජනවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.21 අති විශේෂ ගැසට් පත්‍රය.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 ද (1) (අ) වගන්තිය යටතේ ගරු පරිසර අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව,

(අ) යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා පාවිච්චි කරනු ලබන කෘෂි රසායන ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා පොලිඑතිලීන් ටෙරප්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය සහ

(ආ) යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා මෙහි නිශ්චිතව දක්වා ඇති යම් ප්ලාස්ටික්

අයිතමඃ-

i. ශුද්ධ පරිමාව මි. ලී20 ට / ශුද්ධ බර ග්‍රෑම් 20 ට සමාන හෝ ඊට අඩු සැෂේ, (Sachet) (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිතා කිරීම හැර)
ii. සුළංවලින් පිරවිය හැකි සෙල්ලම්බඩු (බැලූන්, බෝල, දිය මත පාවෙන / පිහිනුම් තටාකවල දී භාවිතා කරන සෙල්ලම්බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැරඃ
iii. ප්ලාස්ටික්කුර (Stem) සහිත කොට්න් බඩ්ස් (Cotton buds) (වෛද්‍ය / සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් හැර) පාවිච්චි කිරීම තහනම් කරනු ලැබ ඇත.

ප්ලාස්ටික් සහ තනි භාවිත ප්ලාස්ටික් උපකරණ පරිසරයට සහ මිනිස් සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරන බව පිළිගෙන ඇතත්, අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සඳහා ඇතැම් පුද්ගලයින් තවමත් තම ප්ලාස්ටික් පරිභෝජන පුරුදු වෙනස් කර නොමැත. විවිධ නීති මගින් ඒවායේ භාවිතය සීමා කිරීමට රජය දරන උත්සාහයන් නොතකා, ඇතැම් කර්මාන්තවලට ප්ලාස්ටික් සහ පොලිතින් අවශ්‍ය වීම හේතුවෙන් විවිධ ගැටළු උද්ගත වී තිබේ.

ලොව පුරා තනි-භාවිත ප්ලාස්ටික් තහනම් කිරීමේ ප්‍රවණතාවය

වැඩිවන ප්ලාස්ටික් දූෂණය මැඩ පැවැත්වීම සඳහා ගෝලීය සම්මුතියක් පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීමට සූදානම් වන එක්සත් ජාතීන්ගේ සංවිධානය සතු දත්තයන් අනුව පුද්ගලයින් සිව් දෙනෙකුගෙන් තිදෙනෙකු හැකි ඉක්මනින් තනි භාවිත ප්ලාස්ටික් නීති විරෝධී කිරීමට කැමති වූ බව පැවසේ. රටවල් 28 ක පුද්ගලයින් 20,000 කට අධික සංඛ්‍යාවක් යොදාගෙන කරන ලද සමීක්ෂණයකට අනුව, ප්ලාස්ටික් තහනමට සහාය දක්වන පුද්ගලයින් සංඛ්‍යාව 2019 දී 71% සිට 82% දක්වා ඉහළ ගොස් ඇති අතර, අඩු ප්ලාස්ටික් ඇසුරුම් සහිත නිෂ්පාදන වලට කැමති බව පවසන පුද්ගලයින් සංඛ්‍යාව 75% සිට 82% දක්වා ඉහළ ගොස් තිබේ.ලොව අනෙකුත් රටවල ද ප්ලාස්ටික් දූෂණයට විසඳුමක් සෙවීම සඳහා පහත සඳහන් ආකාරයට මැදිහත්වීම් සිදුකර ඇත.

- කැලිෆෝනියාව 2014 දී තනි-භාවිත ප්ලාස්ටික් බෑග් තහනම් කළ පළමු ප්‍රාන්තය බවට පත් වූ අතර 2018 දී එය ප්ලාස්ටික් බීමබට අර්ධ වශයෙන් තහනම් කළ පළමු ප්‍රාන්තය බවට ද පත්විය.
- සැහැල්ලු ප්ලාස්ටික් බෑග් 2002 දී සම්පූර්ණයෙන්ම තහනම් කළ පළමු රට බවට බංග්ලාදේශ රජය පත්විය. මෙය සිදු වූයේ ප්ලාස්ටික් බෑග් අපද්‍රව්‍ය හේතුවෙන් රටෙන් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් ජලයෙන් යටවී දැඩි ගංවතුර හානියකට පත්වීමෙන් පසුවය.
- 2015 දී එක්සත් ජනපදයේ රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ පුද්ගලික සත්කාර අයිතම සඳහා ප්ලාස්ටික් ක්ෂුද්‍ර පබළු (මයික්‍රෝබීඩ්) භාවිතය තහනම් කරන ලදී. එක්සත් රාජධානිය, කැනඩාව, තායිවානය සහ නවසීලන්තය වැනි තවත් රටවල් ගණනාවක් ද සේදුම් ආලේපන සඳහා ක්ෂද්‍ර පබළු භාවිතය තහනම් කර ඇත.
- ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ප්ලාස්ටික් බෑග් අලෙවිය තහනම් කර ඇත.
- මෙක්සිකෝ නගරය ද සිය ප්ලාස්ටික් බෑග් තහනම දියත් කර ඇත.
- තායිලන්තය තනි-භාවිත ප්ලාස්ටික් තහනම් කිරීමේ තීරණය අනුව ප්‍රධාන වෙළඳසැල්වලින් නිකුත් කරන එක්වරක් පමණක් භාවිතයට ගන්නා ප්ලාස්ටික් මලු නිකුත් කිරීම තහනම් කර ඇත.
- යුරෝපා සංගමය විසින් 2018 දී ස්ටයිරෝෆෝම් සහ තනි-භාවිත ප්ලාස්ටික් බීමබට ඇතුළු ඉවත දැමිය හැකි ප්ලාස්ටික් අයිතම 10 ක් තහනම් කරන ලදී.
- රුවන්ඩා රජය, 1994 වර්ෂයේ දී එක් වරක් භාවිතා කරන ප්ලාස්ටික් බෑග් තහනම් කිරීම ඇතුළුව පාරිසරික ආරක්ෂාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත.
- 2018 අප්‍රේල් මාසයේදී, බ්‍රිතාන්‍යයේ ප්ලාස්ටික් බීමබට, කපු පුලුන් බඩ් සහිත ප්ලාස්ටික් කුරු සහ ප්ලාස්ටික් කලතන තහනම පිළිබඳ පළමු නිවේදනය නිකුත් කරන ලදී.
- අප්‍රිකානු මහාද්වීපයේ බොහෝ රටවල් ප්ලාස්ටික් බෑග් නිෂ්පාදනය සහ භාවිතය තහනම් කරමින් නීති සම්පාදනය කර ඇත.

ඉහත සඳහන් රටවල් මෙන්ම මෙහි සඳහන් නොවූ තවත් රටවල් ගණනාවක් පොලිතීන් සහ ප්ලාස්ටික් පරිභෝජනය තහනම් කිරීමට හෝ අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අඳුන්වා දී තිබේ.

ප්ලාස්ටික් පරිභෝජනය අඩු කිරීමට කුමක් කළ හැකි ද?

ප්ලාස්ටික් සීමා කළහොත් පරිසරය පිරිසිදු වනු ඇත, ප්ලාස්ටික් භාවිතය සීමා කළහොත් කසළ කඳු මත පවතින පීඩනය සහ මුළු ප්ලාස්ටික් අද්‍රව්‍ය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වනු ඇත. නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ප්‍රජා ආකල්පවල කල් පවතින වෙනසක් ඇති කිරීම සහ පරිසර හිතකාමී ජීවන රටාවන් සමඟ අර්ථවත් ප්‍රජා සහභාගීත්වයක් දිරිමත් කිරීම යන ඉහත කී සියල්ල ප්ලාස්ටික් හෝ තනි භාවිත ප්ලාස්ටික් පරිභෝජනය අඩු කිරීම සඳහා ඉතා වැදගත් වේ. ඊට අමතරව, පහත සඳහන් මැදිහත්වීම් ද මෙම ගැටළුව විසඳීමට දායක වේ.

ප්ලාස්ටික් බහාලූම් සහ දවටනසඳහා පහත සඳහන් ආකාරයේ විකල්පය ආදේශක භාවිතා කිරීම.

- ප්ලාස්ටික් පිඟන් කෝප්ප වෙනුවට ලෝහ, උණ බම්බු , කොලපු සහ මැටි වලින් සාදන ලද භාජන භාවිතා කිරීම.
- ආහාර ඇසුරුම් කිරීමට ලන්ච් ෂීට් හෝ ස්ටයිරොෆෝම් බහාලූම් වෙනුවට ලෝහ හෝ දිරායන ආහාර බහාලූම් භාවිතා කිරීම. මෙම ද්‍රව්‍ය නැවත නැවතත් භාවිතා කළ හැකි නම් වඩාත් උචිත වේ.
- පොලිතින් බෑග් වෙනුවට රෙදි හෝ ගෝනි, පන්, පට්ටා හෝ ඉරටු වැනි ශක්තිමත් ජෛව හායනයට ලක්විය හැකි කොළ වලින් සාදන / ගොතන / වියන ලද බෑග් භාවිතා කිරීම.
- පොළට, සිල්ලර බඩු කඩයට හෝ සාප්පුවට යන විට නැවත භාවිතා කළ හැකි බෑගයක් රැගෙන යාම වඩාත් උචිත වේ (මෙය පරිසර හිතකාමී චර්යාවක් වන අතරම ඔබේ මුදල් ද ඉතිරි වේ).
- ආහාර,ප්ලාස්ටික් බහාලූම්වලට නොදමා වීදුරු බහාලූම්වල හෝ ලෝහ බහාලූම්වල ගබඩා කිරීම.
- ප්ලාස්ටික් බීමබට වෙනුවට නැවත නැවතත් භාවිතා කළ හැකිලෝහ බීමබට හෝ දිරායන බීමබට භාවිතා කිරීම.
- ඔබේ නිවසෙහිනැවත භාවිතා කළ හැකි ප්ලාස්ටික් බෑග් තිබේ නම්, ඒවා නැවත සිල්ලර වෙළඳසැලට යනවිට රැගෙන ගොස් නැවත භාවිතා කිරීම ද ඉතා වැදගත් වේ.



රූපය 2 - තිරසාර ඇසුරුම්කරණයට අදාළ උපාය මාර්ගය
(අන්තර්ජාල මූලාශ්‍රය - https://dsb.edu.in/the-rise-of-eco-friendly-packaging-trends-and-innovations/)

ඉහත සඳහන් කළ ආකාරයට ක්‍රියා කිරීමට උත්සාහ කිරීම, අන් අයව ද ඉහත සඳහන් කළ ආකාරයට ක්‍රියා කිරීමට පෙළඹවීම සහ දිරිමත් කිරීම, මිනිසුන්ගේ හැසිරීම් වෙනස් කිරීම, වත්මන් නීති සහ රෙගුලාසි බලාත්මක කිරීම සහ ඒවාට අනුගත වීම, ප්ලාස්ටික් හෝ තනි භාවිත ප්ලාස්ටික් පරිභෝජනය අඩු කිරීම සඳහා ප්‍රජාසහභාගිත්වය ලබා දීම ට පහසුකම් සැලසීම සහ පරිසර හිතකාමී ජීවන රටාවක් ගත කිරීම වැනි ක්‍රියාවන් සහ මැදිහත්වීම් මගින් පොලිතීන් සහ ප්ලාස්ටික් ගැටළුව බොහෝ දුරට විසඳා ගත හැකි වේ. අනාගත පරපුර සඳහා පරිසර හිතකාමී, ප්ලාස්ටික් වලින් තොර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා, සහයෝගයෙන් කටයුතු කිරීමට අපේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම ද ඉතා වැදගත් වේ.

(පොතපත, අන්තර්ජාල මූලාශ්‍ර, දැනුම භාවිතයෙන් රචනා කරන ලදී)

ලිපිය සඳහා තොරතුරු රැස් කිරීමට භාවිතා කළ වෙබ් අඩවිවල ලේඛකයින්ට විශේෂ ස්තුතිය පුද කෙරේ. (Special thanks are given to the writers of the websites that were used to gather information for the article')

H.N. Sampath Wijethunga
Marine Environment Officer
Marine Environment Protection Authority

MICROPLASTIC AND THEIR CHARACTERIZATION IN THREE SPECIES OF MOLLUSKS IN SELECTED COASTAL SITES IN THE WESTERN PROVINCE, SRI LANKA

Microplastics (MPs), defined as plastic particles less than 5 mm in diameter, have emerged as pervasive and persistent pollutants in marine ecosystems worldwide. These particles can originate from the degradation of larger plastic items (secondary microplastics) or can be manufactured at small sizes (primary microplastics) for use in various commercial products Once released into the environment they accumulate in marine food webs and pose significant risks to aquatic life and, potentially to human health.

Sri Lanka's Western Province with its dense urbanization industrial zones fishing activity and tourism, is especially susceptible to microplastic pollution Mollusks, due to their filter-feeding and grazing behavior, are particularly vulnerable to ingesting microplastics making them useful bioindicators of environmental contamination This study investigates the concentration morphology and polymer composition of microplastics found in three mollusk species collected from six strategically selected coastal sites in the Western Province of Sri Lanka.

The objectives of this study were to quantify the presence of microplastics in Saccostrea sp. (Rock Oyster), Littorina sp. (Periwinkle), and Patella sp. (Limpet) collected from six coastal sites in the Western Province of Sri Lanka. The study also aimed to evaluate spatial differences in microplastic concentrations across these sites Additionally it sought to identify the morphological types and polymer composition of the extracted microplastics using microscopy and Fourier Transform Infrared Spectroscopy (FTIR). Finally, the research assessed the suitability of the selected mollusk species as bioindicators for monitoring coastal microplastic pollution.

This study was conducted from August 2021 to July 2022 across six coastal sites representing varying degrees of human activity Galle Face, Negombo Sarakkuwa Dehiwala Panadura and Beruwela. Mollusks were collected during low tides using standard ecological sampling techniques. Specimens of Saccostrea sp *Littorina* sp and *Patella* sp. were selected based on their abundance and habitat coverage.

Tissue samples were chemically digested using 10% potassium hydroxide (KOH) at 60°C for 48 hours. The resulting digestate was filtered, and potential microplastic

particles were identified using visual inspection under a stereomicroscope (Fig. 1) and confirmed with a hot needle test. Fourier Transform Infrared Spectroscopy (FTIR) was used to determine the polymer types of selected particles by matching their spectral signatures with known plastic standards. Data analysis was performed using one-way ANOVA to compare microplastic concentrations between sites for each species.




Fig 1: (P) MP particles, (Q) Measuring MP plastic length using ToupView software.

Microplastics were detected in all mollusk samples indicating widespread contamination along the Western Province coastline. Saccostrea sp. (Table 1) and Littorina sp. (Table 2) exhibited significant variation in microplastic accumulation across sites ($p = 0.001$), with Galle Face showing the highest concentration levels: 6.51±1.51 MPs/g in Saccostrea sp. and 3.77±2.2 MPs/g in Littorina sp. In contrast, Patella sp. (Table 3) showed no significant differences among sites ($p = 0.350$), with concentrations remaining relatively consistent (e.g., 2.77 MPs/g at Galle Face vs. 2.10 MPs/g at Panadura).

Different types and colors of microplastic particles were identified under the photomicroscope in the studied molluscan species samples (Fig.2.). These included (a) black filaments, (b) red filament, (c) green fragment, (d) blue filament, (e) another blue filament, and (f) brown rod-shaped particles. All observed particles were documented at a scale bar of 50 µm.




Fig.2: Different types and colors of images of (a) Black filaments, (b) Red filament, (c) Green fragment, (d) Blue filament, (e) blue filament), (f) Brown rod, type of identified under Photomicroscope in studied Species samples (Scale bar 50 µm).

Table 1: Microplastic concentration

(MPs/g) in Saccostrea sp. across six study sites over the designated time period.

Saccostrea sp.	**Location**					
Period	Negombo	Sarakkuwa	Gall Face	Dehiwela	Panadura	Beruwela
Auges- October	2.74± 0.45	5.06±1.26	6.51±1.51	5.69±0.77	4.41±0.80	3.53±1.01
November- January	2.60±0.55	2.63±1.28	4.16±1.17	4.97±0.66	4.76±0.79	2.64±1.23
February- April	2.00±0.77	3.28±1.29	3.03±1.66	3.84±0.82	5.03±0.85	3.37±1.18
May- July	3.09±1.48	5.11±2.20	5.37±1.68	5.00±0.71	6.24±0.88	5.04±0.68

Table 2: Microplastic concentration (MPs/g) in Littorina sp. across six study sites over the designated time period

Littorinc sp.	**Location**					
Period	Negombo	Sarakkuwa	Gall Face	Dehiwela	Panadura	Beruwela
Auges- September	2.89± 0.33	2.33±0.37	4.80±1.26	2.08±0.85	1.44±0.78	1.96±0.64
November- January	2.34± 0.21	1.68±0.44	2.67±1.29	1.72±1.00	1.21±0.92	3.35±0.35
February- April	2.11±0.30	2.50±0.11	2.70±1.57	3.65±1.02	2.90±1.05	3.25±0.39
May- July	2.54±1.09	2.35±0.25	4.92±1.36	2.21±1.27	1.42±2.53	2.70±2.34

Table 3: Microplastic concentration (MPs/g) in Patella sp. across six study sites over the designated time period

Patella sp.	**Location**					
Period	Negombo	Sarakkuwa	Gall Face	Dehiwela	Panadura	Beruwela
Auges- October	1.76±0.33	2.65±0.32	4.83±1.38	2.35±1.18	1.89±0.19	2.83±0.70
November- January	2.01±0.25	2.10±0.38	2.16±0.10	1.17±0.58	2.04±0.15	1.97±0.76
February- April	2.49±0.12	2.70±0.07	2.12±0.11	3.83±1.77	2.14±0.14	1.56±1.04
May- July	2.33±0.20	2.80±1.58	1.97±0.25	2.43±1.06	2.34±0.21	3.03±1.66

The predominant microplastic type was filamentous (62.45%), followed by fragmented particles (17.64%) and film-like fragments (12.98%). Blue was the most frequently observed color (43.84%), typically associated with textile fibers or fishing gear. FTIR analysis confirmed the presence of polymers(fig 3) such as polypropylene (PP), polyvinyl chloride (PVC), and polyethylene (PE), indicating sources from packaging materials, fishing equipment, and domestic waste.

These findings highlight the influence of human activity and pollution sources on microplastic levels in marine environments. The higher concentrations at urbanized beaches such as Galle Face and Negombo suggest point-source contamination from stormwater runoff, sewage discharges, and recreational activities. The significant bioaccumulation in Saccostrea sp. and Littorina sp. further supports their utility as sentinel species for

microplastic monitoring programs.

(a)Polypropylene (PP) identified by filaments (blue and red), fragments (blue and red) and others in Negombo, (b)Polypropylene (PP) identified by filaments (blue and red) in Sarakkuwa, (c) Polyvinyl Chloride-Hard (PVC- Hard) identified by filaments (blue and red) in Galle Face, (d) Polyvinyl Chloride-Un plasticized (PVC-U) identified by filaments (blue and red) in Dehiwela, (e) Polyvinyl Chloride-Un plasticized (PVC-U) identified by fragments (blue and red), and others in Panadura, (f) Polyphenylene Ether + High Impact Polystyrene (PPE + HIPS) identified by fragments (blue and red) in Beruwela

This study provides crucial baseline data on microplastic contamination in




Fig 3: FT IR spectra of analyzed MPs in species

mollusks along Sri Lanka's western coast. The findings confirm the widespread presence of microplastics in intertidal mollusks and highlight spatial differences influenced by local environmental and anthropogenic factors. The data support the use of Saccostrea sp., Patella sp. and Littorina sp. as effective bioindicators and call for urgent interventions in plastic waste management and pollution mitigation. Strategies such as improved waste collection, public education, and stricter regulations on plastic use are essential to reduce microplastic pollution in these ecologically and economically important coastal areas.

References

1. Athawuda, N., Senevirathna, J.D. and Amarasekara, T.H. (2020) 'Plastic debris distribution in selected beaches along the west coast of Sri Lanka', Marine Pollution Bulletin, 160, p. 111575.
2. Jambeck, J.R., Geyer, R., Wilcox, C., Siegler, T.R., Perryman, M., Andrady, A., Narayan, R. and Law, K.L. (2015) 'Plastic waste inputs from land into the ocean', Science, 347(6223), pp. 768-771.
3. Jayasiri, H., Purushothaman, C. and Vennila, A. (2013) 'Plastic litter accumulation on high- water strandline of urban beaches in Mumbai, India', Environmental Monitoring and Assessment, 185, pp. 7709-7719.
4. Kumara, P.B.T.P., Jayathilaka, B.N. and Priyadarshana, T. (2023) 'Microplastics in coastal and marine environments of Sri Lanka: A review of sources, impacts, and management strategies', Marine Pollution Bulletin, 185, p. 114267.
5. Thushari, G.G.N., Chavanich, S., Yakupitiyage, A. and Senevirathna, J.D.M. (2017) 'Effects of microplastic on sessile invertebrates in the eastern coast of Thailand: An approach to coastal zone conservation', Marine Pollution Bulletin, 116(1-2), pp. 121-129.
6. Wijethunga, S., Rathnayake, H., Karunathilake, N., Perera, K. and Thushari, G.G.N. (2023) 'Microplastic contamination in commercially important marine species from the southwest coast of Sri Lanka', Environmental Pollution, 296, p. 118770

Institution where research was carried out
epartment of Chemistry, Faculty of Science, University of Peradeniya.
Marine Environment Protection Authority, Galle

ආර්.එම්.එස්.ජී.චන්දිම කුමාර
වන පාලක - ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම් අංශය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ ආඥා පනතින් රැකවරණය සැලසෙන වනාන්තර

මානව පරිණාමයේ ආරම්භයේ සිටම මිනිසා හා වනාන්තර අතර ඇත්තේ අවියෝජනීය සබැඳියාවකි. වනාන්තර ඇසුරේ ජීවත් වූ මානවයාට මූලික අවශ්‍යතා වෙනුවෙන් වනාන්තර මත යැපීමේ ක්‍රියාවලියෙන් වර්තමානයේදීත් ඉවත්වීමට නොහැකිව ඇත. ජනගහනය වර්ධනයට සාපේක්ෂව සම්පත් සීමාවීම, මානවයා ක්‍රම ක්‍රමයෙන් ජනවාසකරණය වී සංවිධාන ව්‍යුහය සකස් කර ගනිමින් විවිධ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම උදෙසා වනාන්තර මත යැපීම වැනි හේතු මඟින් සිදුවන වන හරනය (Deforestation) හා වන හායනය (Forest Degradation) අවම කරගැනීම සඳහා ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳව විවිධ අවධිමත් නීති පද්ධති ක්‍රමක්‍රමයෙන් ස්ථාපිත විය. ඒ ආකාරයට ශ්‍රී ලංකාවේද වනාන්තර ආරක්ෂා කරගැනීමට විවිධ නීති පද්ධති හා ක්‍රියාකාරකම් කලින් කල පැවති බව මහාවංශය, රාජරත්නාකාරිය හා රත්නාවලිය වැනි ඓතිහාසික ග්‍රන්ථයන් සාක්ෂි දරයි.

මේ අතරින් ක්‍රි.පූ. 543 දී මෙරට රජ කළ විජය රජුගේ සමය ,ක්‍රි. පූ. 247-207 දක්වා රජ කළ දේවානම්පියතිස්ස රජුගේ සමය ක්‍රි.පූ. 161-137 දක්වා රජ කළ දුටුගැමුණු රජ සමය, ක්‍රි.ව. 1187-1196 දක්වා ශ්‍රී නිශ්ශංකමල්ල රාජ සමය, ක්‍රි. ව. 1284-1310 දක්වා රජ කළ මහා පරාක්‍රමබාහු රාජ සමය හා ක්‍රි. ව. 1373-1406 දක්වා රජ කළ බුවනෙකබාහු රජතුමාගේ පාලන සමය විශේෂයෙන් කැපී පෙනෙන අතර, මෙම වකවානුව තුළ රුක් රෝපණය, වනාන්තර භාවිතයට ගැනීම පිළිබඳව විවිධ වූ නීති රීති ක්‍රියාවට නංවා ඇත. මෙම කාලවනවානු තුල වනාන්තර රජුට අයත් රාජ්‍ය දේපලක් ලෙස පැවතිම හේතුවෙන් වනාන්තර විනාශ කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව තුළ බියක් පැවත ඇත. රජවරු විසින් විවිධ රාජකාරී වෙනුවෙන් වගාබිම් පුද්ගලයන්ට මෙන්ම, බෞද්ධ වෙහෙර විහාර වෙතද ප්‍රදානය කරන ලදී. මෙම සමහර ප්‍රදානයන් අදටත් වලංගුව පවතී. වනපල්ලන් කැමති තනතුරු පුද්ගලයන්ට ලබාදී ඔවුන්ට රජවාසලට පලතුරු මී පැණි හා දඩමස් සැපයීම, නීති විරෝධී ලෙස සතුන් දඩයම වැලැක්වීම ආදි රාජකාරි භාරදී ඇත. යටත් විජිත සමයේ ආරම්භයේදී පෘතුගීසීන් විසින් මෙරට වනාන්තර පාලනය සම්බන්ධයෙන් ගත් පියවර පිළිබඳව ලේඛනගත සාක්ෂි හමුවී නොමැත. යටත් විජිත සමයේ ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවේ තේක්ක කොස් වැනි ශාක වගා කිරීමට පියවර ගෙන ඇත. ලන්දේසි සමයේ පුද්ගලික ඉඩම් තුල හා රජයේ ඉඩම්වල සිටුවන ලද ගස් රජයේ දේපල ලෙස සලකා ඇත. නමුත් ඔවුන් විසින් සිටුවන ලද ගස් පිළිබඳ ප්‍රමාණාත්මක වාර්තා දක්නට ලැබෙනුයේ කලාතුරකිනි. 1796 සිට මෙරට පාලනය කළ බ්‍රිතාන්‍යයන් විසින් දේශීය ඉදිකිරීම් හා දැව අපනයනය සඳහා කැලෑ එලිපෙහෙලි කිරීමත්, විවිධ වාණිජ වගාවන් සඳහා කඳුකර වනාන්තරත් හේන් වගාව වියලි කලාපයේ වනාන්තරත් එලිකිරීමත් නිසා සීඝ්‍ර වන විනාශයක් සිදුවිය. 1811දී මෙරට කැලෑ පිළිබඳ අධිකාරීවරයෙකු පත් කර තිබූ අතර ඔහුගේ රාජකාරිය වී ඇත්තේ අපනයනය හා දේශීය ඉදිකිරීම් සඳහා දැව සැපයීමයි. 1835 දී ආරම්භ වූ කෝපි වගාවත් සමඟ උග්‍ර ලෙස වනාන්තර එලිපෙහෙලි කිරීම ආරම්භ වූ අතර, හේන් එලි කිරීම පාලනය කිරීමට නොහැකි වීම හා දැව හෙළීම පාලනය කිරීම සඳහා අවශ්‍යතාවයක් මතුවිය. ඒ අනුව 1840 අංක 12 දරණ රජයේ ඉඩම් (බලෙන් අල්ලා

ගැනීමේ ආඥා පනත) ශ්‍රී ලංකාවේ වනාන්තර ආරක්ෂා කිරීමට බලපෑ මුල්ම ලිඛිත නීතිය ලෙස හඳුනාගත හැකය. මෙම පනත මඟින් රජයේ ඉඩමක් බලෙන් අල්ලාගත් තැනැත්තෙකු අනවසර භුක්තිකරුවෙකු ලෙසත්, රජයේ ඉඩම් ලෙස සියළුම වනාන්තර ඉඩම්, මුඩු ඉඩම්, වගා නොකල ඉඩම්, ලියාපදිංචියක් නොමැති සියලු ඉඩම් පුර්ව නිගමනය කරන බවට එම පනතේ 6 වන වගන්තියේ දක්වා ඇත.

පසුව ක්‍රමක්‍රමයෙන් වනාන්තර සම්බන්ධව බ්‍රිතාන්‍යන්ගේ අවධානය යොමු වූ අතර, නමුත් 1840 අංක 12 පනතේ විධිවිධාන උපයෝගී කරගෙන කැලෑ ඉඩමක් හෝ ඉඩම් ඇතුලු සංවර්ධනය නොකල සියලු ඉඩම් රජයේ (ඉඩම් වශයෙන් පවරා ගත්) නමුත් එම ඉඩම් මහා පරිමාණයේ වාණිජමය වගාවන් සඳහා වැවිලි කරුවන්ට ලබාදීම හේතුවෙන් කැලෑ ඉඩම් බොහෝමයක් දේශීය, විදේශී වැවිලිකරුවන්ගේ පුද්ගලිකත්වයට පත්විය.

දිවයිනේ රජයේ ඉඩම්වලින් දැව කපා ඉවත්කිරීම පාලනය කිරීම පිණිස 1848 ආඥා පනතක් සම්මත කරගැනීමට කටයුතු කරන ලදී. නමුත් දිගින් දිගටම පැවති කොන්ත්‍රාත්කරුවන්ගේ ක්‍රියාකාරකම් නිසා වන විනාශය තවදුරටත් උග්‍ර විය. 1882 දී ශ්‍රී ලංකාවේ වනාන්තර කළමනාකරණය පිළිබඳ උපදෙස් දීම සඳහා ඉන්දියානු වන සේවයේ එෆ්.සී.ඒ.වින්සන්ට් මහතා පත් කරනු ලැබීය. ඔහුගේ යෝජනාවන් අතර, කැලෑ ආඥා පනතක හා වන සංරක්ෂකවරයෙකු පත් කිරීමේ අවශ්‍යතාව මතු වූ අතර, 1885 වසරේදී 1885 අංක 10 දරන ''වනාන්තර මුඩුබිම් හා දැව හෙළීම් හා දැව ප්‍රවාහනය පිළිබඳ ආඥා පනත'' සම්මතව වීමෙන් අනතුරුව 1887 දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වන සංරක්ෂවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික තොම්සන් මහතා පත්කරණු ලැබීය. එහිදී ඔහුගේ මුල්ම කාර්යභාරය වී ඇත්තේ ආණ්ඩුවේ ඒජන්තවරුන්ට වන විද්‍යාත්මක කටයුතු පිළිබඳ උපදෙස් ලබා දීමය. 1897-1903 කාලවකවානුවේදී සම්මත කරනට යෙදුනු මුඩුබිම් ආඥා පනත, පරිසර සහ වනාන්තර ආරක්ෂාවට නව පදනමක් ඇති කලේය. 1897 අංක දරණ මුඩු බිම් පනත මඟින් වනාන්තර, හේන්, වගා නොකල ඉඩම්, මුඩු බිම් සහ පදිංචියක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් පෞද්ගලික අයිතිකරුවන්ගේ හිමිකම්පෑම නිරවුල් කරන ලදී. මෙමඟින් ජනතාවගේ භූමි භාවිතයට නීතිමය පාලනයක් ආරම්භ විය. ඒ අනුව 1885 දී සම්මත කරන ලද 1885 අංක 10 ''වනාන්තර මුඩුබිම් හා දැව හෙළීම් හා දැව ප්‍රවාහනය පිළිබඳ ආඥා පනත'' 1907 දක්වා ක්‍රියාකාරීව පැවති අතර මුඩුබිම් ආඥා පනතේ නීතිමය තත්වයන්ද සැලකිල්ලට ගෙන 1907 අංක 16 දරණ නව කැලෑ අඥා පනත සම්මත කරගන්නා ලදී.

1907 සම්මත වූ කැලෑ ආඥා පනත යම් යම් කාලවකවානුවල ඇති වූ අවශ්‍යතා සැලකිල්ලට ජනතාව වනාන්තර මත යැපීම අඩු කරමින් ක්‍රමක් ක්‍රමයෙන් වනාන්තර සංරක්ෂණය කිරීම සඳහා 1912 අංක 11 දරන ආඥා පනත, 1918 අංක 24 දරන ආඥා පනත , 1931 අංක 23 දරන ආඥා පනත, 1935 අංක 16 දරන ආඥා පනත, 1945 අංක 30 දරන ආඥා පනත, 1947 අංක 08 දරන ආඥා පනත,1951 අංක 34 දරන ආඥා පනත, 1954 අංක 49දරන ආඥා පනත සංශෝධනයන් සිදුකර ඇත. අනතුරුව 1966 අංක 13 දරණ පනත මඟින් සිදුකරන ලද සංශෝධනයන්ද ඇතුළත්ව 1966 අංක 13 දරණ පනත ලෙස සංශෝධනය වී ඇති අතර 1966 පුනර්මුද්‍රණයක් සිදුකර ඇත. අනතුරුව 1966, අංක 13 දරණ පනත පසුව 1979 අංක 56 ,1982අංක 13,1988 අංක 84,1995 අංක 23 යන ආඥා පනත මඟින් සංශෝධනය කර ඇත. 1995 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද ජාතික වන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව 2009 අංක 65 දරණ පනත මඟින් අවසන් වරට වන සංරක්ෂණ ආඥා පනත ලෙස සංශෝධනය වී ඇති අතර ,1995 අංක

23 දරණ ආඥා පනත මඟින් කැලෑ ආඥා පනතට ප්‍රථම වරට සංරක්ෂිත වනාන්තර හඳුන්වා දී ඇත. කලින් කලට වෙනස් වූ වන ප්‍රතිපත්ති අනුව වනාන්තර වල කළමනාකරණය ඒජන්තවරු හා වන සංරක්ෂක වරයා අතට විවිධ ක්‍රමවලින් හුවමාරු වී ඇති අතර, වර්තමානයේ සියලු වනානත්ර වන සංරක්ෂක ජනරාල්වරයාගේ කළමනාකරණයේ පවතී. වන සංරක්ෂණ ආඥා පනත තුල වනාන්තරවල ආරක්ෂාව සඳහා එම වනාන්තරවල වැදගත්කම සැලකිල්ලටගෙන නීතිමය වශයෙන් කොටස් හතරකට වෙන්කර ඇත.

එම වනාන්තර නම්,

- සංරක්ෂිත වනාන්තර
- රක්ෂිත වනාන්තර
- ගම්බද වනාන්තර
- සංරක්ෂිත, රක්ෂිත ගම්බද වන හැර වෙනත් වනාන්තර

ඉහත නීතිමය වනාන්තර බාණ්ඩ හතර තුල වන විද්‍යා මූලධර්ම වලදී හඳුනාගන්නා ස්වභාවික වර්ගීකරණයට ඇතුලත් සියලු ස්වාභාවික වනාන්තර ඇතුලත් වේ.

01. සංරක්ෂිත වනාන්තර

මෙම වනාන්තර කණ්ඩය වන සංරක්ෂණ ආඥා පනතට 1995 අංක 23 දරන සංශෝධන පනතින් හඳුන්වා දී ඇත. ඒ අනුව වන සංරක්ෂණ ආඥා පනතේ 3අ (1) වගන්තියේ විධිවිධාන අනුව අනන්‍ය පරිසර පද්ධතීන් සහ ජාන විද්‍යාත්මක සම්පත් ඇති හෝ විරල සහ ප්‍රදේශයට ආවේනික වන සත්ව හා වෘක්ෂලතා සහ ක්ෂුද්‍රජීවී විශේෂයන් සහ වඳවීමේ තර්ජනයකට භාජනය වූ වර්ග ඇත්තා වූ හෝ ගංගා ලවනීකරණය වීම සහ සිදීයාම වැළැක්වීමෙන්, ප්‍රමාණවත් වර්ෂාපතනය ලැබෙන බවට කටයුතු සැලැස්වීමෙන්, පානය කිරීම සඳහා හෝ බලශක්තිය සඳහා ජලය සපයන ජලාශ සිදීයාම වැළැක්වීමෙන් සහ ජන ජීවිතයට හානිකර වූ නායයාම් හා ගිනි ඇවිලීම් වැළැක්වීමෙන් ප්‍රදේශයේ පරිසර විද්‍යාත්මක තුලනය ඇති කිරීම සඳහා ආරක්ෂා කරගත යුතු වූ රජයේ ඉඩමක් විෂය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට හැකිය. මෙලෙස දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වන සංරක්ෂණ ආඥා පනත යටතේ සංරක්ෂිත වනාන්තර 130ක් පමණ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එමඟින් ආවරණය වන මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටයාර් 163604 පමණ වේ.

මෙම වනාන්තර සම්බන්ධයෙන් පනතේ වැදගත් වගන්තියක් වනුයේ පනතේ 3අ 6 උප වගන්තියයි. ඉහත 3අ (1) වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන සංරක්ෂිත වනාන්තරයක පැවැත්ම සහ ආරක්ෂාව සඳහා රජයේ ඉඩමක් නොවන එම ලක්ෂණ සහිත යම් නිෂ්චල දේපලත් අවශ්‍ය වන අවස්ථාවක අමාත්‍යවරයාගේ නිර්දේශ මත (460 වන අධිකාරිය යටතේ වූ) ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගැනීමට හැකි බව මෙම පනතින්ද නියම කර තිබීමයි. ඒ අනුව 3අ (6) වගන්තිය අනුව සංරක්ෂිත වනාන්තරයක ලක්ෂණ පවතින රජයේ ඉඩමක් නොවන පරිසර පද්ධතියකටද එමඟින් ආරක්ෂාවක් ලැබීමෙන් සමස්ථ පරිසර පද්ධතිය ආරක්ෂාව තහවුරු කිරීමට වන සංරක්ෂණ ආඥා පනත මඟින් කටයුතු කර ඇත.

වන සංරක්ෂණ ආඥා පනතේ 3ඇ වගන්තිය මඟින් මෙම සංරක්ෂිත වනාන්තර ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රමවේදය සම්බන්ධ නීතිමය විධිවිධාන නියම කර ඇත. යම් අවශ්‍යතාවයක් මත මෙම වනාන්තර වල සීමා මායිම් වෙනස් කිරීමට නීතිමය ප්‍රතිපාදන 3ඈ වගන්තිය යටතේ අමාත්‍යවරයාට ලැබී ඇති අතර මෙම වනාන්තර සංරක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැත. සීමා වෙනස් කිරීමද අමාත්‍යවරයා විසින් සකස් කරන නියමයන් ජනාධිපතිවරයා විසින් අනුමත කර පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසු බලාත්මක වේ. ඒ අනුව සංරක්ෂිත වනාන්තර වල සීමා වෙනස් කිරීමට පවතින ක්‍රමවේදය දීර්ඝ ක්‍රියාවලියකි.

වන සංරක්ෂණ ආඥා පනතේ 3අ (2) වගන්තිය අනුව සියලුම සංරක්ෂිත වනාන්තර වන සංරක්ෂක ජනරාල්වරයාගේ කළමනාකරණයේ පවතින අතර, එම එක් එක් වනාන්තරයකට වෙන් වෙන්ව වශයෙන් වන සංරක්ෂක ජනරාල්වරයා විසින් කළමනාකරණ සැලසුම් පිළියෙල කල යුතුය. මෙම කලමනාකරණ සැලසුම් වන සංරක්ෂක ජනරාල්වරයා තත්කාර්ය සඳහා ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද නිලධාරීන් විසින් ක්‍රියාත්මක කළ හැකිය. ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන 3අ (3) (4) වගන්ති මඟින් ලැබී ඇත. මෙම කලමනාකරණ සැලැසුම මඟින් නියම කරනු ලැබ කාර්යයන් හැර වෙනත් කිසිඳු ක්‍රියාවක් සංරක්ෂිත වනාන්තර වල සිදු කල නොහැකිය.

ඉහත සඳහන් කරන ලද කළමනාකරණ සැලැස්මේ අන්තර්ගත විය යුතු කරුණු සම්බන්ධයෙන් පනතේ 3අ (5) වගන්තිය මඟින් විෂය භාර අමාත්‍යවරයාට ලැබී ඇති බලතල අනුව නියෝග සකස් කර අමාත්‍යවරයා විසින් 2023/08/21 දිනැති අංක 2346/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත 2023 අංක 03 දරණ වන සංරක්ෂන (සංරක්ෂිත වනාන්තර) නියෝග ප්‍රකාශ කර ඇත.එම නියෝග අනුව වන සංරක්ෂක ජනරාල්වරයා විසින් සකස් කරන කළමනාකරණ සැලසුමට ඇතුළත් කළ යුතු පියවර ප්‍රකාශයට පත් කර ඇති අතර, කළමනාකරණ සැලැස්ම මඟින් අනුගමනය කළ යුතු පිළිවෙත් හා නිර්ණායකද ප්‍රකාශයට පත් කර ඇත.මෙම කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු ආකාරයන්, එම කළමනාකරණ සැලැස්මට සංශෝධන සිදු කල හැකි ආකාර සම්බන්ධයෙන්ද මෙම නියෝගය මඟින් දක්වා ඇත.ඒ අනුව කළමනාකරණ සැලැස්ම යටතේ පමනක් ක්‍රියාත්මක කරන කටයුතු වන සංරක්ෂණ ජනරාල්වරයාගේ නිර්දේශයන් යටතේ සිදුකල යුතු වේ.

තවද, සංරක්ෂිත වනාන්තරයක් තුල විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම, වන සතුන් හා වෘක්ෂලතා නැරඹීමට අපේක්ෂා කරන අයකුට අවසර ලබාදීමේ ක්‍රමවේදය හා අවසර ලබා දී පැනවිය යුතු කොන්දේසි මෙම නියෝග මාලාව මඟින් ප්‍රකාශ කර ඇත.ඒ අනුව වන සංරක්ෂණ ආඥා පනත යටතේ කළමනාකරණය කරනු ලබන සංරක්ෂිත වනාන්තරයක් තුළ වන සංරක්ෂක ජනරාල්වරයාගේ අවසර මත විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම , වන සතුන් හා වෘක්ෂලතා නැරඹීමට ඉහත ක්‍රමවේදවලින් බැහැර වූ වෙනත් ක්‍රමයක් ඔස්සේ අවසර ලබාදීමට නෛතික ප්‍රතිපාදන නොමැත.

ඉහත නීතිමය ප්‍රතිපාදන උපයෝගී කරගෙන ප්‍රකාශයට පත් කළ සංරක්ෂිත වනාන්තර තුළ නොකළ යුතු ක්‍රියා සම්බන්ධයෙන් වන සංරක්ෂණ ආඥා පනතේ 06 වන වගන්තියේ දක්වා ඇත. ඒ අනුව 06 වගන්තියේ (02) (I) උපවගන්තියේ (අ) සිට (v) දක්වා එම තහනම් ක්‍රියා විස්තර

කර ඇත. එම තහනම් ක්‍රියා අනුව සංක්ෂිත වනාන්තරකට අයුතු ලෙස අතුලූ වීමේ සිට වෙනත් කිසිදු ක්‍රියාවක් සිදුකල නොහැකිය. අවසර ලබාගෙන සිදුකල හැකි පහත ක්‍රියා හැර අනෙකුත් සියලූ ක්‍රියා සංරක්ෂිත වනාන්තරයක් තුල තහනම් ක්‍රියාවේ. ඒ අනුව සංරක්ෂිත වනාන්තරයක් තුළ අවසර ලබාදෙනුයේ,

(අ) විද්‍යාත්මක පර්යේෂණයක නිරත වීමේ;
(ආ) සංරක්ෂණ වනය තුළ පිහිටි වනජීවී හා වෘක්ෂලතා නිරීක්ෂණය කිරීමේ හෝ;
(ඇ) කළමනාකරණ සැලැස්මේ නියම කරනු ලැබ ඇති කටයුතු ක්‍රියාත්මක කිරීම් සඳහා පමණි.

වන සංරක්ෂණ ආඥා පනතේ 06 (4) වගන්තිය අනුව ඒ සඳහා වන ඉල්ලීමක් නියමිත ආකෘතියකට අනුව වන සංරක්ෂක ජනරාල් ඉදිරිපත් කර ඊට අදාළ ගාස්තු ගෙවු පසු ඒ සඳහා අවසර ලබාදේ. ඉහත (අ) (ආ) හැර සංරක්ෂිත වනාන්තරයක් තුල කළමනාකරණ සැලැස්මේ නියම කරන ලැබ ඇති ක්‍රියාකාරකම් සඳහා හැර වෙනත් කිසිදු ක්‍රියාකාරකම් සඳහා අවසර දෙනු නොලැබේ.

වන සංරක්ෂණ පනතේ 06 (2) වගන්තිය අනුව තහනම් ක්‍රියාවක් සඳහා ගරු අධිකරණයේ වරදකරුවෙකු වන අයෙකුට අවුරුදු හතක් දක්වා වූ බන්ධනාගාර ගතකිරීමකට රුපියල් විසිදහසකට නොඅඩු රුපියල් දෙලක්ෂයක් නොයික්මවන දඩයකට හෝ එකී දඩුවම් දෙකටම හෝ නියම කිරීමට මහේස්ත්‍රාත්වරයකු බලය ඇත. තවද වනාන්තරයට කරන ලද හානිය වන්දි මුදලක් ලෙස අය කිරීමට පනතේ ප්‍රතිපාදන පවති. ඉහත වැරදි සඳහා ආධාර අනුබල ලබාදුන් අයෙකුටද එම දඩුවමටම යටත් කළ හැකි අතර වරද සඳහා භාවිතා කරන උපකරණ, මෙලවම් සතුන් ,භාණ්ඩ ආදිය සියලූ දෑ රාජ සන්තක කිරීමට අධිකරණයට බලය ඇත.

02. රක්ෂිත වනාන්තර

වන සංරක්ෂණ ආඥා පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණය විෂය භාර අමාත්‍යවරයාට ගැසට් පත්‍රයේ පල කරන නිවේදනයක් යම් කිසි දිනක සිට බලාත්මක වන පරිදි රක්ෂිත වනාන්තර ප්‍රකාශයට පත් කල හැකිය. වන සංරක්ෂණ ආඥා පනතේ 04 වන වගන්තිය මඟින් නියම කර ඇති ක්‍රමවේදයට අනුව රක්ෂිත ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම ආඥා පනත ආරම්භ වීමට ප්‍රථම වෙනත් කුමන හෝ නීතියක් යටතේ රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද වනයක් මෙම වන සංරක්ෂණ ආඥා පනත යටතේද රක්ෂිතයක් ලෙස සැලකිය යුතු බවත්, එම වනාන්තර සඳහා මෙම පනතේ විධිවිධානයන් බලපැවැත්වෙන බව පනතේ 10 වන වගන්තිය මඟින් දක්වා ඇත. මේ ආකාරයට දැනට ශ්‍රී ලංකාව තුළ 2025 වර්ෂයේ අගෝස්තු මාසය වන විට රක්ෂිත වනාන්තර 811 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර, එමඟින් ආවරණය වන මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටයාර 1213413.65 කි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වගා කරන ලද විවිධ විශේෂ වලට අයත් වන වගා, සියල්ලද රක්ෂිත වනාන්තර වන බව වන සංරක්ෂණ ආඥා පනතේ 78 වන වගන්තියේ රක්ෂිත වනය අර්ථ දැක්වීම අනුව පැහැදිලි වේ.ඉහත ප්‍රතිපාදන යටතේ ප්‍රකාශයට පත්කරන ලද රක්ෂිත වනාන්තරයකද,ජෛව විවිධත්වය, පස හා ජලය සංරක්ෂණය කිරීමේ කාර්ය සහ එහි පරිසර පද්ධති, ජාන සම්පත් සහ දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා

වෘක්ෂලතා විශේෂද සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා වන සංරක්ෂණ ජනරාල් විසින් ක්‍රමවේද පියවර හා ක්‍රියාකාරකම් ඇතුළත් කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය. වන සංරක්ෂණ පනතේ 3 (4) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සැලැස්මට ඇතුළත් විය යුතු කරුණු අමාත්‍යවරයා විසින් නියෝග ලෙස ප්‍රකාශයට පත්කර ඇත. එම විධිවිධාන ඔස්සේ පිළියෙල කරන කළමනාකරණ සැලැස්ම වන සංරක්ෂක ජනරාල් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

විෂය භාර අමාත්‍යවරයාට පනතේ 3 (4) වගන්තිය මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව රක්ෂිත වනාන්තර සඳහා අංක 2346/23 හා 2023/08/26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2023 අංක 04 දරණ වන සංරක්ෂණ (රක්ෂිත වනාන්තර) නියෝග ප්‍රකාශයට පත් කර ඇත. එම නියෝග අනුව, එක් එක් රක්ෂිත වනාන්තරයකට වෙන් වෙන්ව වන සංරක්ෂක ජනරාල් විසින් පිලියෙල කරන සැලැස්මේ රක්ෂිත වනාන්තර තුළ ජෛව විවිධත්වය, පස සහ ජලය සංරක්ෂණය සඳහා ද ඒවායේ අනන්‍ය පරිසර පද්ධතිය, ජාන සම්පත් සහ දුර්ලභ සහ ආවේණික වන සත්ව හා වෘක්ෂලතා විශේෂවල වාස භූමියක් ලෙස එම වනාන්තර සුරැකීම සඳහාද ගත යුතු පියවර අඩංගු විය යුතු බවත් ඒ සඳහා වන අවස්ථානෝචිත පරිදි පිළිවෙත් හා උපමාන අඩංගු විය යුතු බවටත් දක්වා ඇත. එම කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම වන සංරක්ෂක ජනරාල් වෙත පැවරේ. එම නියෝගවල විධි විධාන අනුව, රක්ෂිත වනයන්හි තිරසාර කළමනාකරණය තහවුරු කිරීම සඳහා, වන සංරක්ෂක ජනරාල් විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී ජන කොටස්වල සහ රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය, එම කාර්ය සඳහා කළමනාකරණ ගිවිසුමකට එළඹීමට යටත්ව ලබාගත හැකිය.එවැනි ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමෙන් ජන කොටස්වලට සහ රාජ්‍ය නොවන අංශයට ප්‍රතිලාභ ලැබෙන්නා වූ ද අවස්ථාවලදී, එවැනි වනයකින් ජන කොටස් සහ රාජ්‍ය නොවන අංශය ලබා ගන්නා මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභවල වටිනාකමට සමානුපාතික වටිනාකමක් පිළිඹිබු කෙරෙන ගාස්තුවක් වන සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කොට අයකර ගනු ලැබිය යුතුය. ලබාගන්නා ප්‍රතිලාභ පිළිබඳව අනාවරණය නොකිරීම ආඥා පනත යටතේ වරදක් විය යුතු බව නියෝග කර ඇත.

එම නියෝග මාලාවේ 06 වන නියෝගය අනුව රක්ෂිතයකින් මැරී වැටී ඇති කොටු ඉවත් කිරීම, ''දැව නොවන වන නිෂ්පාදන'' (කොළ, මල්, ගෙඩි, ඇට, පළතුරු, අල, යුෂ, තෙල්, දුම්මල,රෙසින, මැලියම්, තිපල්, ඖෂධ පැළැටි, එහි කොටස් හෝ ඉන් උපදින ද්‍රව්‍ය, තෘණ, වැල්, බට, පන, පෙඳ, පාසි, උණ, වේවැල්, හතු, සහ පැණි) එකතු කිරීම, ජල ප්‍රභවයේ ඉහළ සහ පහළ ප්‍රදේශවල තිබෙන ජලජ වාසභූමිවලට බාධා නොවන පරිදි රක්ෂිත වනාන්තරයක ස්වභාවික උල්පත්, ජලකර සහ වෙනත් ස්වභාවික ජල ප්‍රභවයන්ගෙන් පානීය අවශ්‍යතාව සඳහා ජලය ප්‍රයෝජනයට ගැනීමවන සංරක්ෂක ජනරාල්වරයාට අවසර ලබාදිය හැකිය. රක්ෂිත වනාන්තර තුල පවතින කිසිදු ඛනිජ (ගල්, වැලි, බොරළු,මැටි වැනි ඛනිජ සම්පත්) ද්‍රව්‍යයක් ඉවත් කිරීමට අවසර ලබාදීමට වර්තමාන නියෝග මාලාව අනුව හැකියාවක් නොමැත. මෙම නියෝග මාලාව අනුව රක්ෂිත වනාන්තර තුළ විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීමට ගාස්තු මත අවසර ලබාදීමේ ක්‍රමවේදය දක්වා ඇත.

මෙලෙස ප්‍රකාශයට පත්කල රක්ෂිත වනාන්තරවල තහනම් ක්‍රියාවන් වන සංරක්ෂණ ආඥා පනතේ 07 (1) වගන්තියේ (අ) සිට (ඕ) දක්වා විස්තර කර ඇත. ඒ අනුව රක්ෂිත වනාන්තරයකට අයුතු ලෙස ඇතලු වීමේ සිට සියලු ක්‍රියාවන් තහනම් කර ඇත. එවැනි වරදකට අධිකරණය මගින්

වරදකරු කරනු ලැබූ අයෙකුට අවුරුදු පහක් (05) ක් නොඉක්මවන්නා වූ කාලසීමාවකට රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හා රුපියල් දසදහසකට නොඅඩු ලක්ෂයකට නොවැඩි දඩයක් හෝ එම දඩුවම් දෙකම නියම කිරීම මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇත. ඊට අමතරව වනාන්තරයට කරන ලද හානිය වන්දියක් ලෙස චූදිතගෙන් අයකර ගනු ලැබිය හැකිය.තවද, මෙම වගන්තියේ වරදක් සිදුකිරීමට ආධාර අනුබල දෙන අයෙකුටද එබඳු වරදක් සිදු කිරීමට ඉඩසලස්වන අයෙකුද එම දඩුවමට යටත් වන බව පනතේ දක්වා ඇත. වරද සඳහා උපයෝගී කර ගත් උපකරණ හා මෙවලම් ආදී සියලූ භාණ්ඩ අධිකරණය මඟින් රාජ සන්තක කිරීමටද මහේස්ත්‍රාත්වරයකුට බලය ඇත.

නමුත් රක්ෂිත වනාන්තරයක සංරක්ෂිත වනාන්තරයක මෙන් නොව විෂය භාර අමාත්‍යවරයා විසින් සකස් කළ නියෝග වල විධිවිධාන අනුව බලය ලත් නිලධාරියෙකුගේ අවසරයක් මත සිදු කරන ක්‍රියා වැරදි නොවන බව පනතේ 08 වන වගන්තිය මඟින් දක්වා ඇත. එවැනි අවසරයක් අමාත්‍යවරයා විසින් නිසි බලය පවරන ලද නිලධාරියකු වෙතින් ලබා ගත යුතු අතර ඒ සඳහා නියමිත ගාස්තුවක් අය කළ යුතු අතර, එම ගාස්තුව අමාත්‍යවරයා නියම කරන ලද ගාස්තු ප්‍රමාණයක් වන අතර වනාන්තරවල ක්‍රියා සඳහා අවසර ලබාදීමේදී අයකල යුතු ගාස්තු අංක 2216/34 හා 2021.02.25 දිනැති ගැසට් පත්‍රය මඟින් සංශෝධිත අංක 1600/18 හා 2009.05.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යවරයා නියම කර ඇත.

03. ගම්බද වනාන්තර

යම් වනාන්තර කොටසක් ගම්බද ප්‍රජාවක හෝ ප්‍රජා කණ්ඩායමක ප්‍රයෝජනයට ගම්බද වනයක් ලෙස ගැසට් නිවේදනයක් මඟින් විෂය භාර අමාත්‍යවරයාට ප්‍රකාශයට පත් කළ හැක. මෙම වනාන්තර සම්බන්ධයෙන් එවැනි නියෝග අවලංගු කිරීම, වෙනස් කිරීමටද වන සංරක්ෂණ ආඥා පනතේ 12 වගන්තියේ විෂය භාර අමාත්‍යවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව සිදු කල හැක.

මෙසේ ප්‍රකාශයට පත් කරන ලද ගම්බද වනාන්තර කොටස් ප්‍රජා කණ්ඩායමකට ප්‍රයෝජනය සඳහා ලබාදිය යුත්තේ කෙසේද, ඒ සඳහා පනවන කොන්දේසි, එම වනාන්තර භාවිතා කිරීමේ දී ප්‍රජාව විසින් ඉටු කළ යුතු යුතුකම් ආදී කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නියෝග සකස් කිරීමේ බලය පනතේ 15 වගන්තිය මඟින් ලැබී ඇත. පනතේ 14 වන වගන්තිය මඟින් ගම්බද වනාන්තරයක තහනම් ක්‍රියා දක්වා ඇති අතර,14 වගන්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සකසන ලද නියෝග හා 15 වගන්ති යටතේ පල කරන නියෝග, විධිවිධාන කඩකරන තැනැත්තන් සම්බන්ධව දඩුවම් 17 වන වගන්තියෙන් නියම කර ඇත. ඒ අනුව මෙවැනි වරදකට අධිකරණයේ වරදකරු කරනු ලැබුවෙකු රුපියල් දහසකට නොඅඩු පනස්දහසකට නොවැඩි දඩයක් හා මාස එකක්-අවුරුදු එකකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ එම දඩුවම් දෙකටම යටත්කිරීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇත. වනාන්තරයට සිදු කළ හානිය වන්දි ලෙස අය කිරීමට මෙම වනාන්තරවල ප්‍රතිපාදන නොමැති අතර, අද වන විට මෙම වනාන්තර බොහෝදුරට ක්ෂය වී ගොස් ඇත.

04. සංරක්ෂිත, රක්ෂිත, ගම්බද වනාන්තර හැර වෙනත් වනාන්තර

මෙම කාණ්ඩයට අයත් වනාන්තර ගැසට් මඟින් ප්‍රකාශ කිරීම වන සංරක්ෂණ ආඥා පනත අනුව අවශ්‍ය නොවන අතර, ඉහත සංරක්ෂිත,රක්ෂිත හා ගම්බද වන යන කාණ්ඩ තුනට අයත් නොවන සියළුම රජයේ වනාන්තර මෙම බණ්ඩයට ඇතුලත් වේ. වන සංරක්ෂණ ආඥා පනතේ 20 වගන්තිය යටතේ දක්වා ඇති මෙම වනාන්තර සම්බන්ධයෙන් පුළුල් විග්‍රහයක් කල හැකිය.

වන සංරක්ෂණ ආඥා පනතේ 78 වන වගන්තිය අනුව ''රජය විසින් සුදුස්සක් කල හැකි සියළු ඉඩම්'' වනාන්තර ලෙස අර්ථ දක්වා ඇත. තවද රජයේ ඉඩම් යන්න (454 වන අධිකාරිය වූ) රජයේ ඉඩම් ආඥා පනතේ අර්ථකතනය කරන ලද යම් ඉඩමක් අදහස් වන බව මෙම වන ආඥා පනතේ දක්වා ඇති බැවින් රජයේ ඉඩම් පනතේ ''ඉඩම'' අර්ථ දැක්වීමට අදාලව සියලු රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන සංරක්ෂණ ආඥා පනතේ බලතල ව්‍යාප්තව පවතී. තවද, වන සංරක්ෂණ ආඥා පනතේ 78 වගන්තිය අනුව රජය විසින් සුදුස්සක් කළහැකි ඉඩම් යන්නෙහි - (අ) යම් තැනැත්තෙකු විසින්,

i. යම් නීත්‍යානුකූල ක්‍රමයකින් වලංගුව පවත්නා හිමිකමක් අත්කරගෙන තිබෙන බවට හෝ
ii. රජයේ ඉඩම් අයුතු ලෙස ඈදා ගැනිමේ ආඥාපනත හෝ මායිම් නිරූපණ ආඥාපනත යටතේ රජය විසින් හිමිකම් නොකියන බවට යම් සහතිකයක් රජය විසින් නිකුත් කිරීමේ හේතුවෙන් රජයට විරුද්ධව හිමිකම් අත්කරගෙන තිබෙන බවට හෝ
iii. බ්‍රිතාන්‍ය, ලන්දේසි හෝ ලංකා ආණ්ඩු විසින් හෝ ඒ වෙනුවෙන් නිකුත් කරනු ලැබ නීත්‍යානුකූලව යථා පරිදි ලියාපදිංචි කරන ලිඛිත ප්‍රදානයක් හෝ බද්ධක් යටතේ භුක්ති විඳීමට හිමිකම් ලබා ඇති බවට.
iv. අධිකරණය සෑහීමකට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කරනු ලැබී නම් මිස, වන, මුඩු, හේන් ගොවිතැන් රහිත හෝ පදිංචියක නැති සියලු ඉඩම්.

(ආ) ඉඩම් ආපසු ගැනීමේ ආඥාපනතේ විධි විධාන යටතේ රජය විසින් ආපසු ගන්නා ලද සියලු ඉඩම් සහ 1897 සිට 1903 මුඩු බිම් ආඥාපනත හෝ ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත යටතේ කරන ලද යම් නියමයක් මඟින් රජයේ දේපළ ලෙස ප්‍රකාශ කරනු ලැබූ හෝ රජය අන් ලෙසකින් නීත්‍යානුකූලව හිමිකම්ලත් සියලු ඉඩම් ලෙස දක්වා ඇත.

ඒ අනුව සියලු රජයේ ඉඩම්වල පවතින සියළු ශාක, සතුන් හා වන ද්‍රව්‍ය වල ආරක්ෂාව සඳහා පනතේ 20 වන වගන්තිය යටතේ නීතිමය කටයුතු කල හැකිය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැර වෙනත් රජයේ ආයතන කළමනාකරණය කරන රජයේ ඉඩමක වුවද මෙම අය පනතේ 20 වන වගන්තිය යටතේ ශාක, සතුන් හා වන ද්‍රව්‍ය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු කල හැකිය.

මෙම වෙනත් රජයේ වනාන්තරයක නොකල යුතු ක්‍රියා පනතේ 20 (1) වගන්තියේ දක්වා ඇත. එම වගන්තියේ (අ) සිට (ග) දක්වා තහනම් ක්‍රියා විස්තර කර ඇත. නොකල යුතු ක්‍රියාවක් උල්ලංඝණය කල වරදකට අධිකරණය මඟින් වරදකරුවකු කරන පුද්ගලයෙකුට අවුරුදු දෙකක්

නොයික්මවන බන්ධනාගාර ගත කිරීමක් හෝ රුපියල් පන්දහසක් හා පනස්දාහකට නොඅඩු දඩයක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය ඇත . මෙම වගන්තියේ වැරදි සිදුකිරීමට ආධාර අනුබල දෙන අයෙකුටද පනතේ 20 (2) (1) වගන්තිය යටතේ එම දඩුවමට යටත් වේ. එහෙත් ඉහත වනාන්තරයක පනතේ 22 වගන්තිය යටතේ බලය පවරන ලද නිලධාරියකු විසින් ලබා දෙන ලිඛිත අවසරයක් මත කරනු ලබන ක්‍රියාවක් රීති උල්ලංඝනය කිරීමක් ලෙස නොසලකන බව දක්වා ඇත.

වන සංරක්ෂණ ආඥා පනත මඟින් ඉහත වනාන්තර කාණ්ඩ 04 සඳහා ආරක්ෂාව සැපයීමට ඍජුවම නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර වනාන්තර වල ආරක්ෂාව තහවුරු කිරීමට වනාන්තර වලින් බාහිර පරිසරයේ ක්‍රියාකාරකම් කිහිපයක් නියාමනයට නීති පනවා ඇත. ඒ අතර වන සංරක්ෂණ ආඥා පනතේ 24 සිට 29 දක්වා වගන්ති යටතේ ශ්‍රී ලංකාව තුළ දැව හා දැව නොවන වනජ ද්‍රව්‍ය ප්‍රවාහනය නියාමනය කර ඇත. 24 වන වගන්තිය මඟින් අමාත්‍යවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව අංක 2346 හා 2023.10.08 දින අංක 2346 දරණ ගැසට් පත්‍රය මඟින් හා අංක 1762 හා 2012.06.11 දරන ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද අංක 1548 හා 2008.05.04 දිනැති 2008 අංක 01 දරන කැලෑ නියෝග මඟින් දැව හා වනජ ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධ නියෝග ප්‍රකාශ කර ඇත. එමඟින් වනාන්තර වල දැව හා වනජ ද්‍රව්‍ය සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබා දී ඇත. තවද ශ්‍රී ලංකාව දැව හා දැව නොවන වනජ ද්‍රව්‍ය විදේශ රටවලට අපනයනය සඳහා අංක 2346/ 46 හා 2023.10.08 දිනැති ගැසට් පත්‍රයේ පල කර 2023 අංක 01 දරණ දැව කැලෑ ගස්වල බීජ හා වෙනත් වන නිෂ්පාදන අපනයන නියෝගද ඒ අතර වේ. එමඟින් ශ්‍රී ලංකාවේ වනාන්තර වල පවතින දැව , දැව නොවන නිෂ්පාද ද්‍රව්‍ය හා ජාන සම්පත් වල ආරක්ෂාව තහවුරු කර ඇත.

තවද, වන සංරක්ෂණ ආඥා පනතේ 23 අ සිට 23 ඈ දක්වා වගන්ති මඟින් දිවයින පුරා දැව ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර, අංක 2346/ 02 හා 2023/10/08 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත 2023 අංක 02 දරන වන සංරක්ෂණ (දැව මඩු හා දේපල සලකුණු නියෝග ලියාපදිංචි කිරීමේ නියෝග) මඟින් දැව ව්‍යාපාර පවත්වා ගත යුතු ආකාරය , දැව ව්‍යාපාරවලට දැව නියාමනය සම්බන්ධව නියෝග ප්‍රකාශ කර ඇත. තවද, වන සංරක්ෂණ ආඥා පනතේ 30 සිට 36 දක්වා වගන්ති හා අංක 879/7 හා 1995.07.13 දිනැති ගැසට් පත්‍රයේ පලකර 1995 අංක 01 දරන නියෝග මාලාව අනුව දැව සන්තකයේ තබා ගැනීම නියාමනය කර ඇත. ඉහත නීතිමය ප්‍රතිපාදන තුලින් වනාන්තර වල පවතින ශාක,සතුන්, දැව හා දැව නොවන වනජ ද්‍රව්‍ය වල ආරක්ෂාව සඳහා වනාන්තර වලින් පරිබාහිරව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් නියාමනය කර ඇත.

තවද, වනාන්තර තුල ගවඅයාලය පාලනය සඳහා නීතිමය විධිවිධාන පැනවීම පනතේ 54-57 වගන්ති මඟින් සිදු කර ඇත. වනාන්තර ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබාදීම හා තෑගි අරමුදල් ගෙවීම සඳහා අරමුදලක් පිහිටුවීමට පනතේ ප්‍රතිපාදන පැවතිම තුලින් නිලධාරීන් වනාන්තර ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා දිරි ගැන්වීමට නීතිමය විධිවිධාන පනවා ඇත.

1907 සම්මත කල පනතේ කාර්යයට අතිශයින්ම වෙනස් සංරක්ෂණ ක්‍රියාවලියක් සඳහා විකාශනය වී ඇති වර්තමාන වන සංරක්ෂණ ආඥා පනත මඟින් ශ්‍රී ලංකාව තුල විවිධ පාරිසරික

කලාප වලට අයත් පාරිසරික විවිධත්වයෙන් යුක්ත, ජෛව විවිධත්වයෙන් අනූන ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 29.7% පමණ වන වනාන්තර පද්ධතිය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා මහත් පිටුවහලක් බවට පත්වී ඇත.

නමුත් 2020-2030 නව ජාතික වන ප්‍රතිපත්තියට අනුව කාබන් තිර කිරීම, වනාන්තර තිරසාර කළමනාකරණයට බාහිර පාර්ශව දායක කර ගැනීම, පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම වැනි කරුණුද ඇතුලත් කර සංරක්ෂණය කරමින් පවතින වනාන්තර පද්ධතිය මඟින් පාරිසරික ප්‍රතිලාභ වලට අමතරව පරිසරයට අගතියක් නොවන පරිදි ආර්ථික ප්‍රතිලාභ ලගාකර ගැනීමට අවශ්‍ය ආකාරයට නීති සංශෝධනය කිරීමත් එමඟින් වනාන්තර පද්ධතියේ ලැබෙන ප්‍රතිලාභ රටේ ජාතික ආර්ථිකයට ඉහල මට්ටමක දායකත්වයක් දැක්වීම දක්වා රැගෙන යාම එමඟින් වනාන්තර අවට ජීවත්වන ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු පිණිස වනාන්තර යොදා ගැනීම සඳහා නූතන අවශ්‍යතාවයන්ට අනුව නැවත වන සංරක්ෂණ ආඥා පනත සංශෝධනය විය යුතු බවට හඳුනා ගෙන ඇත.

எம்.எச்.பி.ஹஸ்னா
கல்விப் பீடம்
இலங்கை திறந்த பல்கலைக்கழகம்

அபிவிருத்தி அடைந்து வரும் நாடுகளில் மறைந்து வரும் உயிர்ப்பல்வகைமையும் சட்டங்களின் பங்களிப்பும்

அறிமுகம்

முந்தைய காலங்களைக் காட்டிலும் இருபத்தோராம் நூற்றாண்டில் உயிர்ப்பல்வகைமை இழப்பானது பல்மடங்காகப் பெருகியுள்ளதன் காரணமாக, அத்தியவசியமாகத் தீர்வு காணப்படவேண்டியதொரு பிரச்சினையாக இது தோற்றம்பெற்றுள்ளது. அந்த வகையில் உலகளாவிய ரீதியில் அபிவிருத்தியடைந்து வரும் நாடுகளில் உருவாகியுள்ள சூழலியல் பிரச்சனைகளில் உயிர்ப்பல்வகைமை இழப்பு மிக முக்கியமானதொன்றாக வேரூன்றிக் காணப்படுகிறது. அபிவிருத்தியை நோக்கிப் பயணிக்கக் கூடிய நாடுகளில் இயற்கை சூழலானது பெரும்பாலும் உள்நாட்டு சமூகங்களின் வாழ்வாதாரம், நல்வாழ்வு மற்றும் சுகாதாரம் போன்றவற்றில் நெருங்கிய தொடர்பைக் கொண்டுள்ளது. அதனடிப்படையில், உள்நாட்டு சமூகங்களின் இயற்கை சூழலியல் சார் நிலைத்திருப்பானது உயிர்ப்பல்வகைமையின் போக்கில் மாற்றங்களை ஏற்படுத்துகின்றது. ஆத்தோடு, உயிர்ப்பல்வகைமை இழப்பானது காலநிலை மாற்றத் தாக்கங்களை உருவாக்குதல், விவசாய உற்பத்தி திறனை குறைவடையச் செய்தல், மனித சுகாதாரத்தில் மாற்றங்களை கொண்டு வருதல் போன்ற பல்வேறு எதிர்மறையான தாக்கங்களையும் தோற்றுவிக்கின்றது. உயிர்ச்சூழல் மீதான மனித ஆதிக்கம் பூகோள ரீதியில் வேகமாக அதிகரித்து வருவதன் விளைவாக பில்லியன் கணக்கான உயிரினங்கள் அழிவை நோக்கிய விளிம்பில் உள்ளதாக அறியப்பட்டுள்ளன. இதன் காரணமாகவே 2020 ஆம் ஆண்டிற்கான சுற்றுச்சூழல் தினத்தின் கருப்பொருளாக உயிர்ப்பல்வகைமை தீர்மானிக்கப்பட்டதுடன் மனித வரலாற்றில் முன்னெப்போதும் இருந்ததைக் காட்டிலும் சுமார் ஒரு மில்லியன் அளவிலான விலங்கு மற்றும் தாவர இனங்கள் அழிவடையும் அபாயம் இப்போது கண்டறியப்பட்டுள்ளது (UN Report, 2019). அந்த வகையில் அபிவிருத்தியடைந்து வரும் நாடுகளில் உயிர்ப்பல்வகைமை இழப்புக்கள் எவ்வாறு தாக்கம் செலுத்துகின்றன என்பதையும் அத்தாக்கங்களை இழிவளவாக்குவதில் உயிர்ப்பல்வகைமை சட்டங்கள் எவ்வாறு தொடர்புபடுகின்றன என்பதையும் இக்கட்டுரை மூலம் விரிவாக ஆராய்வோம்.

தற்காலத்தில் உயிர்ப்பல்வகைமை இழப்பு என்ற சொற்பதம் நபருக்கு நபர் பேசப்பட்டாலும் நம் முழு மனித சமூகமும் உயிர்ப்பல்வகைமை பற்றியும் உயிர்ப்பல்வகைமை இழப்பு பற்றியும் தெளிவான விளக்கத்தினை இன்னும் நிதர்சனமாகக் கற்றுக்கொள்ளவில்லை. உயிர்ப்பல்வகைமை எனும் சொல்லானது உயிர் (Bio) மற்றும் பல்வகைமை (Diversity) எனும் இரண்டு சொற்பதங்களை ஒன்று சேர்க்கின்றது. அதாவது மனிதன் உட்பட பூமியில் உயிர் வாழக்கூடிய நுண்ணங்கிகள், தாவரங்கள், விலங்குகள் மற்றும் அனைத்து உயிரியல் கூறுகளின் வாழ்வியல் ஒழுங்குகள் மற்றும் அவற்றின் பன்முகத்தன்மையையே இச் சொல் குறித்து நிற்கின்றது(Rasmiya Niyas & Ruzaik, 2021). அதேபோன்று குறிப்பிட்ட உயிர்ச்சூழல் பகுதியில் மரபணுக்களின் பன்முகத்தன்மை

குறைவடைவது முதல் முழு சுற்றுச்சூழல் அமைப்புக்களின் சரிவு அல்லது இழப்பு வரை பல்வேறு நிலைகளில் ஏற்படக்கூடிய உயிரிழப்பு போன்றவை உயிர்ப்பல்வகைமை இழப்பாக அடையாளப்படுத்தப்படுகின்றன. அத்துடன் உயிர்ப்பல்வகைமை இழப்பானது சுற்றுச்சூழல் அமைப்பு சேவைகளை ஆதரிப்பதுடன் உலகளாவிய பொருளாதாரத்தின் முக்கிய முதுகெலும்பாகவும் செயற்படுகின்றது(Mulhern, 2020).

21 ஆம் நூற்றாண்டில் ஏற்பட்ட உயிர்ப்பல்வகைமை இழப்பு தொடர்பான ஒரு பொதுவான கண்ணோட்டம்

அண்மைய ஆய்வொன்றில், பறவை மற்றும் பாலூட்டி இனங்களுக்கான மொத்த உலக உயிர்ப்பல்வகைமை இழப்பில் அண்ணளவாக 60மூ ஆனவை இந்தோனேசியா, மலேசியா, பபுவா நியூகினியா, சீனா, இந்தியா, அவுஸ்திரேலியா போன்ற அபிவிருத்தியை நோக்கி பயணிக்கும் நாடுகளில் 1996 தொடக்கம் 2008 வரையான காலப்பகுதியினுள் இடம்பெற்றுள்ளதாக கண்டறியப்பட்டுள்ளது. அதேபோன்று மடகஸ்காரில் காடழிப்பு, சுரங்கம் அகழ்தல், காலநிலை மாற்றம் போன்றன காரணிகளால் குறிப்பிடத்தக்க வாழ்விட இழப்பு ஏற்படுத்தப்பட்டு பூர்வீக உயிரினங்கள் அச்சுறுத்தப்படுகின்றன. மேலும் 1996 தொடக்கம் 2008 வரையான காலப்பகுதியினுள் அவுஸ்திரேலியாவில் 5 தொடக்கம் 10மூ வரை உயிர்ப்பல்வகைமை இழப்பு தோற்றுவிக்கப்பட்டுள்ளதுடன் இந்தோனேசியாவில் விவசாயத் தோட்டங்களின் விஸ்தரிப்பானது மழைக்காடுகளை வெகுவாகப் பாதித்து வருகிறது(சுழலயட ளுழஉநைவலஇ 2025). மேற்கூறப்பட்டவற்றைக் கருத்திற்கொண்டு இலங்கையின் உயிர்ப்பல்வகைத் தன்மை மற்றும் அவற்றின் வாழ்விடங்களைப் பாதுகாக்கும் நோக்குடன் 2009ம் ஆண்டின் 22ம் இலக்க விலங்கினங்கள் மற்றும் தாவரங்கள் பாதுகாப்புச் சட்டம் உருவாக்கப்பட்டுள்ளது.

அதேபோன்று இலங்கையில் இதுவரை 72 வகைகளுக்கும் மேற்பட்ட உயிரினங்கள் அழிவடைந்து விட்டதாக இலங்கை சுற்றுச்சூழல் அமைச்சினால் வெளியிடப்பட்ட சிவப்பு அட்டவணை 2012 கையேட்டில் குறிப்பிடப்பட்டுள்ளது. மேலும் IUCN இனால் வெளியிடப்பட்ட சிவப்பு பட்டியலின் பிரகாரம் இலங்கையில் 156 தாவர இனங்களும் 12 விலங்கினங்களும் அழிவை சந்திக்கும் அபாய நிலையில் உள்ளதாகயும் அறியப்படுகின்றது(Dennis Mombauer, 2018). அதேபோன்று ஸ்ரீ ஜெயவர்த்தனபுர லுழரபெ டீழைடழபளைவள யுளளழஉயைவழைஎ மூலம் நடாத்தப்பட்ட ஆய்வொன்றில் இலங்கையில் அச்சுறுத்தலுக்கு உட்பட்டுள்ள உயிரினங்கள் தொடர்பான விபரம் பின்வருமாறு எடுத்துக்காட்டப்பட்டுள்ளது.

அட்டவணை 01 - இலங்கையில் அச்சுறுத்தலை எதிர்நோக்கியுள்ள உயிரினங்கள்

இனங்கள்	இனங்களின் எண்ணிக்கை	அச்சுறுத்தலுக்குள்ளாகியுள்ள வீதம் %
பாலூட்டிகள்	90	16
பறவைகள்	441	05
ஊர்வன	162	43
அம்பிபியா	48	52

மீன்கள் (நன்னீர்)	61	39
பட்டாம்பூச்சிகள்	242	06
வண்டுகள்	540	23

Source - Designed by Author using data of Young Biologists Association (2017)

அதேபோன்று 2019 இல் ஆபிரிக்கா பகுதியில் உள்ள விக்டோரியா ஏரியில் காணப்பட்ட 76% ஆன உள்நாட்டு நன்னீர் மீனினங்கள் அழிவடையும் அபாயத்தில் உள்ளதாக அறியப்பட்டுள்ளன. அத்துடன் சட்டவிரோத வேட்டை மற்றும் சுரங்கத் தொழில் நடவடிக்கைகளால் கொங்கோவில் 87% ஆன கொரில்லாக்களின் எண்ணிக்கையும் குறைவடைந்துள்ளது. அதேபோன்று இந்தியாவில் 3% ஆன பறவை இனங்கள் அழிவை எதிர்நோக்கியுள்ளதுடன் கிழக்கு மற்றும் தென்கிழக்கு ஆசியாவில் 80% க்கும் மேற்பட்ட ஈரநிலங்கள் மனித செயற்பாடுகளால் அச்சுறுத்தலை சந்தித்து வருகின்றன(Mulhern, 2020). இவ்வாறு அழிவடைந்து வரும் நீர்வாழ் உயிரினங்களின் முக்கியத்துவம் கருதி பிராந்திய நீர்நிலைகள் மற்றும் கடற்கரையோரப் பகுதிகளின் மாசடைவைக் கட்டுப்படுத்தல் மற்றும் குறைத்தல் எனும் நோக்கில் சுற்றுச் சூழல் அமைச்சினால் 2008ம் ஆண்டின் 35ம் இலக்க கடல் மாசுபாடு தடுப்புச் சட்டமும் அதேபோன்று கடல் மற்றும் நன்னீர் பயன்பாட்டை ஒழுங்குபடுத்தல், அதிகளவான மீன்பிடித்தல் மற்றும் உயிர்வாழ்விடங்கள் சிதைவடைதலைக் குறைத்தல் போன்ற நோக்கங்களுடன் 1996ம் ஆண்டின் 2ம் இலக்க மீன்பிடி மற்றும் நீர்வாழ் வளச் சட்டமும் உருவாக்கப்பட்டுள்ளன

உயிர்ப்பல்வகைமை இழப்பிற்கான காரணங்கள்

இருபத்தோராம் நூற்றாண்டில் உயிர்ப்பல்வகைமை இழப்பிற்கு மிகப் பிரதானமாக இரண்டு வகையான காரணிகள் பாரியளவில் செல்வாக்கு செலுத்துகின்றன. அவை இயற்கை காரணிகள் மற்றும் மானிடக் காரணிகள் என்ற அடிப்படையில் பாகுபடுத்தப்படுகின்றன. மேற்குறிப்பிட்ட இரண்டு காரணிகளிலும் சூழல் நேயமற்ற மனித செயற்பாடுகளே முக்கியமாக செல்வாக்கு செலுத்துவதாக 2019ஆம் ஆண்டு ஆய்வு கணக்கெடுப்பொன்றில் குறிப்பிடப்பட்டுள்ளது. அதாவது, மனித நடவடிக்கைகளால் 20338 உயிரினங்கள் அழிவடைந்துள்ளதாக இவ் ஆய்வறிக்கையில் எடுத்துக்காட்டப்பட்டுள்ளது. அதேபோன்று உயிர்ப்பல்வகைமையினை அழிக்கும் காரணிகளை எட்வர் வில்சன் எனும் ஆய்வாளர் HIPPO எனும் அடிப்படையில் ஐந்து வகையாகப் பிரித்து விளக்குகின்றார் (Rasmiya Niyas & Ruzaik, 2021).

- அதிகமான அறுவடை (Over harvesting)
- மாசடைதல் (Pollution)
- வாழிடம் அழிவடைதல் (Habitat Destruction)
- ஆக்கிரமிப்பு இனங்களின் அறிமுகம் (Invasive Species)
- மக்கள் தொகை அதிகரிப்பு (Human over pollution)

இவற்றைக் கருத்திற்கொண்டு இயற்கை மற்றும் மானிடக் காரணிகளை தனித்தனியாக இக்கட்டுரையில் கலந்துரையாடுவோம்.

- காலநிலை மாற்றம்

புதைபடிவ எரிபொருட்கள் எரிக்கப்படுவதால் ஏற்படும் பசுமை இல்ல வாயுக்களின் வெளியேற்றம் பரவலாகி காலநிலை மாற்றத்தை தோற்றுவிக்கிறது. தற்போது நிலவிவரக்கூடிய காலநிலை மாற்றமானது உயிரினங்கள் தமது வாழ்விடத்தை விட்டு இடம்பெயர்ந்து வேறோர் இடத்தில் வாழிடத்தை மாற்றியமைக்க முடியாத வகையில் கடுமையாக மாறி வருவதால் பல வகையான உயிரினங்கள் அவற்றுக்கு பொருத்தமற்ற இடத்தில் குடியேறி அழிவடைகின்றன. 2004 ஆம் ஆண்டு நடத்தப்பட்ட ஆய்வொன்றின் படி அடுத்து வரக்கூடிய 50 ஆண்டுகளில் ஏற்படும் காலநிலை மாற்றங்களின் விளைவாக உலகளாவிய ரீதியில் மில்லியன் கணக்கான உயிரினங்கள் அழிவை எதிர்நோக்கும் என்று விஞ்ஞானிகள் மதிப்பிட்டுள்ளனர்(Mulhern, 2020).

- இயற்கை அனர்த்தங்கள்

இயற்கையாக நிகழக்கூடிய வெள்ளம், சுனாமி, மண்சரிவு, நிலநடுக்கம், காட்டுத்தீ போன்ற பல்வேறு இயற்கை அனர்த்தங்களின் விளைவாக உயிர்ச் சூழற்றொகுதி வெகுவாகப் பாதிப்படைகிறது. குறிப்பாக, குறித்த பிரதேசத்துக்கு உரித்துடையதாகக் காணப்படும் தனித்துவ அங்கிகளும் ஏனைய சூழல் சமநிலையை பேணக்கூடிய உயிர்ப்பல்வகைமைத் தொகுதியும் அழிவடைவதில் இயற்கை அனர்த்தங்கள் மூலகாரணியாக செயற்படுகின்றன.

- நிலப் பயன்பாடு

அதிகரித்து வரும் மக்கள் தொகையினால் மக்களின் தேவைகளுக்கேற்ப நிலப்பயன்பாடும் அதிகரித்துவருகின்றது. இதன் விளைவாக குறிப்பிட்ட நிலப் பகுதிகளில் காணப்படக்கூடிய உயிர்ப்பல்வகைமைகள் அழிவடைய நேரிடுகின்றன. குறிப்பாக பயிர் வளர்ப்பு, விவசாயம், கால்நடை வளர்ப்பு, கட்டிட விஸ்தரிப்பு போன்ற பல்வேறு செயன்முறைகளை மையப்படுத்தி நிலங்கள் துண்டாக்கப்படுவதோடு காடழிப்பு நிகழ்வுகளும் இடம்பெறுகின்றன. உலகளாவிய காடழிப்பில் 80மூ ஆனவை விவசாயத்தின் காரணமாகவே நிகழ்த்தப்படுகின்றன.

- மாசடைதல்

உயிர்ச்சசூழற்றொகுதியில் வளங்களை தேவைக்கதிகமாக சுரண்டலுக்குட்படுத்தும் போது சூழற்றொகுதி மாசடைந்து உயிரின அழிவுகள் ஏற்படுகின்றன. உதாரணமாக கடற் சூழற்றொகுதியில் உணவு, வியாபாரம் உட்பட பல்வேறு தேவைகள் கருதி இயற்கை மற்றும் செயற்கை முறைகளில் மீன்பிடி செயற்பாடுகள் இடம்பெறுகின்றன. இவ்வாறு அளவுக்கதிகமான மீன்பிடி நிகழ்வு மேற்கொள்ளப்படும் போது கடற்படுக்கைகளில் கார்பன் சேமிக்கப்படும் திறண் குறைவடைவதால் கடற் சூழற்றொகுதி சமநிலை இழக்கிறது. அத்துடன் மீன்பிடிக்காக கேபிள், வெடிபொருட்கள் போன்றவற்றை பயன்படுத்தப்படும்

போதும் பிளாஸ்டிக் மற்றும் ஏனைய கழிவுகள் உட்பட பல்வேறு அமிலத்தன்மையான பொருட்கள் கடலில் கலக்கின்றன. இவை கடலில் மீன்களுக்கு மாத்திரமன்றி நீர்வாழ் தாவரங்களுக்கும் பாதிப்பை ஏற்படுத்துகின்றன. ஆய்வொன்றின் பிரகாரம் 2050 ஆம் ஆண்டினை அடையும்போது கடலில் மீன்களை விட அதிகமாக பிளாஸ்டிக் காணப்படும் என மதிப்பிடப்பட்டுள்ளது. அதிகளவான மீன்பிடிச் செயற்பாடுகளை மையப்படுத்தி அவற்றைக் கட்டுப்படுத்துவதற்காகவும் கடல் வளப்பயன்பாட்டை ஒழுங்குபடுத்துவதற்காகவும் அதிகளவான மீன்படியினால் ஏற்படும் மீன்களின் வாழிட சிதைவு மற்றும் அழிவைத் தடுப்பதற்காகவும் 1996ம் ஆண்டின் 2ம் இலக்க மீன்பிடி மற்றும் நீர்வாழ் வளச் சட்டமானது இலங்கையில் உருவாக்கப்பட்டுள்ளது.

- ஆக்கிரமிப்பு இனங்கள்

உயிர்ப்பல்வகைமை பெருக்கத்திற்கு மிகப்பெரிய அச்சுறுத்தலாக அமையக்கூடியவை ஆக்கிரமிப்பு இனங்கள் ஆகும். இவை குறிப்பாக உணவு, இடம் மற்றும் ஏனைய வளங்களுக்காக பூர்வீக இனங்களுடன் போட்டியிடுவதால் உயிர்ப்பல்வகைமை குறைவடைந்து செல்கிறது. இதற்கு சிறந்த உதாரணமாக, இயற்கையாக வேட்டையாடி விலங்கு அற்ற சூழலில் பரிணமித்த நியூஸ்லாந்தின் பறவை இனங்கள் தற்போது எலிகள், பூனைகள் போன்ற ஆக்கிரமிப்பு இனங்களால் அச்சுறுத்தலுக்கு உள்ளாகி வருகின்றன(Trails & Roots. (n.d.).

உயிர்ப்பல்வகைமைப் பெருக்கம் ஏன் முக்கியமானது?

பல்வேறு காரணிகளை பின்னணியாகக் கொண்டு அழிவடைந்து வரும் உயிர்ப்பல்வகைமை ஏன் முக்கியத்துவம் பெறுகின்றது என்பதன் அடிப்படையில் ஆராயும் பொழுது கருத்தில் கொள்ளப்பட்ட விடயங்களை பின்வரும் வகையில் தொகுத்து நோக்குவோம்

- **மண் ஆரோக்கியம்** - இறந்த தாவரங்கள், விலங்குகள், நுண்ணங்கிகள், பிரிகையாக்கிகள் மூலமாக மண் ஆரோக்கியமானது வளப்படுத்தப்பட்டு ஏனைய தாவரங்களின் நிலைத்திருப்புக்கு அவசியமான ஊட்டச்சத்தை வழங்குவதில் உயிர்ப்பல்வகைமை முக்கிய பங்கு வகிக்கிறது.எனவே நமக்கு கிடைக்கப் பெறும் உணவு அதிக ஊட்டச்சத்துக் கொண்டதாக அமைய உயிர்ப்பல்வகைமை பெருக்கம் இன்றியமையாதது.
- **மனித ஆரோக்கியம்** - மனிதனுடைய உடல் மற்றும் உள ஆரோக்கியத்தில் உயிர்ப்பல்வகைமைப் பெருக்கம் நிறைந்த இடங்களானவை முக்கிய பங்கு வகிக்கின்றன. அதாவது இயற்கை பொருந்திய குளிர்ச்சிகரமான சூழலில் வாழும் போது மன உளைச்சல் மற்றும் இரத்த அழுத்தம் குறைவடைந்து நிம்மதியான மனித சுகாதாரத்துக்கு வழிவகுக்கின்றது.
- **மகரந்த சேர்க்கை** - அனைத்து பூக்கும் தாவரங்களிலும் 75மூ தொடக்கம் 95மூ வரையான மகரந்த சேர்க்கை செயற்பாட்டிற்கு தேனீக்கள், பட்டாம்பூச்சிகள், பறவைகள் மற்றும் பிற பூச்சிகள் போன்ற மகரந்த சேர்க்கையாளர்களையே நம்பியுள்ளன. மனிதர்கள் மட்டுமன்றி ஏனைய உயிரினங்களின் உணவுக்கு அவசியமான பல்வேறு உணவு வகைகள் இத்தகைய மகரந்தச் சேர்க்கை நடைபெறும் பூக்கும்

தாவரங்கள் மூலமே கிடைக்கப் பெறுகின்றன.

- **மீள்தன்மையைக் கட்டியெழுப்புதல்** - அதாவது மரங்கள், அடர்ந்த புல்வெளிகள், ஈரநிலங்கள் போன்றவை இயற்கையாகவே மழை நீரை உறிஞ்சிக் கொள்ளக்கூடிய தன்மை கொண்டிருப்பதால் வரட்சியின் போது வறண்டு செல்லாமல் ஈரலிப்பை பேணக் கூடிய விதத்திலும் வெள்ளப்பெருக்கை தடுக்கக்கூடிய விதத்திலும் முக்கியமாக காபனீரொட்சைட்டை உறிஞ்சுவதன் மூலம் காலநிலை மாற்றத்திற்கு எதிராகப் போராடுவதிலும் முக்கிய பங்காற்றுகின்றன. அதேபோன்று கடல்கோள் அனர்த்தங்களை கட்டுப்படுத்துவதில் பவளப்பாறை போன்ற உயிர்ப்பல்வகைமையின் நிலைத்திருப்பு முக்கிய பங்கு வகிக்கின்றது.

உயிர்ப்பல்வகைமைப் பாதுகாப்பு தொடர்பான சட்டங்கள்

இவ்வாறு உயிர்ப்பல்வகைமையானது பல்வேறு கோணங்களிலும் முக்கியமான சூழற்றொகுதி அங்கமாக இருப்பதன் காரணமாகவே இலங்கையில் உயிர்பல்வகைமைப் பெருக்கத்தைப் பாதுகாக்கும் நோக்கில் கீழ் குறிப்பிடப்பட்டுள்ள பல்வேறு சட்டங்கள் சுற்றுச்சூழல் அமைப்பினால் உருவாக்கப்பட்டுள்ளன.

- 2009ம் ஆண்டின் 22ம் இலக்க விலங்கினங்கள் மற்றும் தாவரங்கள் பாதுகாப்புச் சட்டம்
- 2008ம் ஆண்டின் 35ம் இலக்க கடல் மாசுபாடு தடுப்புச் சட்டம்
- 1979ம் ஆண்டின் 56ம் இலக்க காடுகள் மற்றும் மரங்கள் வெட்டுதல் அல்லது கொண்டு செல்லுதல் தொடர்பான காடுகள் கட்டளை சட்டம்
- 1907ம் ஆண்டின் 2ம் இலக்க விலங்கினங்கள் மற்றும் தாவர பாதுகாப்பு கட்டளை சட்டம்
- 2011 ஆண்டின் 49ம் இலக்க கடற்கரை பாதுகாப்பு சட்டம்
- 1996ம் ஆண்டின் 2ம் இலக்க மீன்பிடி மற்றும் நீர்வாழ் வளச் சட்டம்

உயிர்ப்பல்வகைமை அழிவைத் தடுப்பதற்கான வழிமுறைகள் - உயிர்ப்பல்வகைமை இழப்பை ஊக்குவிப்பதில் முக்கியமாக இயற்கை மற்றும் மானிடக் காரணிகளின் பின்புலம் காணப்பட்ட போதிலும் நிலைபேண் அபிவிருத்தி இலக்குகளின் 15வது இலக்கான டுகைந ழடுயனெ ஐ மையமாக வைத்து சூழல் நேயமான செயற்பாடுகளை மக்கள், சமூகங்களுக்கு மத்தியில் கொண்டு வருவதன் மூலமாக முற்றுமுழுதாக உயிர்ப்பல்வகைமை இழப்பை தடுக்க முடியாவிட்டாலும் இயன்றளவு குறைத்து பல்லுயிர்ப் பெருக்கத்தை பாதுகாக்கவும் அழிவின் விளிம்பிலிருந்து மீட்டெடுக்கவும் துணையாக அமையக்கூடிய விதத்தில் பின்வரும் வழிமுறைகளை அடையாளப்படுத்தலாம்.

உயிர்ப்பல்வகைமை தொடர்பான ஆய்வு மற்றும் ஆராய்ச்சிகளை மேற்கொள்ளல் - உயிர்ப்பல்வகைமை தொடர்பான ஆய்வுக் கட்டுரைகள், சஞ்சிகைகள் மற்றும் ஆய்வு மாநாடுகளில் உயிர்ப்பல்வகைமையின் முக்கியத்துவம், அதனைப் பாதுகாப்பதற்கான வழிமுறைகள் போன்ற பல்வேறு விடயங்கள் தொடர்பாக தகவல்களை பிரசுரிக்கும் போது மக்கள் மத்தியில் ஒரு எண்ணப்பாடு விருத்திபெறும்.

விழிப்புணர்வு நடவடிக்கைகளை மேற்கொள்ளல் - பாடசாலை முதல் பல்கலைக்கழகம் வரை ஒவ்வொரு உயிரினமும் சூழலுக்கு முக்கியம் வாய்ந்தவை, அதனைப் பாதுகாக்க வேண்டும் எனும் கருப்பொருளை பாடத்திட்டங்கள், பயிற்சிப்பட்டறைகள், குழுக் கலந்துரையாடல்கள் மூலமாக சர்வதேச தினங்களை மையப்படுத்தி விழிப்புணர்வுகளை மேற்கொள்ளும் போது உயிர்ப்பல்வகைமை பாதுகாப்பு மேம்படுத்தப்படும்.

மீள்காடாக்கத்துக்கு வழியேற்படுத்துவதன் மூலம் காடழிப்பை தடுப்பதற்கான உத்திகளைக் கையாளுதல் - முக்கியமாக உயிர்ப்பல்வகைமை இழப்பில் காடழிப்பே அதிக செல்வாக்கு செலுத்துகிறது. அதாவது காட்டுப் பரப்பினுள் காணப்படக்கூடிய அதிகளவான உயிரின இழப்பைக் கட்டுப்படுத்த காடழிப்பைத் தடுத்து மீள்காடாக்கத்துக்கு ஊக்குவிப்புக்களை வழங்கும்போது உயிர்ப்பல்வகைமை பெருகியுள்ள நிலத்தில் நிலத்துண்டாட்டங்கள் மற்றும் கட்டிட விஸ்தரிப்பு போன்றவை குறைக்கப்பட்டு உயிர்ப்பல்வகைமை பாதுகாக்கப்படும்.

நடைமுறையில் உள்ள அரச சட்டங்களை வலுப்படுத்தல் - தேசிய ரீதியில் உயிரினங்களைப் பாதுகாப்பதற்கான சட்டங்கள் போதியளவு உருவாக்கப்பட்டிருந்தாலும் சட்டவிரோத விலங்கு வர்த்தகம், வேட்டையாடல், வளச்சுரண்டல் போன்றவற்றால் சட்டங்கள் மீறப்படுகின்றன. இலங்கையில் விலங்கின மற்றும் தாவர பாதுகாப்பு சட்டம், கடல் மாசுபாடு சட்டம், கடற்கரையோர பாதுகாப்பு சட்டம், காடுகள் கட்டளை சட்டம், மீன்பிடி மற்றும் நீர்வாழ் வளச் சட்டம் போன்றவை அமுல்படுத்தப்பட்டு இருந்தாலும் மக்கள் செயற்பாட்டில் கொண்டு வருவது குறைவாக காணப்படுகிறது. எனவே ஏற்கனவே நடைமுறையில் உள்ள சட்டங்களை வலுப்படுத்தி முறையான செயற்பாட்டிற்கு கொண்டு வரும்போது உயிர்ப்பல்வகைமை அழிவைக் கட்டுப்படுத்தலாம்.

முடிவுரை

உலகளாவிய ரீதியில் நோக்கும் போது உயிர்ப்பல்வகைமை என்பது சூழற்தொகுதியில் பிரதான அங்கமாக விளங்குகிறது. அந்தவகையில் சூழற்தொகுதி முறையாக இயங்குவதற்கு உயிர்ப்பல்வகைமையின் நிலைப்பேண் தன்மை முக்கியமாக காணப்படுகிறது. அதிலும் குறிப்பாக அபிவிருத்தியை நோக்கி பயணிக்கும் நாடுகளில் அபிவிருத்தி செயற்பாடுகளை முன்னிலைப்படுத்தி அதிகமாக உயிர்ப்பல்வகைமை பெருக்கமுள்ள இடங்கள் அழிக்கப்படுகின்றன. அதனால் மீண்டும் உயிரின சூழற்றொகுதிக்கு ஏற்படக்கூடிய சவால்களை முறியடிக்கவும் இயற்கை சூழலின் நிலைப்பேண் தன்மையைக் கட்டியெழுப்பவும் சிறந்த தீர்வுகளை நடைமுறைப்படுத்தி முக்கியமாக மேற்குறிப்பிட்ட உயிர்ப்பல்வகைமையுடன் தொடர்புபட்ட 2009ம் ஆண்டின் 22ம் இலக்க விலங்கினங்கள் மற்றும் தாவரங்கள் பாதுகாப்புச் சட்டம், 2008ம் ஆண்டின் 35ம் இலக்க கடல் மாசுபாடு தடுப்புச் சட்டம், 1979ம் ஆண்டின் 56ம் இலக்க காடுகள் மற்றும் மரங்கள் வெட்டுதல் அல்லது கொண்டு செல்லுதல் தொடர்பான காடுகள் கட்டளை சட்டம், 1907ம் ஆண்டின் 2ம் இலக்க விலங்கினங்கள் மற்றும் தாவர பாதுகாப்பு கட்டளை சட்டம், 2011 ஆண்டின் 49ம் இலக்க கடற்கரை பாதுகாப்பு சட்டம், 1996ம் ஆண்டின் 2ம் இலக்க மீன்பிடி மற்றும் நீர்வாழ் வளச் சட்டம் போன்ற சட்டங்களை முறையாக மக்கள் மத்தியில் வலுப்படுத்தி உயிர்ப்பல்வகைமைப் பாதுகாப்பில் நாம் அனைவரும் ஒன்றிணைவோம்.

உசாத்துணைகள்

- Biodiversity: Bee Kind to Nature. Trails & Roots. Retrieved September 2, 2025, from https://www.trailsandroots.com/biodiversity-bee-kind-to-nature.html
- Dennis, M. (2018). Beleaguered Biodiversity: Protecting Sri Lanka's Unique wildlife. Viewed 2020.06.15. http://slycantrust.org/post/beleaguered-biodiversity-protecting-sri-lankas-uniquewildlife?utm_source=chatgpt.com
- Mulhern, O. (2020, December 4). The Statistics of Biodiversity Loss [2020 WWF Report]. Earth. Org. Retrieved from https://earth.org/data_visualization/biodiversity-loss-in-numbers-the-2020-wwf-report/
- Rasmiya, N., & Ruzaik, F. (2021). 21k; E}w;whz;bNyw;gl;l capu;g;gy;tifik ,og;Gf;fs; gw;wpaNjhu; kjpg;gPl;lha;T [An assessment of biodiversity loss in the 21st century]. Kalam, 14(1), 104–120. South Eastern University of Sri Lanka. Retrieved from http://ir.lib.seu.ac.lk/bitstream/123456789/5623/1/10.%20K2021%20%28104-120%29.pdf
- United Nations (2019). Nature's Dangerous Decline 'Unprecedented': Species Extinction Rates 'Accelerating'. UN Report, viewed 2020.05.16. https://www.un.org/sustainabledevelopment/blog/2019/05/nature-declineunprecedented-report/?utm_source=chatgpt.com
- Young Biologists Association Sri Lanka. (2008). Environment Lanka. https://www.environmentlanka.com

ආචාර්ය සී.කේ.මුතුමාල
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ, සංවර්ධන හා ප්‍රහුණු)
රාජ්‍ය දැව සංස්ථාව.

ශ්‍රී ලංකාවේ ආනයනික දැව නියාමනය කිරීමේ අවශ්‍යතාවය.

වාර්ෂික ජනගහන වර්ධනය හා පශ්චාත් යුධ සමය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ ශීඝ්‍ර වර්ධනය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ වාර්ෂික දැව ඉල්ලුම වැඩි වී ඇත. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජාතික වන කළමනාකරණ සැලැස්ම මඟින් 2020 වසර සඳහා ඝන මීටර් ලක්ෂ 8.8 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ ශ්‍රී ලංකාවේ ඉරු දැව ඉල්ලුම මේ වනවිට එම ප්‍රමාණය ඉක්මවා ඇතැයි උපකල්පනය කළ හැකිය. තාවකාලික තීරණයක් ලෙස ශ්‍රී ලංකාවේ අඩි 5000 න් ඉහළ වන වගා හෙළීම පාලනය, වන වගා භූමි ස්වාභාවිකරණය ලක් කිරීම, ඇතැම් වන වගා වල ඇති අඩු නිෂ්පාදන ධාරිතාවය හා අනෙකුත් දැව සම්පත් වල හිඟතාවය හේතුවෙන් ශ්‍රී ලංකාවේ දැව ඉල්ලුම සපුරාලීම දුෂ්කර කර්තව්‍යයක් බවට පත්වී ඇත. මේ හේතු කොට ගෙන වාර්ෂික දැව ආනයනය ඉහල ගොස් ඇති අතර විශාල ආනයන පිරිවැයක් මේ සඳහා වාර්ෂිකව වැය කිරීමට සිදුව ඇත. එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රකාශන අනුව ශ්‍රී ලංකාවේ ඉරු දැව ආනයන පමණක් 2013 වසරට සාපේක්ෂව 2017 වසරේදී 192% කින් (ඝන මීටර් 48,000 පමණ) වර්ධනය වී ඇත. එම වාර්තාව අනුව 2013 වසරේ ආනයනය කළ ඉරු දැව ප්‍රමාණය ඝන මීටර් 25,000 පමණ වූ නමුත් එය 2017 වසරේදී ඝන මීටර් 73,000 කි. මෙම ආනයනික දැව තොග වැඩි වීම හමුවේ එම දැවවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමිතීන් සම්බන්ධව පැන නැගී ඇති ගැටළු හා සබැඳිව විද්වත් කතිකාවතක්ද මේ වනවිට ගොඩනැගී ඇත (FAO, 2018).

දැව යනු පරිසර හිතකාමී, බහුකාර්යශීලී හරිත ගොඩනැගිලි ද්‍රව්‍යයක් ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ දැව වර්ග 400 කට වැඩි ප්‍රමාණයක් පවතින අතර, ඒවායේ භෞතික ගුණ හා පටක විද්‍යාත්මක ව්‍යුහයන් වල විශාල විවිධත්වයක් පෙන්වයි. එබැවින්, ලී වර්ග හඳුනාගැනීම එහි සැබෑ බව තහවුරු කිරීම ඉතා වැදගත් වේ. (Muthumala, and Amarasekaral;2013a; Wiedenhoeft,2019) පාරිභෝගිකයින්ට නිවැරදිව ලී වර්ග හඳුනාගත නොහැකි බැවින් ඔවුන් පහසුවෙන් ව්‍යාජ වෙළඳුන් හට හසුවීමේ ඉඩකඩ පවතී.





ආනයනික දැව වල ප්‍රමිතීන් සම්බන්ධව ඇති අඩුලුහුඩුකම් හා ඇතැම් ආනයනික දැව අලෙවිකරුවන් විසින් සිදු කරන පාරිභෝගික ජනතාව මුළා කිරීම් සම්බන්ධ සිද්ධීන් රාජ්‍ය දැව

සංස්ථාවේ පර්යේෂණ අංශය විසින් නිරීක්ෂණ කර ඇත. දැව පාරිභෝගිකයන්ගේ ඉල්ලීම පරිදි රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදු කරනු ලබන දැව සහතික කිරීමේ පරීක්ෂණ වල දත්ත අනුව 2012 - 2017 කාලය තුළ සිදු කළ පරීක්ෂණ අතරින්, පාරිභෝගිකයන් බලාපොරොත්තු වූ දැව වර්ගය හෝ දැව ගුණාංග නොතිබූ දැව අතරින් 72% ක්ම ආනයනික දැව වර්ග බවට වාර්තා වී ඇත. එම පරීක්ෂණ වාර්තා වලට අනුව ''බලව්'' වැනි ආනයනික දැව විශේෂ වල නිරවද්‍යතාවය ඉතා අවම බවද පෙනී ගොස් ඇත (Siriwardena, and Muthumala, 2018). පරිදි රාජ්‍ය දැව සංස්ථාව විසින් දැනට ප්‍රධාන වශයෙන් ආනයනය කරනු ලබන දැව විශේෂ 13 පමණ හඳුනා ගෙන ඇති අතර ඒවා වගුව 01 හි දක්වා ඇත.

වගුව 01. ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් ආනයනය කරනු ලබන දැව විශේෂ හා ඒවාගේ ගති ලක්ෂණ

අංකය	විශේෂය	උද්භිද විද්‍යාත්මක නම	වෙනත් නම්	දැව ඝණත්වය (ඝන මීටරයට කිලෝග්‍රෑම්)	දැව කාණ්ඩය
1	බලව්	Shorea spp.	සෙලගත් බටු	850-1155	ඉතා තද දැව
2	කෙකටොන්ග්	Cynometra spp.	කැටොන්ග්-කැටොන්ග්	880-1155	ඉතා තද දැව
3	-	Shorea spp.	සෙලන්ගන් බටු	-	ඉතා තද දැව
4	රිසක්	Vatica spp.	Vatica spp' & Cotylelobium spp'	655-1155	ඉතා තද දැව
5	ඇලන් බටු	Shorea albida	සින්ගවන් බටු	800-925	මධ්‍යම තද දැව
6	කන්ඩිස්	Garcinia spp.	ලූලායි	690-1120	මධ්‍යම තද දැව
7	කපුර්	Dryobalanops spp.	Dryobalanops spp	575-815	මධ්‍යම තද දැව
8	කසායි	Pometia spp.	සරවත්	735-915	මධ්‍යම තද දැව
9	කුලීම්	Scorodocarpus borneensis	උන්ග්සුනාන්	640-975	මධ්‍යම තද දැව
10	කෙම්පස්	Koompassia malaccensis	-	770-1120	මධ්‍යම තද දැව
11	කෙරුන්ජි	Dipterocarpus spp	-	690-945	මධ්‍යම තද දැව
12	තුලාන්ග්	Koompassia excelsa	-	800-865	මධ්‍යම තද දැව
13	මෙරන්ති	Shorea uliginosa	ඔබාර් සුලක්	560-865	සැහැල්ලු තද දැව





පාරිභෝගිකයන් බලාපොරොත්තු වූ දැව වර්ගය හෝ ගුණාංග නොතිබූ දැව ඉදිකිරීම් සඳහා යොදා ගැනීමේදී එම ඉදිකිරීම් වල කල් පැවැත්ම හා ප්‍රමිතිය පිළිබඳ ගැටළු රාශියක් පැන නගින අතර එම ඉදිකිරීම් සඳහා ආයෝජනය කරනු ලබන විශාල මුදල් ප්‍රමාණයක් අපතේ යාමක්ද සිදුවේ. ඇතැම් දැව ආනයන කරුවන් දැව තොග ගෙන්වීමේදී විවිධ ප්‍රමිතීන්ගෙන් හා වර්ගයන්ගෙන් යුතු දැව මිශ්‍ර තොග ලෙස ආනයනය කරනු ලබන අතර එහි අරමුණ වන්නේ එසේ ප්‍රමිතිකරණය නොවූ දැව ප්‍රමිතිකරණය වූ ගුණාත්මයෙන් ඉහළ දැව ලෙස හඳුන්වා දී දේශීය වෙළඳ පොලේ ලාභය වැඩි කරගැනීම බව හඳුනා ගත හැකිය. දේශීය පාරිභෝගිකයන් හට මෙම දැව විශේෂ හෝ ඒවාගේ ප්‍රමිතීන් හඳුනා ගැනීමේ හැකියාවක් නොමැති අතර එම නිසා ඔවුන් පහසු රැවටීමකට ලක්විය හැකිය. මෙහි ඇති සෘජු හා වක්‍ර ආර්ථික හානිය ජාතික මට්ටමට පවා බලපාන අතර ඒ හේතුවන් බොහෝ රටවල් ආනයනික දැව නියාමනය සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර ඇත.

අනීතික දැව වෙළඳාම ලොව පුරා විශාල පරිසර, ආර්ථික සහ සමාජමය බලපෑම් ඇති කරන ගෝලීය ගැටළුවකි. වෙළඳාමේදී, සමහරුන් විසින් නියමිත සම්මතයට නොමැති අවම ගුණාත්මක ලී පාරිභෝගිකයන්ට විකුණනු ලබයි. බාහිර පෙනුමෙන් පාරිභෝගිකයින්ට නියමිත ලී වර්ග හඳුනාගැනීමට නොහැකි බැවින් ඔවුහූ පහසුවෙන් වංචාවට ලක්වෙති. ශ්‍රී ලංකාවේ පවතින දැව විශේෂවල විශාල විවිධත්වයක් දක්නට ලැබේ. ((Muthumala, and Amarasekara, 2013b) මෙම ගැටළුව අවම කිරීමට, සම්මත දැව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් අවශ්‍ය වේ. මේ සඳහා රාජ්‍ය දැව සංස්ථාවට අංක 158/7 හා 2008.02.25 දිනැති විශේෂ ගැසට් නිවේදනයක් මගින් එවැනි වාර්තා නිකුත් කිරීමට බලය ලබාදී ඇත.

ශ්‍රී ලංකාවේ භාවිතා වන දේශීය හා ආනයනික දැව වර්ගවල නිවැරදි බව (Authenticity) විමර්ශනය කිරීමට 2021 සිට 2023 දක්වා කාලය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් නිකුත් කරන ලද දැව හඳුනාගැනීමේ වාර්තා 190 ක් අධ්‍යයනයට ලක් කළ අතර, එමගින් දැව වර්ගවල නිවැරදි භාවය විමර්ශනයට ලක් කරන ලදි.



එම පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සමස්ත දැව සාම්පල 190 කින් පරීක්ෂා කළ දැව සාම්පල 145 ක් දේශීය දැව වර්ගවලට අයත් වූ අතර ආනයනික දැව වර්ග ප්‍රමාණය 45 ක් විය. සමස්ත දැව විශේෂ සංඛ්‍යාව 46 ක් වූ අතර ඉන් 38 ක් දේශීය විශේෂ විය. ඉන් දේශීය දැව වර්ග 08 ක් පරිශීලකයන් විසින් 100% නිවැරදිව හඳුනාගෙන තිබුණි. ඒවා නම්, ඩොන්ගා (Donga), ඉඹුල් (Imbul), කොස් (Jack), මිල්ල (Milla), පාරමාර (Paramara), පෙලෙන් (Pelen), ටූනා (Toona)හා යකහලූ (Yakahalu) වේ. නමුත් ඇකේෂියා (Acacia), බැදිදෙල් (Bedidell), ග්‍රාන්ඩිස් (Grandis), හොර (Hora), කුඹුක් (Kumbuk), මැහෝගනී (Mahogany), ආදී දැවවල නිවැරදිතාවය නිසි ලෙස හඳුනාගෙන නොතිබුණි. ඇකේෂියා (Acacia), තේක්ක (Teak) ලෙසත් , බැදිදෙල් (Bedidell), කොස් (Jack)ලෙසත්, ලියන් (Liyan), දුන් (Dun) ලෙසත් ව්‍යාජ ලෙස ආනයන දැව අලෙවිකර තිබුණි. එම වර්ග 8 අතර, මර්බෝව් (Merbau) පමණක් 100% නිවැරදිව හඳුනාගෙන තිබුණි. කෙම්පස් සහ තුලාන් සඳහා නිවැරදි ප්‍රතිශතය අඩු වී ඇති බව නිරීක්ෂණය විය. (21.05% සහ 26.67%). බිටිස් (Bitis), කෙම්පස් (Kempas) ලෙස වැරදිව දක්වා තිබුණි. මෙම ප්‍රතිඵල අනුව, දේශීය හා ආනයන දැව වර්ග දෙකම ව්‍යාජ ලෙස අලෙවි කර ඇති බව නිරීක්ෂණය වේ. දේශීය වර්ගවල සත්‍යතාව ආනයන වර්ගවලට වඩා ඉහළ බවද මේ අනුව පෙනී යයි. (Muthumala, and Amarasekara, 2013· Muthumala at,al,2025) දේශීය දැව විශේෂ අතරින් ගෘහ භාණ්ඩ නිෂ්පාදණය සඳහා බහුලවම භාවිතාවන්නේ තේක්ක (Teak) දැවය වේ. (Siriwardana, and Muthumala, 2020) සමහර වෙළෙන්දෝ පාරිභෝගිකයින්ට නොදැනුවත්ව පහත් ගුණාත්මයේ දැව විකුණති. එමනිසා ඉදිකිරීම් සඳහා භාවිතා කිරීමට පෙර, බලයලත් ආයතනයක දැව ආදර්ශ පරීක්ෂා කරමින් සැබෑ බව තහවුරු කළ යුතුය.

දැව හඳුනා ගැනීම සම්බන්ධව ක්‍රියාකාරී හා විශේෂඥතාවය ඇති රාජ්‍ය ආයතනය රාජ්‍ය දැව සංස්ථාව වන බැවින් ආනයනික දැව නියාමනය කිරීම සඳහා අනෙකුත් ආයතන සමඟ මැදිහත්ව කටයුතු කිරීම සුදුසු බව කෝප් කමිටුවේ සාකච්ඡා වී ඇත. දැනටමත් පාරිභෝගික



ජනතාවගේ ඉල්ලීම පරිදි ඔවුන් විසින් යොමු කරනු ලබන දැව සාම්පල පරීක්ෂා කර තහවුරු කිරීමක් සිදුකර රාජ්‍ය දැව සංස්ථාව විසින් දැව වාර්තා නිකුත් කරමින් පැවතුනත් එම ක්‍රියාවලිය සමස්ථ දැව ආනයන ක්‍රියාවලියම නියාමනය සඳහා ප්‍රමාණවත් නොවේ.

මේ සියලු කාරණා සළකා බැලීමේදී ආනයනික දැව නියාමනය කිරීම සඳහා නියාමන ආයතනයක් පිහිටුවීම වැදගත් වගකීමක් සහිත කාර්යක් බව පෙනී යයි. එබැවින් මෙම ක්‍රියාවලියට මැදිහත් වීමටත්, විශේෂයෙන් ආනයනික දැව නියාමනය සඳහා අදාළ අනෙකුත් ආයතන හා සම්බන්ධ වී ආනයනික දැව නියාමනයට අවශ්‍ය ප්‍රමිතිමාන තෝරා ගැනීමටත් ඉදිරියේදී කටයුතු කිරීම අදාල වගකීව යුතු ආයතනවල වගකීමක් වේ.

දැව නියාමන ඒකකයකින් පහත අරමුණු ඉටු කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ.

1. ආනයනකරුවන් ඉදිරිපත් කරන ආනයනික ලේඛණ වල සඳහන් දැව විශේෂ පමණක් ඊට අදාළ භෞතික තොග වල ආනයනය කර ඇති බවට සහතික කිරීම.

2. ආනයනකරුවන් ඉදිරිපත් කරන ආනයනික ලේඛණ වල සඳහන් දැව වල ප්‍රමිතිමාන ඊට අදාළ තොග භෞතික තොග වල ආනයනය කර ඇති බවට සහතික කිරීම.

3. ආනයනික දැව අලෙවිකරුවන් විසින් පාරිභෝගිකයන් නොමඟ යැවීමට ඇති අවස්ථා තුරන් කිරීම.

4. ආනයනික දැව සඳහා වන ප්‍රමිතිමාන වැඩිදියුණු කිරීම සඳහා HS Code පිළිබඳ සැලකිලිමත් වීම.
5. විවිධ භාවිතයන් සඳහා එක් එක් ආනයනික දැව විශේෂවල ඇති යෝග්‍යතාවය නිර්ණය කර වර්ගීකරණය වැඩි දියුණු කිරීම.

ආනයනික දැව නියාමන ඒකකයක් (Imported Timber Regulatory Unit) සතු විය යුතු මූලිකාංග

- ආනයනික දැව නියාමන ඒකකය රාජ්‍ය දැව සංස්ථාව ඇතුළු අනෙකුත් අදාළ ආයතන ඒකාබද්ධව පිහිටුවීම සුදුසු අතර එය මූලිකවම පරිසර අමාත්‍යාංශය යටතේ නියාමනය වීම සුදුසු බව.
- රාජ්‍ය දැව සංස්ථාවේ දැව අලෙවිකරණ ක්‍රියාවලියෙන් රාජ්‍ය දැව සංස්ථාව සතු විශේෂඥතාවය දැව සහතිකරණය සඳහා ඇති නීතිමය අවසරය 1538/7 ඃ අංක දරණ හා 2008.02.25 දිනැති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය දැව සංස්ථාව වෙත පිරිනමා ඇති බැවින් මූලිකත්වය රාජ්‍ය දැව සංස්ථාවට ලබාදීම.
- යෝජිත ආනයනික දැව නියාමන ඒකකය පිහිටුවීම, පවත්වා ගෙන යාම, සංවර්ධනය කිරීම හා විශේෂඥතාවය සැපයීම යන කරුණු සඳහා සහ එම ක්‍රියාවලීන් සඳහා දැරීමට සිදුවන පිරිවැය ආවරණය කරගැනීමට සෑම දැව සහතිකරණයක් සඳහාම යම් සාධාරණ අය කිරීමක් සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම සහ අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කර බදවා ගැනීම.
- ආනයනික දැව නියාමනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ආනයන - අපනයන පාලන දෙපාර්තමේන්තුව හා අදාළ අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.
- යෝජිත ආනයනික දැව නියාමන ඒකකය විශාල මෙහෙයුම් විභවයක් ඇති වරායන් ආශ්‍රිතව පිහිටවීම සුදුසු බව.
- එක් එක් ආයතන සඳහා අදාළ මාර්ගෝපදේශ සහ වගකීම් සකස් කිරීම.
- රේගුවේදී දැව පරීක්ෂණ සඳහා අහඹු පරීක්ෂණ සිදු කිරීම සඳහා කඩිනම් ක්‍රමවේදයන් සැකසීම.
- ආනයනික දැව අලෙවි කරන නියෝජිත ආයතන වරින් වර ස්ථානීය පරීක්ෂාවට ලක් කිරීම සඳහා එම සියළු ආයතන පුවත්පත් දැන්වීමක් පළකර ලියාපදිංචි කර ගැනීම සහ ඉන් අනතුරුව වරින් වර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.
- දැව වර්ග නිවැරදි ලෙස අලෙවි නොකරන ආයතන පිළබඳ පාරිභෝගික සේවා අධිකාරියේ මැදිහත් වීම සිදු කිරීම සහ ඉදිරි පියවර ගැනීම.
- දැව පරීක්ෂණ සඳහා සහ ලියාපදිංචිය සඳහා ගාස්තු තීරණය කිරීම.
- දැව නියාමන ඒකකයක් / අධිකාරියක් පිහිටුවීම සඳහා ගැසට් මඟින් සහ කැබිනට් පත්‍රිකා මඟින් අනෙකුත් අනුමැතීන් ලබා ගැනීම.

ආශ්‍රිත ප්‍රකාශන හා ග්‍රන්ථ

- FAO, 2018. Forest Products, Food and Agriculture Organization of the United Nations
- Forest Dept, 1995, Forestry Sector Master Plan, Forest Department, Sri Lanka
- Muthumala C.K, and Amarasekara, H.S., 2013a. Construction of dichotomous key for common local & imported timber species in Sri Lanka. Proceedings of the International Forestry & Environmental Symposium-2013, USJP. p.72.
- Muthumala C.K. and Amarasekara, H.S., 2013b. Investigation the Authenticity of Local and Imported timber Species in Sri Lanka, Proceeding of the International Forestry and Environment symposium, USJP. p.95.

- Siriwardena, V.R. A. and Muthumala, C. K., 2019. Evaluation the Authenticity of wood species in Sri Lankan timber market, International Forestry & Environmental Symposium-USJP. p.86
- Siriwardana, V. R. A. and Muthumala, C. K. 2020. Market survey for Wooden furniture Industry in Sri Lanka, Proceedings of the 25th International Forestry and Environment Symposium 2020, USJP, Sri Lanka. p.73
- Wiedenhoeft, A. C. et al, 2019. Fraud and misrepresentation in retail forest products exceeds U.S. forensic wood science capacity, PLOS ONE | https://doi.org/10.1371/journal.pone.0219917
- Youngs, R. L. 1989. History of timber use, in Concise Encyclopedia of Wood and Wood Based Materials (Pergamon Press, 1989), pp.138–143.



Environmental Related Act, Regulations Policies

Act and Regulations

- Coast Conservation Act No. 57 of 1981
- Coast Conservation (Amendment) Act, No. 49 of 2011
- Fauna and Flora Protection (Amendment) Act, No. 22 of 2009
- Forest (Amendment) Act, No. 65 of 2009
- Forest Ordinance
- Marine Pollution Prevention Act, No. 35 of 2008
- National Environmental (Amendment) Act, No. 53 of 2000
- National Environmental (Amendment) Act, No. 56 of 1988
- Central Environmental Authority Act, No. 47 of 1980

Related Link: env.gov.lk/web/index.php/en/downloads/acts

- Act-No-29-of-1964
- Act-No-42-of-1999
- Water-Resources-Board-Special-Gazzert-Notification-No-2010-23
- 01-2024 Circular

Related Link: wrb.lk/wrb-acts-gazettes

Policies

- National Policy on Green Procurement
- National Policy on Climate Change 2023
- National Policy on Management of Chemicals
- Nationally Determined Contributions Implementation Plan
- National Environment Policy
- National Framework on Eco Labeling in Sri Lanka
- National Policy on Environmentally Sensitive Areas in Sri Lanka
- The National Policy on Invasive Alien Species (IAS) in Sri Lanka, Strategies and Action plan
- National Environment Action Plan 2022-2030
- National Policy on Access to Biological Material and Fair and Equitable Benefit Sharing
- National Policy and Strategies on Traditional Knowledge and Practices related to Biodiversity
- National Action plan on Plastic Waste management 2021-2030
- National Policy on Waste Management
- Updated Nationally Determined Contributions Under the Paris Agreement on

Climate Change Sri Lanka 2021

- National Policy on Conservation and Sustainable Utilization of Mangrove Ecosystems in Sri Lanka
- National Policy and Strategy on Cleaner Production for Health Sector
- The National Climate Change Policy of Sri Lanka
- National Environmental Policy and Strategies 2023
- National forestry Policy Executive Summary
- National land use policy of Sri Lanka
- National Policy and Strategy on Cleaner Production for Fisheries Sector
- National Policy and Strategy on Cleaner Production for Tourism Sector
- National Policy and Strategy on Cleaner Production for Agriculture Sector
- National Policy on Protection and Conservation of Water Sources, their Catchments and Reservations in Sri Lanka
- National Policy on Sand as a Resource for the Construction Industry
- Policy on Siting of High Polluting Industries
- National Wetland Policy and Strategy
- National Watershed Management Policy 2004
- National Wildlife Policy
- National Policy on Sustainable Consumption & Production for Sri Lanka

Related Link: env.gov.lk/web/index.php/en/downloads/policies



පරිසර අමාත්‍යාංශය

සොබාදම් පියස, අංක. 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.

දුරකථන : 011 203 41 75 විද්‍යුත් තැපෑල : pedudivision@gmail.com

www.env.gov.lk